පිටසක්වළ බෞද්ධයන්ගේ විශ්මිත තොරතුරු
ඇතුළත් වඩාත් ආන්දෝලනාත්මක බෞද්ධ කෘතිය.



# බුදුවරු සහ බෝසත්වරු

kumudu

නීතිඥ නිලන්ත හෙට්ටිගේ

පිටසක්වළ බෞද්ධයන්ගේ විස්මිත තොරතුරු ඇතුළත්
වඩාත්ම ආන්දෝලනාත්මක බෞද්ධ කෘතිය

# බුදුවරු
# සහ
# බෝසත්වරු

## කර්තෘගේ වෙනත් කෘතීන්

### බෞද්ධ ග්‍රන්ථ

01. භාවනාව සහ ආධ්‍යාත්මික දියුණුවේ රහස්
02. උසස් භාවනාව සහ අධිමානසික බලය
03. සමාධිය සහ ප්‍රඥාව වඩන ආනාපාන සති භාවනාව
04. භාවනාව මිනිස් සිත සහ නිවන
05. භාවනාව කුණ්ඩලිනී බලය සහ අධිමානසික විද්‍යාවේ රහස්
06. භාවනා රහස්
07. ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ භාවනාව
08. භාවනා උපදෙස් සහ සත්‍යාවබෝධයට නොවරදින මග
09. භාවනාව සහ චිත්ත ශක්තිය
10. භාවනාව යෝග සහ චිත්ත ශක්තිය
11. සතිපට්ඨාන භාවනාව සහ නිවන් මග
12. භාවනා උපදේශ සංග්‍රහය
13. භාවනා අභ්‍යාස සහ සත්‍යාවබෝධය
14. අධිමානසික විද්‍යාවේ හාස්කම්
15. බෞද්ධ භාවනා සහ මාර්ගඵල
16. විදර්ශනා භාවනාව සහ ධර්මාවබෝධය
17. අභිධර්ම ප්‍රවේශය
18. සදහම් සයුර
19. විදර්ශනා මාර්ගය
20. සෝවාන් මාර්ගය සහ සෝවාන් ඵලය
21. නුවණ වඩන බණකතා
22. භාවනාවේ හාස්කම්
23. ජීවිතය මරණය සහ පුනරුත්පත්තිය
24. භාවනා පුහුණුව
25. භාවනාව ධ්‍යාන සහ මාර්ගඵල විනිශ්චය
26. භාවනාවේ ආශ්චර්යය
27. සතරමග සතරපල
28. ප්‍රායෝගික විදර්ශනා භාවනාව
29. භාවනා මාර්ගය
30. භාවනාවේ විස්මිත රහස්
31. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සහ අක්ෂෝභ්‍ය තන්ත්‍රය
32. භාවනාවේ දිව්‍යමය රහස්
33. ධර්ම විනිශ්චය
34. කසිණ භාවනා රහස්
35. භාවනාවේ අනුහස්
36. සදහම් කැටපත
37. භාවනා අත්පොත
38. විපස්සනා භාවනාව
39. සදහම් සරණ
40. යෝග විද්‍යාවේ රහස්
41. බුද්ධානුස්සති භාවනාව
42. වජ්‍රසත්ව සූත්‍ර නිර්දේශය
43. භාවනාවේ ස්වර්ණමය රහස්
44. සසර ගමන සහ සෝවාන්ඵලය
45. බෞද්ධයාගේ භාවනා අත්පොත
46. භාවනාව සහ කුණ්ඩලිනී බලය
47. භාවනාව සහ අධිමානසික හැකියාව
48. සතිපට්ඨාන භාවනාව
49. යෝග විද්‍යා අත්පොත
50. මරණින් මතු ජීවිතය
51. භාවනාවේ ප්‍රවීණයකු වන මග
52. විමුක්ති මාර්ගය
53. විසුද්ධි මාර්ගය
54. සම්මා විමුක්ති
55. අසිරිමත් ටිබෙට් බුදුදහම
56. මහායෝගීන්ගේ භාවනා රහස්
57. මහා යෝගී පද්මසම්භව
58. සුවය සහ බලය ගෙනදෙන යෝග හා භාවනා ක්‍රම
59. ආනාපානසති භාවනාව
60. කසිණ භාවනා අත්පොත
61. ටිබෙට් භාවනා අත්පොත
62. භාවනාව සහ සුව කිරීමේ බලය
63. භාවනාවේ විස්මිත රහස්
64. භාවනාව සහ විස්මිත සුවකිරීම්
65. භාවනාව මුල සිට සරලව

### මනෝවිද්‍යාව සහ දාර්ශනික මතවාද

66. ජීවිතයේ දියුණුවට දාර්ශනික රහස්
67. දියුණුව සහ ජයග්‍රහණය ගෙන දෙන ස්වර්ණමය රහස්
68. ධනය බලය සහ දියුණුව පිළිබඳ මනෝවිද්‍යාත්මක රහස්
69. සුපිරි මනස සහ සුපිරි බලය
70. එදිනෙදා ජීවිතයට අධිමානසික විද්‍යාව
71. ජීවිතයේ සාර්ථකත්වය සඳහා විස්මිත රහස්
72. ධනවත් වීමේ රහස්

### භාෂා අධ්‍යයනය

73. ඉංග්‍රීසියෙන් ලිපි ලේඛන සැකසීම
74. ප්‍රායෝගික ඉංග්‍රීසි කථනය
75. ඉංග්‍රීසි යෙදුම් අත්පොත

76. ඉංග්‍රීසි ව්‍යාකරණ අත්පොත
77. ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණයකු වන මග

## නීතිය

75. අපරාධ නීතිය
79. පොදුජන නීති අත්පොත
80. ඉඩම් නීතිය
81. විවාහය සහ නීතිය
82. ජීවිතය සහ නීතිය
83. ඔබට බලපාන නීතිය
84. නීතිය යුක්තිය සහ අධිකරණය
85. නීතිය සහ නීතියේ ක්‍රියාකාරිත්වය
86. ශ්‍රී ලංකාවේ නීතිය සහ අධිකරණ ක්‍රමය
87. සාක්ෂි නීතිය සහ නඩු ඇසීමේ ක්‍රියාවලිය
88. එදිනෙදා ජීවිතයේ නීති ගැටලු
89. සිවිල් නීතිය සහ නඩු කාර්ය පටිපාටිය
90. සාක්ෂි නීතිය
91. කම්කරු නීතිය
92. අපරාධ නීතියේ මූලධර්ම
93. අපරාධ නඩු විධාන නීතිය
94. අපරාධ නීතිය සහ සාපරාධී වගකීම
95. පොදු ජන නීති අත්පොත නව සංස්කරණය
96. අපරාධ නීතිය සහ දණ්ඩ නීති සංග්‍රහය
97. පරිපාලන නීතිය සහ සේවක අයිතිවාසිකම්
98. ප්‍රායෝගික ඉඩම් නීතිය
99. ඉඩම් නීතියේ සංකල්ප සහ භාවිතය
100. නීති ප්‍රවේශය
101. මෝටර් රථ ප්‍රවාහන නීතිය
102. ශ්‍රී ලංකාවේ නීති ක්‍රමය
103. පොදු ජනතාවගේ තොරතුරු අත්පොත
104. ඉඩම් ආරවුල් සහ හැටහය වන වගන්තියේ නඩු
105. ශ්‍රී ලංකාවේ ඉඩම් නීතිය
106. රිය පැදවීමේ නීති අත්පොත
107. පොදු ජනතා පොදු ගැටලුවලට නීති විසඳුම්
108. බෙදුම් නඩු නීතිය
109. ශ්‍රී ලංකාවේ කම්කරු නීතිය
110. අධිකරණ ක්‍රමය සහ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය
111. විවාහ නීති අත්පොත
112. අපරාධ නීති අත්පොත
113. සිවිල් නඩු විධාන නීතිය
114. ඔප්පු ලිවීමේ නීතිය
115. ඉඩම් නීති අත්පොත
116. එදිනෙදා ජීවිතයට නීති උපදෙස්
117. නීතිය සැමට
118. අභියාචනා නීතිය
119. ජන දිවියට නීතිය
120. තහනම් නියෝග පිළිබඳ නීතිය
121. මූලික අයිතිවාසිකම් පිළිබඳ නීතිය
122. කම්කරු නීතිය සහ කම්කරු උසාවිය
123. ඉඩම් නීතිය මුල සිට සරලව
124. අපරාධ නීතියේ මූලිකාංග
125. විවාහය දික්කසාදය සහ නඩත්තු පිළිබඳ නීති
126. නීතිය සහ උසාවි ක්‍රමය
127. මාර්ග නීති අත්පොත
128. නඩු කටයුතු පිළිබඳ අත්පොත
129. නීතිය සහ අධිකරණ බලය
130. පොලීසිය සහ නීතිය
131. මානව හිමිකම් පිළිබඳ නීතිය
132. වංචා වැළැක්වීමේ නීතිය
133. බෙදුම් නඩු කාර්ය පටිපාටිය
134. අභියාචනය සහ ප්‍රතිශෝධනය

## වෙනත් කෘතීන්

135. සටන් කලාව
136. ගුප්ත විද්‍යාව සහ අමනුස්ස ලෝකය
137. ජීවිතය සහ මරණය පිළිබඳ විස්මිත රහස්
138. අන්තරාභවය සහ මළවුන්ගේ ලෝකය
139. මළවුන්ගේ ලෝකයේ අභිරහස්
140. විශ්ව ශක්තිය සහ සුවකිරීමේ බලය
141. විශ්වයේ විස්මිත අභිරහස්
142. ගුප්ත විද්‍යාව සහ අධිමානසික හැකියාව
143. ගුප්ත විද්‍යාවේ රහස්
144. ඩිජිටල් ඡායාරූපකරණය
145. පිටසක්වළ ජීවීන්ගේ විස්මිත රහස්
146. අමනුස්ස ලෝකයේ අභිරහස්
147. නවීන විද්‍යාවේ හාස්කම්
148. ලොව හෙල්ලූ විස්මිත අභිරහස්
149. නවීන විද්‍යාවේ හාස්කම්
150. සටන් කලා අත්පොත
151. මළවුන්ගේ ලෝකයේ විස්මිත රහස්
152. ලොව හෙල්ලූ විස්මිත අනාවැකි
153. සිව් හෙළයට අධිපති රාවණා
154. මහා යෝගියෙකු සමඟ දොළොස් වසරක්
155. පොදු ජනතාවගේ තොරතුරු අත්පොත

පිටසක්වළ බෞද්ධයන්ගේ විස්මිත තොරතුරු ඇතුළත්
වඩාත්ම ආන්දෝලනාත්මක බෞද්ධ කෘතිය

# බුදුවරු
# සහ
# බෝසත්වරු

**නීතිඥ නිලන්ත හෙට්ටිගේ**

සුසර ප්‍රකාශකයෝ
නො. 180/43, පීපල්ස් පාර්ක්, කොළඹ 11.
දු.ක. - 0112 430721 ෆැක්ස් - 0112 334597

**බුදුවරු සහ බෝසත්වරු**
© නීතිඥ - නිලන්ත හෙට්ටිගේ

ප්‍රථම මුද්‍රණය - 2017

**ISBN 978-955-33-0592-3**

Agreement No: 1707

පරිගණක පිටු සැලසුම
ඩිලන්ත මුතුගල

මුද්‍රණය
සුසර මුද්‍රණාලය
නො: 338/*A*, ගෝනහේන, කඩවත.

ප්‍රකාශනය හා බෙදාහැරීම
සුසර ප්‍රකාශකයෝ
නො. 180/43, පීපල්ස් පාර්ක්, කොළඹ 11.
දු.ක. - 0112 430721 ෆැක්ස් - 0112 334597
*E-mail: susarapub@gmail.com*
*Web: www.susarapublication.lk*
*Facebook: www.facebook.com/susarapublications*

# පෙරවදන

මෙම පොත 'දිවයින ඉරිදා සංග්‍රහයේ' පළවූ ලිපි කිහිපයක් ඇසුරෙන් සකස් කළ එකකි. පිටසක්වළ බුදුවරුන් ගැන හා බණ කියන බෝසත්වරුන් ගැන මා හෙළිකළ විවාදාත්මක කරුණු රැසක් මේ කෘතියෙහි ඇතුළත්ය.

මා පිටසක්වළ බෞද්ධයන් ගැන ලිවීම අරඹා තවම ගතවී ඇත්තේ වසර පහක් පමණි. එවන් සුළු කාලයක් තුළ මේ අපූරු මාතෘකාව රට පුරා ඉමහත් ආන්දෝලනයකට ලක්වීම එක් අතකට පුදුම සහගතය. අද පිටසක්වළ ඇත්තන් පිළිබඳ කතාබහ දේශපාලන විවාදයන් තරමට ජනප්‍රිය වෙමින් පවතී යයි කීවොත් නිවැරදිය.

මෙම කෘතියේ එන පිටසක්වළ ජීවීන්ගේ කතාබහ අතරින් පෙරී එන බුදුදහමේ සාරය හඳුනා ගැනීමට පාඨකයන් උත්සාහ කළ යුතුය. බුදුදහම මුළු විශ්වයේම පවතින එකම සදාතනික සත්‍යයයි. අනිත්‍ය දුක්ඛ අනාත්ම යන ත්‍රිලක්ෂණය මුළුමහත් විශ්වයටම පොදුය යන පණිවුඩය මෙම කෘතියෙහි තැනින් තැන සන්නිවේදනය කෙරෙයි.

බුදුදහමේ හීනයාන මහායාන හා වජ්‍රයාන ශාඛාවන් තුන පිළිබඳ මූලික අධ්‍යයනයක් කරන කෙනෙකුට මේ කෘතියෙහි එන විස්තර අතිශය වැදගත් වනු ඇත.

තවද මෙය බෞද්ධ දේශපාලන දර්ශනය පිළිබඳ ලියැවෙන අතිශය තීරණාත්මක කෘතියක් බව පෙන්වා දිය යුතුය. ආගම නීතිය සංස්කෘතිය හා දේශපාලනය එකිනෙකින් වෙන්වූ අංග සතරක් ලෙස මෙතෙක් පැවතුණි. ඒ හතර වෙන්ව තිබෙන තාක්කල් ආගමික මතවාදයන්ට ස්ථිර පැවැත්මක් නැත. ආගම, නීතිය හා දේශපාලනය එක්වූ දින ආගමට ස්ථාවරත්වයක් ලැබෙනු ඇත.

සංස්කෘතියට එහි සැබෑ වටිනාකම ලැබෙනු ඇත. මෙය බුදුවරු සහ බෝසත්වරු යන කෘතිය පුරාම දිවෙන පණිවුඩයකි.

බෞද්ධයන් වෙන්ව සිටිනතාක් කල් බුදුදහම පිරිහී යනු ඇති බවත් බෞද්ධයන් තනි බලවේගයක් ලෙස එකමුතු වූ දිනට බුදුදහම යළි බැබළෙන්නට පටන් ගන්නා බවත් මේ කෘතියෙන් පළ කරන ප්‍රධානතම පණිවුඩයයි.

මෙම කෘතිය ප්‍රබන්ධයක් නොවේ. මා විසින් ඉතා දුෂ්කර මාර්ග ඔස්සේ සපයා ගත් දැනුම මත මේ කෘතිය පදනම්ව ඇත.

නීතිඥ
නිලන්ත හෙට්ටිගේ

# 01

# පිටසක්වළ බුදුවරු සහ බණ කියන බෝසත්වරු

ඔබ වඩාත්ම රුචිකත්වය දක්වන විෂය කුමක්ද? යමකු ඒ ප්‍රශ්නය මගෙන් ඇසුවොත් ඊට නොවැරදීම ලැබෙන පිළිතුරක් ඇත. ටිබෙට් බුදු දහම ලොව වඩාත්ම සිත්ගන්නා විෂය බව මම දෙවරක් නොසිතාම කියමි. ටිබෙට් බෞද්ධ ඉගැන්වීම් ඒ තරමට රසවත්ය. හරවත්ය.

ටිබෙට් බුදුදහම වජ්‍රයාන මහායාන හා ථෙරවාද යන ගුරුකුලයන් තුනෙහිම ඉගැන්වීම්වල අපූරු සංකලනයකි. ටිබෙට් බුදුදහමත් වජ්‍රයානයත් එකක් නොව දෙකකි. එනමුත් ඒ දෙකෙහි සැහෙන පරතරයක්ද නැත්තේය.

පිටසක්වළ වැඩ වෙසෙන ජීවමාන බුදුවරුන්ට, බෝසත්වරුන්ට හා ඍද්ධිමතුන්ට හරසර දැක්වීම ටිබෙට් බෞද්ධයන්ගේ වත් පිළිවෙත් අතර වෙසෙසින්ම කැපී පෙනෙයි. පිටසක්වළ බුදුවරුන් ඇදහීම මහායාන සංකල්පයක් බව පොදුවේ පිළිගැනුනත් පිටසක්වළ ඇත්තන් සමඟ ගනුදෙනු කිරීම මුල් බුදුසමය දක්වා දිවයන මාතෘකාවකි. පිටසක්වළ බෞද්ධයන් ගැන

විස්තර ස්වල්ප ප්‍රමාණයක් සූත්‍ර පිටකයේ තැනින් තැන දැකගත හැකිය. මූලික සූත්‍ර අනුව විශ්වයෙහි ඇති ජීවය සහිත ලෝක සංඛ්‍යාව ගණනින් කීමට නොහැකි තරම් විශාලය. මිනිසුන් හා සම කළ හැකි ජීවීන් වෙසෙන ලෝකයක් සක්වළක් නම් වෙයි.

මූලික සූත්‍ර අනුව හිරු හා සඳු ආලෝකය දෙමින් වසාලන ඉඩ ප්‍රමාණය සක්වළක් නම් වෙයි. එක් සක්වළක මිනිස් ලොවක්ද සදෙව් ලෝකද සතර අපායද බ්‍රහ්ම ලෝකද වෙයි. එබඳු සක්වළ බොහෝ ගණනාවක් එක්ව චූලනිකා ලෝක ධාතුවක් සෑදෙයි. චූලනිකා ලෝකධාතු බොහෝ ගණනක් එක්ව මජ්ධිමනිකා ලෝක ධාතුවක් සෑදෙයි. මජ්ධිමනිකා ලෝකධාතු බොහෝ ගණනක් එක්ව සහස්සිකා ලෝකධාතු සෑදෙයි. සහස්සිකා ලෝකධාතු එක්වීමෙන් ද්විසහස්සිකා ලෝකධාතු ආදී වඩා සංකීර්ණ පොකුරු ආකාර වාසභූමි තැනෙයි. බුදුන්වහන්සේගේ ආඥා ක්ෂේත්‍රය එබඳු සක්වළ දසදහසකි. දසදහසක් සක්වළ ඇත්තන්ට ඇසෙන්නට බණ කීමට හැකි අභිභූ නම් ඍද්ධිමත් භික්ෂුවක් ගැන සූත්‍ර පිටකයෙන් හෙළි වෙයි.

වඩාත්ම වැදගත් කරුණ වන්නේ අප මහා බෝසතාණන්වහන්සේ බුදුවීමට ආත්මභාවයන් ගණනාවකට පෙර පවා පිටසක්වළ ජීවය ගැන දැන සිටීමයි. බෝසත්හු බුදුබව ලබන අවසන් ආත්මභාවයට බොහෝ ඈත කාලයක විජය නම් වූ සක්විති රජෙකුව වැඩ විසූහ. විජය සක්විති රජු බුද්ධත්වය කෙරෙහිම සිත මෙහෙයවමින් එතැනට පත්වනු පිණිස පාරමී දම් පිරූහ. දිනක් විජය සක්විති රජුට මෙවැනි අදහසක් පහළ විය. අනන්ත අවකාශය තුළ සදිසාවටම ලෝකධාතුන්ගේ

කෙළවරක් නැත. කොයි දිසාවට ගණන් කළත් මනුෂ්‍ය ලෝක සංඛ්‍යාව අප්‍රමාණය. ඒ මනුෂ්‍ය ලෝක සමහරක බුදුවරු වැඩ වෙසෙති. ඒ බුදුවරුන්වහන්සේලා ගණනින් අපමණය.

අනන්ත සක්වළ වැඩ වෙසෙන ගණන් කළ නොහැකි තරම් වූ බුද්ධ ක්ෂේත්‍රයන්හි වෙසෙන සියලු බුදුවරුන්වහන්සේලා වෙනුවෙන් මනෝමය වූ දානයක් දීමට විජය සක්විති රජු තීරණය කළේය. හේ මනෝමය මන්දිරයක් මවා ඒ තුළ දැසි දස්සන්ද පූජා භාණ්ඩ ආදිය නොයෙකුත් රසමුසු කෑම බීමද මනසින් නිර්මාණය කළේය. ඉන්පසු විජය සක්විති රජතෙම අනන්ත සක්වළ බුදුවරුන්ට සිතෙන්ම දනට ආරාධනා කළේය. අනන්ත සක්වළ වැඩ වෙසෙන බුදුවරුන් දාන ශාලාවට පිරිස් සමඟ වඩින ආකාරයත් දානය පිළිගන්නා ආකාරයත් අනුමෝදනා බණ දෙසන ආකාරයත් හේ සිතින්ම නිර්මාණය කළේය. බුදුවරු දානමානාදියෙන් පසුව වෙනත් බුදුවරුන්වහන්සේලාගෙන් ප්‍රශ්න විචාරමින් ව්‍යක්ත ලෙස ඊට පිළිතුරු දුන්හ.

මේ අපූරු චින්තාමය පුණ්‍යකර්මයෙන් පසු විජය සක්විති රජු අපාය වියළවීය. හේ මනෝමය දාන පුණ්‍යකර්මයේ බල මහිමයෙන් එතැන් සිට නිවන් දක්නා ජාති දක්වා සතර අපායෙහි නූපන්නේය. බුද්ධ වන්දනාව ඒ තරමට මහත්ඵලය. මහානිසංසදායකය.

ඒ අපූරු විස්තරය සඳහන් වනුයේ අපදාන පාලියෙහි බුද්ධාපදාන වර්ගයට අයත් ගෞතම බුද්ධාපදානයෙහිය. පිටසක්වළ බුද්ධ ක්ෂේත්‍රයන්ගේ පැවැත්ම මුල් බුදුසමය තුළ පිළිගැනෙන බව ඔප්පු කිරීමට තවත් හෝඩුවාවන් කිහිපයක්ම සූත්‍ර පිටකයෙන් උපුටා පෙන්විය හැකිය.

පිටසක්වළ බෞද්ධයන් ගැන වඩා විස්තරාත්මක කරුණු මහායාන සූත්‍රයන්හිද වජ්‍රයාන තන්ත්‍රයන්හිද දැකගත හැකිය. නාගර්ජුන විසින් මුල්වරට ඉදිරිපත් කළ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයෙහි මහාමතී නම් වූ බෝසත්වරයකු ගැන විස්තර දක්වා ඇත. අමිතාභය බුදුන්වහන්සේ ගැන මුල්ම විස්තර හමුවන්නේද එතුළිනි. ඉපැරණි ටිබෙට් බෞද්ධ පොත්පත්වල බෝසත්වරුන් හා බුදුවරුන් ගණනාවක් ගැන දීර්ඝ විස්තර ඉදිරිපත් කර ඇත.

දිව පටලවන නමක් ඇති අක්‍ෂෝභ්‍ය නමැත්තා ටිබෙට් බුදු දහමෙහි සුවිශේෂී චරිතයකි. කෙසේ නමුත් අක්‍ෂෝභ්‍ය බෝසතුන් ගැන පැරණිම විස්තර හමුවනුයේ ක්‍රිස්තු වර්ෂ දෙවැනි සියවසට අයත් චීන බෞද්ධ ලේඛනයක් තුළිනි. අක්‍ෂෝභ්‍යගේ කථා ප්‍රවෘත්තිය පිටසක්වළ බෝසත්වරුන්ගේ ජීවිත කථා අතර වඩාත්ම සිත්ගන්නාසුලු එකයි.

අපගේ සූර්යග්‍රහ මණ්ඩලයට බොහෝ ඈතින් දුර්වල ආලෝකයක් සහිතව පෘථිවියට දිස්වන එක්තරා ද්විත්ව තාරකාවක් වෙයි. එය ද්විත්ව තාරකාවක් යයි කියනුයේ තාරකා දෙකක් එකක් අනෙක යන අපූරු ගමනක් එහි ඇති බැවිනි. ද්විත්ව තාරකා යුගලයෙන් කුඩා එක විශාල එකෙන් දහසයෙන් පංගුවක් පමණ වෙයි. කුඩා තාරකාව විශාල තාරකාව වටා යන්නේ හරියටම බුධ ග්‍රහයා හිරු වටා ළඟින් ගමන් කරන්නාක් මෙනි. ඒ ද්විත්ව තාරකාව වටා පරිභ්‍රමණය වන එක් ග්‍රහලොවක ද්‍රව තත්ත්වයේ ඇති ජලය පවතියි. ද්‍රව ජලය ඇත්තේ යම් තැනකද එතැන ජීවයට සුදුසු තැනක් බවට පත්වෙයි.

මේ කියන අපූරු ලෝකය ටිබෙට් පතපොතෙහි හැඳින්වෙනුයේ අභිරති යනුවෙනි. පෙළක් තැනක පෙරදිග ශුද්ධ භූමිය යන නමද ඊට යොදා ඇති අයුරු දක්නට හැකිය. අභිරති ලෝකධාතුව මෑතකදී මවිසින් ලියන ලද පොතපතෙහි සාග ලෝකය යන නමින් හඳුන්වා දී ඇත. ඉරවල් දෙකක් පායන සාග ලෝකයෙහි ඇත්තේ පෘථිවියට වඩා සෞම්‍ය කාලගුණයකි. ඊට හේතුව ඒ ඉරවල් දෙකේ රශ්මිය සාග ලොව මත කරන බලපෑම තරමක් අඩු බැවිනි. තඹ ලෝහය බහුල සාග ලෝකයෙහි ගස්වැල් පවා තඹ පැහැතිය. එහි වෙසෙන සත්වයන්ගේ ලේ ධාතුව අපගේ මෙන් නොව, හකරැල්ලන්ගේ ලේ මෙන් නිල් පැහැතිය. මුළු සාග ලෝකයටම ඇත්තේ එකම එක සුවිසල් විලකි. එහි සමුද්‍රයක් නොපිහිටියේය. සම්පා නම් වූ ඒ විල සාග ලෝකයට කඩා වැදුණු උල්කාපාතයක් නිසා සෑදුණු එකකි. මනරම් කඳු වළල්ලකින් වටවූ සම්පා විල සාග ලෝකවැසියන්ගේ උතුම් සම්පතයි. ඒ විලේ ජලයෙන් සාග ලෝකයට අවශ්‍ය වර්ෂාව ඉපිදවීය. එනමුත් ඒ විල කිසි දිනෙක නෞකාවක නැඟී තරණය කළ නොහැක්කකි. එහි ගැඹුර නිසාම නෞකාවෝ ගිලී පතුලටම යති.

සාග ලෝකය දැනට බොහෝ කලෙකට පෙර සිටම අළු පැහැති පිටසක්වළ ජීවීන් විශේෂයකගේ වාසභූමියක්ව තිබුණි. දුෂ්ඨ අළු පැහැති ජීවීහු අද කාලයේ වෙසෙන සිංහලයන් මෙන්ම එකිනෙකාට දෝෂාරෝපණය කරමින් පිල්වලට බෙදී කා කොටා ගැනීමට පුරුදුව සිටියහ. මේ අතර එක්තරා තීරණාත්මක දිනක වඩා බලසම්පන්න පිටසක්වළ ජීවී පිරිසක් වාසයට සුදුසු අලුත් ලෝකධාතු සොයමින් දියුණු යානයක නැඟී සක්වළ තරණයෙහි යෙදෙමින් උන්හ.

"අර බලනු ඈත පේන මනරම් ලෝකය දෙස. එය අපටම සුදුසු අනාගත නවාතැනක් වනු ඇත." සාග ලෝකය මුලින්ම නෙත ගැටුණු බලසම්පන්න පිටසක්වළ ජීවීහු ප්‍රීතියෙන් පිනාගොස් ඒ දෙසට සිය යානාව මෙහෙයවූහ. එක් භෞතික සම්පතකට දෙපිරිසක් ඇලුම් කරන කල්හි ගැටුමකට මුල පිරෙයි. එය මුළු විශ්වයටම පොදු රීතියකි. බලසම්පන්න පිටසක්වළ ජීවීහු කෙටි කලෙකින්ම සාග ලෝකය නතු කර ගැනීමට යුද්ධයක් ආරම්භ කළහ. මුලදී පිරිවර බලයෙන් වැඩි සාග ලෝකවාසීහු ජයග්‍රහණයට ළංවූහ. බුද්ධි මහිමයෙන්ද රූප ශෝභාවෙන්ද විද්‍යාත්මක දැනුමෙන්ද එකමුතුකමෙන්ද ඉදිරියෙන් සිටි බලසම්පන්න ජීවීහු නොබෝ කලකින්ම සාග ලෝ වැස්සන් පරදවා එලොව ඔවුන්ගේ තනි පාලනයට නතු කර ගත්හ. දූෂ්‍ය අළු පැහැ ජීවීන් නිල් පැහැ සිරුරු ඇති බලසම්පන්න ජීවීන්ගේ මෙහෙකරුවන් හා වහලුන් බවට පත්වූහ.

අභිරති ලෝකයෙහි වෙසෙන ප්‍රබල ජීවීන්ගේ සිතුවම් තිබ්බතීය විහාර චිත්‍ර අතර බහුලව දක්නට ඇත. අක්ෂෝභ්‍ය ඒ ජීවීන් අතර වඩාත්ම ප්‍රසිද්ධ තැනැත්තා වෙයි. අභිරති ලෝකයේ අගරජු කත්‍රික නම් වෙයි. ඔහු එසේ මෙසේ පාලකයකු නොව සක්විති රජෙකි. කත්‍රික රජුගේ වැඩි විස්තර සොයා ගැනීමට නැත. එනමුත් කත්‍රියන්ගේ සුරූපී අග බිසව වන වජ්‍ර යෝගිනිය අක්ෂෝභ්‍ය තරම්ම ප්‍රසිද්ධ තැනැත්තියකි.

# 02

## සෙලවිය නොහැකි නායකයෙක්

මාසාග නම් පිටසක්වළ ලෝකය ගැන විස්තර මුල්වරට ලියා පළ කළේ 2011 වර්ෂයේදීය. විශාල සූර්යයකු වටා යන කුඩා සූර්යයකුට එපිටින් පරිභ්‍රමණය වන සාග ලෝකය පෘථිවියේ සිට ආලෝක වර්ෂ ගණනාවක් ඈතින් පිහිටියකි. සාග ලෝකයේ දිවා රෑ වෙනසක් නැත. එහි එක් පැත්තක් සෑම විටකම ප්‍රධාන සූර්යයාට මුහුණ ලා පවතියි. ජීවීන් බහුල මනරම් සාග ලෝකයට අයත් ප්‍රධාන සූර්යයා පෘථිවියේ සිට ඉතා කුඩාවට දැකගත හැකිය. ඒ සූර්යයාගේ අතවැසි සාග ලෝකය දුරේක්ෂවලින් පවා දැකගැනීමට අපහසුය. එනමුත් නිවැරදි සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කර නොබෝ කලෙකින් සාග ලෝකය විද්‍යාඥයන්ගේ උපකරණවලට හසුවන බව 2011 වර්ෂයේදී ලියා තැබීමි. 2017 වර්ෂයේදී එවැනි ජීවයට සුදුසු ග්‍රහවස්තූන් 6ක්ම සොයාගනු ලැබීය. පුදුමයකට මෙන් ඒවාද සාග ලෝකය මෙන් එක් පැත්තක් මවු තාරකාවට මුහුණ ලා කක්ෂගත වී ඇත.

සාග ලෝකයෙහි දැනට වසර දහස් ගණනකට පෙර ඇතිවූ දීර්ඝ යුද සටනකින් පසු නිල් පැහැ රුධිරය

ඇති කළුවන් මිනිස්සු අළුවන් මිනිසුන් පරදා ජය තහවුරු කළහ. එකිනෙකා බෙදී කුළල් කාගත් අළු මිනිස්සු සදාකාලික වහලුන් බවට පත්වූහ. මේ යන විදියට සිංහල අපටද අළු මිනිසුන් මුහුණ පෑ ඛේදවාචකයට නොබෝ කලෙකින්ම මුහුණ දීමට සිදුවනු ඇත.

කුමන ලෝකධාතුවක වෙසෙන කෙනෙකු වුවද සත්‍යාවබෝධය කරන ලද්දේ නම් ඒ උත්තම පුරුෂයා බුදුවරයකු බව කියනු ලැබේ. සාග ලෝකයෙහි සාගිත නම් භාෂාව ජනප්‍රියව පැවැතියද සෑම බුදුවරයකුම බණ කියන්නේ විශ්වීය මවු භාෂාව වන පාලි බසිනි. සාගිත භාෂාව සංස්කෘත භාෂාවට හැඩහුරුකම් දක්වන බව යෝගියකු කී බව මට මතකය. පෙර කල නිල් මිනිසුන් අතර ඉපැදුණු මිනිසෙක් දස පාරමී දම් සපුරා දුෂ්කර ක්‍රියා කර බුදු බවට පත්විය. ඒ බුදුවරයා මේසිය නම් විය.

සාග ලෝකවාසී තරුණයෙක් නිල් පැහැති මේසිය බුදුන්ගෙන් බණ අසා පැහැදී මහණදම් පිරීමට අවසර පැතීය. බුදුවරු හේතු සම්පත් ඇති අයට මහණදම් පිරීමට අවසර දෙති. මේසිය බුදුන් වෙත පැමිණ ධර්මාකර නමින් මහණ වූ තරුණයා මෙත්තා චේතොවිමුක්තිය පිණිස භාවනා ආරම්භ කළේය. මෙතැන් පටන් මා සම්බෝධියට පත්වන තුරු කුරු කුහුඹු ආදී හෝ ප්‍රාණියකුගේ දිවි තොර නොකරන්නේමැයි ධර්මාකර භික්ෂූන්වහන්සේ ධූතාංගයක් සමාදන් වූයේය.

ඒ ධූතාංගධාරී භික්ෂුව තම දෙපයට පෑගී කුරා කුහුඹු ආදී සතුන් මිය යතැයි යන බියෙන් මුළු දවසම කුටියට වී වාසය කළේය. මුළු දවසම මෛත්තා චේතො විමුක්තියෙන් කල් ගත කළේය. උන්වහන්සේ ආයුෂ අවසානයේ මිය පරලොව ගොස් සාග ලෝකයට අධිපති

කත්‍රිත නම් සක්විත්තාගේ අගමෙහෙසියගේ කුසයෙහි පිළිසිඳ ගත්තේය.

කත්‍රික රජු ඇතුළු සාග ලොව නිල් පැහැ රජ පරපුර බොහෝ ආයුෂ ඇති අය වෙති. කත්‍රිකයන්ගේ අගමෙහෙසිය වන වජ්‍රයෝගිනිය දසදහස් වියැතිය. එනමුත් එලොව කාල ගණනය කිරීමේ ක්‍රම අනුව ඇය යන්තම් හිරිමල් තරුණ විය පසු කළ තැන්තියකි. මහා පින් ඇති වජ්‍රයෝගිනියගේ රුව ටිබෙට් රටේ තාන්ත්‍රික පොතපතෙහිද විහාර චිත්‍රයන්හිද ඉතා මැනවින් චිත්‍රණය කර ඇත. දහසය වියැති සුකොමළ තරුණියක් වන් වජ්‍රයෝගිනිය සාග ලෝ වැසි සාමාන්‍ය ජනතාව මෙන් නිල් හෝ අළු පැහැය නොගත්තීය. ඇගේ සම රතුවන් පැහැතිය. ඇගේ අක්බමරුවන් දිගු කෙස්කලඹ හිස සිට පාදාන්තය දක්වා වැවී ඇත්තේය.

වඩාත්ම පුදුමයට කරුණ එය නොවේ. වජ්‍රයෝගිනිය සම්පූර්ණ නිර්වස්ත්‍රව සිටින ආකාරයක් බොහෝ තාන්ත්‍රික රූ සටහන්හි දක්වා තිබීමයි. නිර්වස්ත්‍ර වජ්‍රයෝගිනියගේ ගෙල සිට දෙපසට වැටී ඇති මල්දම් දෙකකි. සාග ලෝ වැස්සන් සොබාදහමට සමීපව ජීවත් වන බව සංකේතවත් කිරීමට මල්දම්වලින් කය හැඩකර ඇති බව සමහර තිබ්බතීය විස්තරයන්හි ඇතුළත්ය.

වජ්‍රයෝගිනී චරිතය ටිබෙට් බුදුදහමෙන් නොනැවතී ශිෂ්ඨාචාරයේ තිඹිරිගෙය දක්වාම ඈතට ඈතට දිවයයි. තිබ්බතයේදී වජ්‍රයෝගිනී සහ දේව ඩාකිනී යන නමින් හැඳින්වෙන ඇය හින්දු යෝගීන් අතර කුණ්ඩලනී මාතා යන නමින්ද ජගත් මාතා යන නමින්ද ප්‍රසිද්ධය. මොහෙන්ජෝදාරෝ සහ හරප්පා යන නගර ඇසුරු කරගත් ඉපැරණි ශිෂ්ඨාචාරයන්ට අයත් පුරාවස්තූන් අතර ජගත් මාතාව ලෙස පැහැදිලිව හඳුනාගත හැකි

නිර්වස්ත්‍ර කාන්තාවකගේ මූර්තින් සොයාගෙන ඇත. පුරාතන විශ්වාසයන් අනුව මෙලොවට කුණ්ඩලනී යෝගය දායාද කළේ වජ්‍රයෝගිනිය හෙවත් ජගන්මාතාව විසිනි.

දරුවන් දසදෙනෙකු ජාතක කළද රූපශ්‍රීයෙහි අඩුවක් නම් නැති, රාගික හැඟුම් උපදවාලන පෙනුමෙන්ද යුතු වජ්‍රයෝගිනිය පසුකලෙක තපසට බරව අෂ්ඨ සමාපත්ති උපදවාගත්තාය. ඉන්දු නිම්න භූමිය මත වැඩෙන ළදරු මට්ටමේ මානව ශිෂ්ඨාචාරය කෙරෙහි අනුකම්පා උපදවා ගත් ඇය දැහැන් බලයෙන් වරින් වර පෘථිවියට පැමිණ මෙලෝවාසීන් යහමඟට ගැනීමට අපමණ වෙහෙසක් ගත්තාය.

මෙබඳු මහා පින් ඇති වජ්‍රයෝගිනියගේ කුළුඳුල් පුත්රුවන අක්ෂෝභ්‍ය නම් වෙයි. පෙර සසරෙහි පුරුද්දට තනිව කාමරයට වැදී පොත පත ඇසුරු කරමින් ජීවත් වූ අක්ෂෝභ්‍ය ඔහුගේ ගුණගරුක බව නිසාම බෝධිසත්ව යන නාමයෙන් පිදුම් ලද්දේය. ඕනෑම දරුවකුට පමණට වඩා සැපසම්පත් ලැබුණොත්, ඉල්ලන ඉල්ලන දේ ළඟටම ලැබුණොත් ඒකා කම්මැලියකු වීම වළකනු නොහැක්කේය. අක්ෂෝභ්‍ය කුමාරයා පෙර සසරෙහි පුරුද්ද නිසාද ඉල්ලන ඉල්ලන දේ ළඟට ලැබෙන නිසාද උපන්ගෙයි කම්මැලියකු බවට පත්විය. හේ සෙලවිය නොහැකි කම්මැලියා යන අරුතෙන් යුතුව අක්ෂෝභ්‍ය, නම් අන්වර්ථ නාමය ලැබීය.

මේ කලකට පෙර සාග ලෝකයේ වූ සිද්ධියකි. සාග ලෝ වැස්සන්ට වැසි ලැබෙනුයේ සම්පා නම් විලෙහි වතුර වාෂ්ප වී වලාකුළු තැනීමෙනි. ඒ වලාකුළුවලින් වැටෙන වැස්ස සමහර කාලවල පොළොවට නොවැටී සම්පා විලටම වැටෙයි. මේ හේතුවෙන් සාග ලෝවැස්සෝ

කලින් කල නියඟයෙන් පීඩා ලදහ. එවන් එක් දිනෙක ඔවුහු කත්‍රිකයන්ගේ මාළිගාව වටලා වැසි ලබාදීමට කුමක් හෝ දෙයක් කරන මෙන් ඇවිටිලි කළහ. රටවැසියාගේ කන්කරච්චලය ඉවසාගත නොහැකි අක්ෂෝභ්‍ය තෙමේ මාළිගයේ උඩුමහල් තලයක ජනෙල් පියන් හැර ජනතාව දෙස බලා ඔවුන් කෙරෙහි මෙත් සිත් ඇතිව වර්ෂාව පහළ වේවා යනුවෙන් කියා කවුළු පියන්පත් වසාගත්තේය. ඒ හා සමඟම හාත්පස වලාකුළින් බරවිය. ඈත ක්ෂිතිජය තෙක්ම කළුවර විය. අහස ගුගුරන්නට පටන් ගත්තේය රැස්ව සිටි පිරිස් අමන්දානන්දයට පත් කරමින් මොරසූරන වැස්සක් වැස්සේය. රටවැස්සෝ ඔල්වරසන් දෙමින් අක්ෂෝභ්‍ය කුමාරයාට දිගාසිරි පැතුහ.

බුදුවරයකු ලොව පහළ වන්නේ කලාතුරකිනි. සාග ලොව බබළවමින් සිටි මේසිය බුදුන්වහන්සේ අක්ෂෝභ්‍යගේ කාලය වන විට පිරිනිවනට සැපත්ව තිබුණි. පින්වත් අක්ෂෝභ්‍ය කුමරු තනිව කාමරයට වී බුද්ධ දේශනා සියල්ල ග්‍රන්ථාරූඪ කළේය.

සාග ලොවට අධිපති කත්‍රික රජු දසසක්විති වත් පුරමින් රාජ්‍යය කළේය. එහෙත්, හේ තම අනාගතය ගැන බිය විය. නුවණැත්තා බිය නිසාම දුර්වල තැන් ශක්තිමත් කර ඉදිරියට යයි. අඥානයා බිය නිසා පසුබැස පලා යයි. කත්‍රික රජතෙමේ තම රාජධානියේ බලය කෙදිනක හෝ තමාගෙන් ගිලිහී නොයන්නට ක්‍රමෝපායක් තම පුත්‍රරත්නයගෙන් විමසීය.

අක්ෂෝභ්‍ය කුමාරයා තම දැනුම උපරිම ලෙස භාවිත කර බුද්ධ දේශනාවන්ද සැලකිල්ලට ගෙන 'පාලන තන්ත්‍රය' නමින් ග්‍රන්ථයක් සකස් කළේය. කත්‍රිත රජු තම පුත්‍රයාගේ උපදෙස් හිස් මුදුනින් ගෙන පාලන තන්ත්‍රය ප්‍රතිව්‍යුහගත කළේය. එතැන් පටන් කත්‍රිකයන්ගේ

අනාගත බිය පහවිය. 'අක්ෂෝභ්‍ය පාලන තන්ත්‍රය' යන නම එරට දේශපාලන ක්‍රමය හැඳින්වීමට ව්‍යවහාර විය. අක්ෂෝභය සිය පාලන තන්ත්‍රය නම් පොත සාගිත බසින් ලියා තැබීය. එහි මෙයාකාර විස්තර ඇතුළත්ය.

"පියාණනි ඔබට සැමදා බලයේ සිටීමට අවශ්‍ය නම්, අපරාජිත නායකයකු වීමට ඇවැසි නම් මා කියන උපදෙස් අනුව රාජ්‍යය විචාරනු මැනවි. සාවධානව අසනු මැනවි, ධාරණය කරගනු මැනවි. තේරුම් සමඟ අවබෝධ කරගනු මැනවි. උගත් දේ අවබෝධයෙන් යුතුව භාවිත කරනු මැනවි."

"පියාණනි රජු රටවැසියාට මවක් විය යුත්තේය. රජු වෘත්තියෙන් ගොවියකු විය යුත්තේය. හැසිරීමෙන් නාගයකු විය යුත්තේය."

"පියාණනි ඔබ රටවැසියාගේ මව ලෙස සලකා රාජ්‍ය විචාරණය කළ යුත්තේය. සියල්ලන්ට සමව සැලකිය යුත්තේය. රටවැසියනුත් ඔබගේ මෙහෙසියන්ගේ දරුවනුත් අතර වෙනසක් නොදැකිය යුත්තේය. මිනිසුන්ද ගස්වැල්ද සතා සීපාවෝද ඔබේ දරුවෝමය. ඔබ රජවූ තැන් පටන් පවුලේ නායකයා පමණක් නොවන්නේය. රජවූ තැන් පටන් සමස්ත භූමි තලය ඔබේ පාලනයට යටත් වන්නේය. ඔබ මිනිසුන්ගේ නායකයා පමණක් නොව, වගවලසුන් ආදී සතුන්ගේද අනභිභවනීය නායකයා වන්නේය. ඔබ විසින් කවර හෝ සත්වයකු නැසීම ඒ සත්ව වර්ගයාගේ නැස්මේ ආරම්භය වන්නාක් සේම එය ඔබේ නැස්මෙහි ආරම්භයද වන්නේය. මවක් දරුවන් නොමරන්නාක් සේම රටවැසියා ඝාතනයෙන් වැළකිය යුතුය. වැළැක්විය යුතුය. සැම තිරිසන් සතකුම තමන්ගේ පුත්‍රයන්ට මෙන් සෙනෙහස දැක්විය යුත්තේය."

"තවද පියාණනි මා ඔබට ගොවියකු වන්නැයි කීවේ ක්ෂේත්‍රයට සමව සැලකිය යුතු නිසාවෙනි. ගොවියා ක්ෂේත්‍රයේ සෑම තැනකටම පොහොර සමව යොදන්නාක් මෙන් ඔබගේ ආදර කරුණාවද සංග්‍රහයන්ද රටවැසියාට සමානව කළ යුත්තේය. ලැබිය යුත්තාටම දිය යුත්තේය. දිළින්දන්ට පළමුව දිය යුත්තේය. දක්ෂ ගොවියකු නිතර ක්ෂේත්‍රය පිරික්සන්නාක් මෙන් ඔබ ලබා දෙන සහනාධාරවලට වූයේ කුමක්ද යන්න පිළිබඳව පසු විපරම් කළ යුත්තේය. ක්ෂේත්‍රයට සමව සලකන ගොවියා සරු අස්වැන්නක හිමිකරුවකු වන්නා සේම එබඳු ගුණ ඇති පාලකයා රටවැසියාගේ නොමඳ ගෞරවාදරයට පාත්‍ර වන්නේය."

"තවද පියාණනි මා ඔබට සර්පයකු සේ හැසිරෙන්නැයි කීවේ මන්දැයි ඔබ මගෙන් විමැසිය යුත්තේය. රාජ්‍යයක පැවැත්මට බාහිර හා අභ්‍යන්තර සතුරු කරදර ඇතිවීම නොවැළැක්විය හැකිය. එබඳු කවර හෝ කරදරයකදී නීති පොත් වසා තබන්න. හදිසි කරදරයකදී නීතියෙහි පිළිසරණ පතන පාලකයා අඥානයෙකි. හදිසි කරදරවලට හදිසි විසඳුම් යෙදිය යුත්තේය. පියාණනි ඔබ සාග ලෝකයට සෙවණ දෙන මහා නුගයක් වැන්නේය. ඔබේ යහපැවැත්ම අපේ යහපැවැත්මද වන්නේය. හදිසි සතුරු කරදරයකින් ඔබ නැසුණොත්, ඇද වැටුණු නුගයක් යට සිටි සතා සීපාවන්ට වන ඉරණම අපටද අයත් වනු ඇත. පියාණනි තුඹසක ඇති නිධානයක් රකින නා රජෙකු මෙන් බාහිර අභ්‍යන්තර කරදරවලින් නොපමාව හා ප්‍රචණ්ඩ ලෙසද අනුකම්පා විරහිතවද ක්‍රියා කර අපව ආරක්ෂා කර දෙනු මැනවි."

"තවද පියාණනි, කර්මය උලක් වැන්නේය. යදමක් වැන්නේය. ගිනි පුපුරක් වැන්නේය. අඥාන කෲර පාලකයා තමන්ගේ අත්තනෝමතික දඬුවම් අවසාන ගොදුර බවටම පත්වන්නේය. කිසිදින ආවේග මත තීරණ නොගන්න. හේතු යුක්තිය මතම තීරණ ගන්න ඔබ ගන්නා තීරණ ලියා තබන්න. ඔබගේම කර්මයේ යදමින් ඔබව බැඳෙන දඬුවම් ලබා නොදෙන්න."

"පියාණනි, තමන්ට ආපසු විපාක නොදෙන ලෙස දඬුවම් දිය හැකි ක්‍රම ඇත්තේ තුනක්ම පමණි. හතරවෙනි සාධාරණ දඬුවමක් නොමැත්තේය. වරදකරුට පාඩුවක් සිදුකර වරදෙන් පීඩා වූවන්ට වාසියක් කරන්න. එවිට යුක්තියෙහි තුළා දණ්ඩ මා විසින් සම කළේ යැයි ඔබටම සතුටු විය හැක්කේය. වරද කළවුන් වෙන් කර තැබීම දෙවන දඬුවමයි. වෙන් කිරීමෙන් වරදට ඇති ඉඩ ඇහිරෙයි. වරදින් පීඩාවට පත්වූවන්ගේ සිත සතුටුවෙයි. මා විසින් යුක්තියෙහි තුළා දණ්ඩ සම කරන ලදැයි ඔබටම ප්‍රීති විය හැක්කේය. වරදකරුවන්ට නිග්‍රහ කිරීම තෙවන දඬුවමයි. වරදකරුට කරන නිග්‍රහයෙන් පෙර මා කී ලෙසම යුක්තියෙහි තුළා දණ්ඩ සමකළ බවට ඔබටම සතුටු විය හැක්කේය."

රාජ්‍ය පාලනය හා යුක්තිය ඉටු කිරීම පිළිබඳ වටිනා රහස් රැසක් එළිකළ අක්ෂෝභ්‍ය කුමරු එතැන් සිට රාජ්‍ය විචාරීම පිළිබඳ සාග ලෝකයේ පෙරපටන් පැවති සම්මුතීන් ලියා තැබීය.

විශ්වය හරි අපූරු තැනකි. සමහර තැනක පිරිමින් හා ගැහැනුන් වෙසෙන ලෝක ඇත. පෘථිවිය හා සාග ලෝකය එවැන්නකි. සුඛාවතියේ පුරුෂයෝ පමණක් වෙත්. පෘථිවියත් සුඛාවතියත් අතර පුරුෂයන් පමණක් සිටින ලෝකධාතු හතක් වෙයි. සාග ලෝකයේද

පෘථිවියේද රජවරුන්ට අමතරව ලෝක පාලන දෙවිවරු සිටිති. ආරක්ෂක දෙවිවරු සිටිති. සියලු ආරක්ෂක දෙවිවරු දේවායුධ අතින් දරන රුදුරු පෙනුමැති පුරුෂයෝම වෙති. යම් රාජ්‍යයක ස්ත්‍රියක් රාජ්‍ය විචාරන්නට යෙදුණ කල ආරක්ෂක දෙවිවරු රැකවල් කරන තැන්වලින් බැහැර වෙති. ආරක්ෂක දේවතාවන් බැහැර වූ කල ඒ තැන්වලට වෙනත් අමනුෂ්‍යයෝ පැමිණ සියලු වැඩ කටයුතු අවුල් කරති. ඒ හේතුව නිසා ස්ත්‍රියකට වැඩිකල් රාජ්‍ය විචාරය කළ නොහැක්කේමය. සියලු බුදුවරුන්ගේ මතයද එයම වන්නේය.

රාජ්‍ය පාලකයාද ගෙහිමියාද ගින්නෙහි උපමාව ගැන දත යුත්තේය. ස්ත්‍රිය ගින්දරට සම කර ඔවුන් සමඟ වෙසිය යුත්තේය. ගින්දරෙන් බොහෝ වැඩගත හැකි අතර බොහෝ විනාශයන්ටද එයම මුල් වෙයි. ගින්දර පාලනය කරන්නට දක්ෂයා ගින්දරෙන් වැඩ ගන්නටද දක්ෂයෙකි. ගින්නට ඔබව පාලනයට ඉඩදීම ඔබේ අවසානයයි. ඔබ පළමුව ගින්දර පාලනයට හුරුවන්න එයින්ම ලෞකික ජීවිතයේ සමෘද්ධිය ඇති වන්නේය.

තවද සෑම කෙනෙකුම විසින් පෞද්ගලික සුබසිද්ධිය පිණිස යොදාගත හැකි වටිනා උපදෙස් රැසක් ඇත්තේය. ඒ උපදෙස් පිළිපදින අයකුගේ දියුණුව වැළැක්විය නොහැක්කේමය. අක්ෂෝභ්‍ය ආර්ථික ප්‍රතිපත්තිය අනුව ඔබගේ මිල මුදල්ද ඔබගේ දුර්වලකම්ද පිටතට නොදිය යුතු රහස්ම වන්නේය. ඔබගේ දුර්වලකම් දකින සතුරු පිරිස් පහසුවෙන් ඉලක්කය ගනිති. ඔබගේ නිවසෙහි දුර්වල තැන් රටට ප්‍රකාශ කිරීමෙන් අවැඩක් වන්නා සේම ඔබගේ දුර්වලකම් ගැන ඔබ කතා කිරීමෙන් ඔබටම අවැඩක් සිදුවේ.

# 03

# පිටසක්වළ දේශපාලන නායකයෝ

මා තක සිට ටිබෙට් බුදුදහම ගැන වැඩිපුර ලියන්නේ ඇයිදැයි සමහරු මගෙන් අසති. මම ටිබෙට් බුදු දහමේ අසීමිත දැනුම් සම්භාරය නොසලකා හැරීම වරදක් කොට සලකමි. ටිබෙට් බුදු දහම පුරාම ඇති එක්තරා අපූර්වතාවක් පැහැදිලිව දැක ගත හැකිය. ටිබෙට් බෞද්ධ සම්ප්‍රදාය අනුව ආගම සහ දේශපාන න්‍යාය යනු එකම ගසක අතු දෙකකි.

විසිඑක්වන සියවසට පැමිණ දශක දෙකක් ඉකුත් වීමට ආසන්න මේ මොහොතේ ශ්‍රී ලංකාවාසී අප විසින් පසක් කරගත යුතු අමිහිරි සත්‍යයක් ඇත. "මේ රට තුළ පවතින වගකීම් රහිත දේශපාලන සංස්කෘතිය මඟින් පතුල නොපෙනෙන යළි ගොඩට පැමිණිය නොහැකි ආගාධයක් කරා අප හැම දෙනම කැන්දාගෙන යන්නේය" යන කරුණ ඒ අමිහිරි සත්‍යයයි. මේ රටෙහි දේශපාලනය රා බී වල්මත් වූ ආධුනිකයන් දෙපිරිසක් අතර සිදු කෙරෙන පන්දු ක්‍රීඩාවක් වැනිය. පන්දු ක්‍රීඩාව හරිහැටි කරන හැටි දෙපිරිසෙන් එක් පිරිසක්වත් නොදනිති. පරණ කෝන්තර පිරිමසා ගැනීම හැර රට කරවන්නට

දෙපිරිසෙන් කාටවත් උනන්දුවක් නැත. පන්දුව අනෙකා වෙත විසි කිරීම හැර වෙනත් සාධනීය ක්‍රියාවලියක් අද දේශපාලන කරලිය තුළ දකින්නට නොමැත.

ලෝකපාලක දෙවිවරුන්, ශාසනාරක්‍ෂක දෙවිවරුන් වෙත්නම් ඔවුන් අද කොහිද? ලක්දිවට අධිගෘහිත එකී මෙකී නොකී ආරක්‍ෂක දෙවිවරුන් අද සිදුවෙමින් තිබෙන ස්වාභාවික විපත් හා පාරිසරික හානි වැළැක්වීමට නොහැකිව ලැජ්ජාවෙන් පසුබා ගියාවත්ද?

අප රට තුළ සුවිසල් ආධ්‍යාත්මික රික්තයක් සැදෙමින් ඇත. දේශපාලනික රික්තයක් සැදෙමින් ඇත. එනමුත් ඒ රික්තය පිරිමසාලන්නට හැකි සමතකු ඉදිරියට පැමිණ වැඩ අල්ලන බවක්ද පෙනෙන්නට ඇත. කියන දේ කරන කරන දේ කියන දේශපාලන නායකයන් වහාම අවශ්‍යව ඇත. තනතුරු තාන්න මාන්නවලට ගැති නොවී පැත්ත ගියත් ඇත්ත කියන ආගමික නායකයන් විශාල පිරිසක් වහාම අවශ්‍යව ඇත. නෑ බෑ නොකියා වගකීම්වලට කරගහන ආරක්‍ෂක දේවතාවුන් දෙතුන් දෙනෙකු නොව, බැටෑලියන් එකක්ම මෙරටට අවශ්‍යව ඇත. ටිබෙට් බුදු දහමෙහි කියවෙන ආධ්‍යාත්මික දේශපාලන නායකයන් බලහත්කාරයෙන් හෝ මෙරටට කැඳවාගෙන එන්නට සිදුව ඇත්තේ එබැවිනි.

පිටසක්වළ දේශපාලන නායකයන් අතර අක්‍ෂෝභ්‍ය යන නම වෙසෙසින්ම කැපී පෙනෙයි. ටිබෙට් බෞද්ධ සාහිත්‍යය තුළ අක්‍ෂෝභ්‍ය නාමයට සුවිශේෂී තැනක් හිමිවෙයි. ජපානයේ ෂින්ගොන් බෞද්ධ සම්ප්‍රදාය තුළද අක්‍ෂෝභ්‍ය බෞද්ධ නායකයකු ලෙස හරසරට ලක්ව ඇත. සමහර තැනක බෝසත්වරයකු ලෙසත් තවත් තැනක බුදුවරයකු ලෙසත් හැඳින්වෙන ඔහු

'අචල' නම් වූ ගුණය නියෝජනය කරයි. අචල යන පදයෙන් නොසැලෙනසුලු බව, අකම්පිත බව හා අපරාජිත නායකත්වය නිවේදනය කෙරෙයි. ටිබෙට් බුදු දහමෙහි ප්‍රධාන ආධ්‍යාත්මික නායකයන් පස්දෙනෙකි. ඒ නායකයෝ 'ධ්‍යානි බුද්ධ' යන ගෞරව නාමයෙන් හඳුන්වනු ලැබෙති. ධ්‍යානි බුදුවරුන් පස්දෙනා විවිධ ගුණ සම්බන්ධව ප්‍රසිද්ධියක් උසුලති. අක්ෂෝභ්‍යගේ අචල ගුණයට අතිරේකව එතුමාගේ අනභිභවනීය බුද්ධි මහිමය වජ්‍රයාන ඇදුරන්ගේ පොතපත තුළින් වර්ණනා කර ඇත. අක්ෂෝභ්‍ය යනු අකම්පිත දේශපාලන නායකයෙකි. සක්වළ අතර සැරිසරමින් මිනිසුන් යහමඟට යවන බෝධිසත්වයෙකි.

මහාගුරු පද්ම සම්භවගේ යෝග විද්‍යා රහස් අත්පොතෙහි සඳහන් වන පරිදි ලෝකය පඨවි, ආපෝ, තේජෝ, වායෝ ආකාශ යන මූලධාතුවලින් නිර්මාණය වී ඇත. මෙහි ආකාශ හා වායෝ යන මූලයන් දෙක අතර වෙනස ඉතා සියුම්ය. ආකාශ යනු ඉඩකඩයි. වායෝ යනු වාතයයි. ආකාශය හා වාතය යනු දෙකක්ය යන අවබෝධය වජ්‍රයාන ඉගැන්වීම්වල පැහැදිලිව දැක්වෙයි.

අභිරති ලෝකයේ මහා බුද්ධිමතා වන අක්ෂෝභ්‍ය ජලය නම් වූ මූලධාතුව නියෝජනය කරයි. වජ්‍රයාන මූල ග්‍රන්ථයන්හි කියැවෙන පරිදි ලෝකය යථාර්ථ වශයෙන් පවතින එකක්ද නොවේ. ලෝකය හුදු මායාවක්ද නොවේ. ලෝකය යථාර්ථය හා මායාවෙහි අපූරු සංකලනයකි. මහා පරිවර්තක මර්පා ලොත්සාවා විසින් මායාව හා යථාර්ථය අතර වෙනස මෙසේ විස්තර කර දී ඇත.

"ලෝකය යථාර්ථ වශයෙන් පවතී යයි කීම එක්තරා අන්තයකි. ලෝකය මායාවක් ලෙස ගැනීමද

තවත් අන්තයකි. ලෝකය මායාවක් නම් බුදු පසේබුදු මහරහත්වරුන්ද මායාවන් ලෙසම සැලකිය යුතුය. නිවන් දැකීමට උත්සාහ කිරීමද නිවනද මායාවක් ලෙසම සැලකිය යුතුය. එසේ නම් සත්‍යය පවතින්නේ කොතැනද? ලෝකය මායාව සහ යථාර්ථය අතරමැද හරියේ පවතින්නේ යයි කීවොත් එය වඩාත් සාධාරණය."

මෙතැනදී වඩාත් සංකීර්ණ ප්‍රශ්නයක් මතුවෙයි. කවර දේ මායාවක් ලෙස සැලකිය යුතුද? කවර දේ යථාර්ථ වශයෙන් පවතින බව පිළිගත යුතුද? සත්තකින්ම බුදුදහම ශාඛාවන්ට බෙදී යාමට එක් මූලික හේතුවක් වනුයේද යථාර්ථය හා මායාව අතර පවතින විසංවාදයයි. මූලික සූත්‍ර ගණයට වැටෙන මජ්ඣිම සූත්‍ර දේශනාවෙහි ලෝකය යථාර්ථය හා මායාව අතරමැද පවතින්නේය යන පැහැදිලි නිගමනය දක්වා ඇත. එනමුත් මහායන විඥ්ඥාණවාදීහු ලෝකය හුදු මායාවක් ලෙස සලකති. මහායාන විඥ්ඥාණවාදයේ මූලබීජය නාගර්ජුනගේ මූලමාධ්‍යමික කාරිකාව තුළින් හමුවෙයි. එකක් අනෙකට සාපේක්ෂව කරනු ලබන අර්ථ දැක්වීම් මිසක කිසිවක් නිරපේක්ෂකව නොපවතින බව මූල මාධ්‍යමික කාරිකාවෙහි විස්තර වෙයි. "නිවන සසරට සාපේක්ෂකය - සසර නිවනට සාපේක්ෂකය - එබැවින් නිවන සසරට සමානය - සසර නිවනට සමානය" යන අප්‍රභංශය නාගර්ජුනගේ ඉගැන්වීම් තුළින් හමුවෙයි.

මහායාන මූලධර්ම අතර ප්‍රධානතම එකක් ලෙස සැලකෙන ශූන්‍යතාවාදයට පසුබිම් වන්නේද නාගර්ජුනගේ එකී ඉගැන්වීමය. මහායාන ශූන්‍යතවාදය තවදුරටත් දියුණු වීමෙන් විඥ්ඥාණවාදී ගුරුකුලය බිහිවිය. මහායාන විඥ්ඥාණවාදයේ මූලික ඉගැන්වීම

විඥ්ඥප්තිමාත්‍රතා සිද්ධිවාදය නම් වෙයි. අප එදිනෙදා අත්දකින සියලු සිදුවීම්ද සත්ව පුද්ගල ආදී ප්‍රපංචයන්ද සිතෙහි හටගන්නා හැඟීම් දැනීම් මිසක වෙන කවරක් හෝ නොවන්නේය යන කරුණ විඥ්ඥප්තිමාත්‍රතා සිද්ධිවාදයේ හරයයි. විඥ්ඥප්තිමාත්‍රතා සිද්ධිවාදය එක්තරා කරුණක් මත ශූන්‍යතාවාදයෙන් වෙනස් වෙයි. ශූන්‍යතාවාදය අනුව සියල්ලම මායාවකි. එනමුත් මහායාන විඥ්ඥාණවාදය අනුව විඥ්ඥාණය යථාර්ථ ලෙසම පවතියි. අනෙකුත් සියල්ල විඥ්ඥාණය මත හටගන්නා ප්‍රතිබිම්බයන් මිස අනෙකක් නොවේ. මහායානිකයන් විඥ්ඥාණය ලෙස අදහස් කළේ සිතයි.

මහාසාංඝිකයන්ගෙන් භින්න වූ ථෙරවාදී සාර්වස්තිකවාදීහු මීට ප්‍රතිපක්‍ෂ ලෙස සියල්ල යථාර්ථ ලෙස පවතින බව විශ්වාස කළහ. අප අදහන 'නව ථෙරවාදය' ලංකාවේ බිහිවූවකි. නව ථෙරවාදී ගුරුකුලය අනුරපුර මහාවිහාරය තුළින් බිහිවූවක් බවට සාක්‍ෂි ඇතිමුත් නව ථෙරවාදය කවදා කවුරු නිර්මාණය කළේද යන්න සැක සහිතය. එනමුත් නව ථෙරවාදය එකලස් කර විසුද්ධි මාර්ගය ඇතුළු අර්ථකථා ලිවීම තුළින් බුද්ධඝෝෂ හිමි ථෙරවාදී මහැදුරා ලෙස ගෞරව සම්මානයට පාත්‍ර වූයේය. දැනට අනෙකුත් ථෙරවාදී රටවල පිළිගනුයේද ශ්‍රී ලංකාවේ හටගත් නව ථෙරවාදයයි.

නව ථෙරවාදය අධිතාත්වික පදනමක් මත සකස් වූවකි. ථෙරවාදය අනුව සත්වයකු හෝ පුද්ගලයකු නොමැත. චිත්ත, චෛතසික, රූප, නිර්වාණ යන සතර පරමාර්ථ ධර්ම පමණක් යථාර්ථ ලෙස පවතියි. අනෙක් සියල්ල යථාර්ථ නොවූ ප්‍රපංචයන්ය. මේ නව ථෙරවාදයේ පදනමයි. අවාසනාවකට මෙන් නව ථෙරවාදයේ

පදනම මූලික සූත්‍ර සමඟ කිසිසේත් නොපෑහෙයි. නව ථෙරවාදයේ පදනම ථෙරවාදීන්ගේ ක්‍රියා කලාපය හා විශ්වාසයන් සමඟ නොපෑහෙයි. සත්වයෙක් පුද්ගලයකු යථාර්ථ ලෙස නැතිනම් බුදුවරයකු සිටිත හැකිද යන ප්‍රශ්නයට පිළිතුරු දීමට ථෙරවාදීන් අපොහොසත්ය. මාර්පා ලොත්සාවා මේ ප්‍රශ්නය කල්තබාම විසඳූ බව ථෙරවාදීන් දැන සිටියේ නැත. සත්වයකු පුද්ගලයකු නැත යන වාදය බුද්ධ කාලයේ භික්ෂූන් වහන්සේලා සය නමක් අතර ඇතිවූ බව නව ථෙරවාදීන් නොසලකා හැර ඇත. ලෝකය යථාර්ථය හා විඤ්ඤප්ති මාත්‍රයන් අතර මැද පවත්නා බව සූත්‍ර පිටකයේ මජ්ඣේඩ සූත්‍රයෙන් ඉඟිකෙරෙන බව නව ථෙරවාදී ආචාර්යවරුන් දැන සිටියේ නැත.

මේතාක් විස්තර දැක්වූයේ ථෙරවාදය තර්ක කර බිඳ දැමීමට නොවේ. අක්‍ෂෝභ්‍ය කුමාරයාගේ රසවත් ඉගැන්වීම් කිහිපයකට ප්‍රවේශයක් ලෙස බුද්ධිමය කුතුහලය අවුස්සාලීමටය. ටිබෙට් බුදු දහමෙහි කියැවෙන පරිදි අක්‍ෂෝභ්‍ය යනු යථාර්ථය හා මායාව අතර වෙනස පහදා දීමේ ගජ සමතෙකි. අභිරති ලෝකධාතුව තුළ තවමත් ජීවත්වන ඔහු පෘථිවි තලයේ වෙසෙන බෞද්ධයන්ට වැරදුණු තැන් කියාදී ඔවුන් නියම මඟට හරවා යැවීමට සූදානමින් සිටියි.

අක්‍ෂෝභ්‍ය සක්වළ චාරිකාවෙහි යෙදීමෙහි කැමැත්තෙන් පසු වෙයි. හේ ඉඳහිට මෙලොවට පැමිණ මිනිසුන්ට ගුරුහරුකම් දෙයි. ටිබෙට් විහාර චිත්‍රයන්හි නිල් පැහැ සිරුරකින් ප්‍රසන්න මුහුණකින් හා කඩා හැලෙන සිවුරකට සමාන ඇඳුමකින් යුතු පිටසක්වළ ජීවියකුගේ රූපයක් දැකගත හැකිය. ඒ අනෙකකු නොව,

බෞද්ධ භික්ෂුවකගේ ඇඳුමින් සැරසුණු නුවණට අධිපති අක්ෂෝභ්‍ය බෝධිසත්වයාණන් වහන්සේය. අක්ෂෝභ්‍ය මෙලෙසින් පෘථිවියට පැමිණි අවස්ථාවක මෙසේ කීය.

"ලෝක ධාතුන්හි ජීවයේ පරිණාමය හුදෙක්ම ස්වභාවික ක්‍රියාවලියක් නොවන්නේය. පිටසක්වළ ජීවීහු විවිධ හේතුමත වෙනත් සක්වළ ජීවීන්ගේ පරිණාමයට හා දියුණුවට උදව් කරති. එක් ලෝකධාතුවක් සැලකූ කල්හි එය සදාකලික නොවේ. විශ්වයේ එක් ලෝකධාතුවක් නැසී ගියද අනෙක් ලෝකධාතු විනාශ නොවී පවතියි. මෙයාකාරයෙන් විනාශ වූ ලෝකධාතු මත බොහෝ කලකට පසු ජීවය නැවත නිර්මාණය වෙයි. අලුතින් ඇතිවූ ලෝකධාතු මත අනුක්‍රමයෙන් ඇතිවන මනුෂ්‍යයන්ට වෙනත් සක්වළ දියුණු ජීවීහු සහාය වෙති. ඔවුන් වෙත පැමිණ විවිධ විද්‍යාවන් උගන්වති. මේ ආකාරයට සාග ලෝකයෙන් පෘථිවියට පෘථිවියෙන් සාග ලෝකයට දීර්ඝ කාලයක් තිස්සේ දැනුම හුවමාරු විය."

"පෙරකල පෘථිවියෙහි කෝණාගමන නම් බුදුවරයෙක් වැඩ වාසය කළහ. කෝණාගමණ බුදුන්ගේ සමයෙහි පෘථිවිවාසීහු අදට වඩා විවිධ විද්‍යාවන් දැන සිටියහ. එකල සිටි යෝගීහු කුණ්ඩලනී යෝග විද්‍යාවේ පරතෙර පැමිණ සිටියහ. කුණ්ඩලනී යෝග ක්‍රමයට අයත් කාලතරණ මූලධර්මය අනුව කය මෙහි තබා වෙනත් ඕනෑම තැනක සූක්ෂ්ම කයකින් පෙනී සිටිය හැකිය. එකල මෙහි සිටි යෝගීහු අභිඥා බලයෙන් සාග ලෝකයට පැමිණ එහි වැස්සන්ට අනුකම්පා කර විවිධ විද්‍යාවන් ඉගැන්වූහ. මෙයාකාර ක්‍රියාවලියක් විශ්වීය යහපැවැත්ම සඳහා අනිවාර්යයෙන්ම පැවතිය යුතුය. මන්දයත් කල්ප විනාශයෙන් එක් සක්වළක් නැසුණද ලෝකධාතු අතර

දැනුම හුවමාරුව නිසාවෙන් ඒ ලෝකවාසීන්ගේ දැනුම ආරක්ෂා වෙයි."

අක්ෂෝභ්‍යගේ ඉගැන්වීම් අතර ලෝකධාතු අතර දැනුම සංසරණය පිළිබඳ මතවාදයද බෝධි චර්යාවද වෙසෙසින්ම කැපී පෙනෙයි.

අනන්ත අප්‍රමාණ විශ්වය තුළ පවත්නා මනුෂ්‍ය ලෝකවල ගණන කිව නොහැකි තරම්ය. අපගේ ලොවෙහි මෙන්ම බුදුවරු, බෝසත්වරු, මුනිවරු හා ඍද්ධිමත්හු වෙනත් ලෝකධාතුවල වෙසෙති. වෙනත් ලෝකධාතුවලින් ලබාගත් දැනුම ඇසුරෙන් අතිශීඝ්‍ර ලෙස සසර සයුර තරණයෙහි යෙදීම වජ්‍රයානය නම් වෙයි.

වජ්‍රයානය යන නම කියූ සැණින් වජ්‍රායුධය සිහිපත් වෙයි. මෑත කාලීනව ශ්‍රී ලංකාවේ දේශපාලන ක්ෂේත්‍රයේ ප්‍රබලයකු අත වජ්‍රායුධය ළෙලදෙනු දක්නට හැකිවිය. වජ්‍රය පිළිබඳ මුල්ම විස්තර හමුවනුයේ සූත්‍ර පිටකයෙනි. ශක්‍රයා නිතරම සිය ආරක්ෂාව පිණිස වජ්‍රායුධයක් ළඟ තබාගත්තේය. එබැවින් හේ වජ්‍රධර නම් විය. වජ්‍රයාන බුදුදහම ලෝකධාතු අතර බෙදා දෙන වජ්‍රයෝගිනී හා අක්ෂෝභ්‍ය යන දෙදෙන වජ්‍ර නම් පවුල් පරම්පරාවට අයත් වෙති. ඔවුන්ගේ ආරක්ෂාව සඳහා ළඟ තබාගන්නා ආයුධ අතර වජ්‍රයට මුල් තැන ලැබෙයි. මහායෝගී මිලාරෙපා සිය ආරක්ෂාවට වජ්‍රයක් ළඟ තබාගත්තේය. මිලාරෙපාගේ ඓතිහාසික වජ්‍රය අදටද එතුමාගේ ගෝල පරපුර සතුව පවතියි.

අක්ෂෝභ්‍ය බෝසත් තෙමේ සිය සුපුරුදු කම්මැලි ගති අත්හැර විටින් විට සක්වළ තරණය කර බුදුදහම

බෙදා හරියි. මහා පින් ඇති අක්ෂෝභ්‍ය කුමරු ගෞතම බුදුන් දැක බණ ඇසීමට තරම් භාග්‍යවන්තයකු වූයේය.

මෙලෙස ලෝකධාතු අතර දැනුම බෙදාදීමෙන් බෝසත්වරුන්ගේ පින මෝරාගොස් බලතල තව තවත් වැඩිවෙයි. බෝසත්වරුන් ලෝකධාතු අතර සැරිසරමින් ධර්මය බෙදන නමුත් එක් ලෝකධාතුවක උපදින අයකු බුද්ධත්වයට නැතහොත් අර්හත්වයට පත්වනුයේද ඒ ලෝකධාතුව තුළමය. එකිනෙකාගේ උපාදාන පවතිනුයේ ඔවුන් උපන් ලෝකධාතුවෙහිමය. ඒ නිසා කවුරු කවුරුත් මියගොස් යළි උපදින්නේ පිටසක්වළ නොව තමන් උපන් ලෝකධාතුවේමය.

එක් ලෝකධාතුවක නැතහොත් එක් සක්වළක උපන් අයකු වෙනත් සක්වළක ඉපදෙන විරල අවස්ථාවක් ථෙරවාදී අටුවාවෙහි ඇත. ඒ නම් කල්ප විනාශ අවස්ථාවයි. කල්ප විනාශයේදී අටමහා නිරයෙන් පටන්ගෙන සතර අපායම විනාශ වෙයි. එබඳු අවස්ථාවක නිරයේ සිට කල්පාන්ත අග්නියට හසුව මියයන සත්වයෝ වෙනත් සක්වළක පිහිටි නිරයක ඕපාපාතික ලෙස උපදිති. අටුවාවෙහි සඳහන් පරිදි වෙනත් සක්වළක උපන් අයකුට මේ සක්වළ උපදින බුදුකෙනකුගේ ශාසනයේ සාඩම්බර සාමාජිකයකු වීමේ අවස්ථාව ගිලිහෙයි. වෙන සක්වළක උපත ලැබීම අෂ්ඨ දුෂ්ඨක්ෂණයන්ගෙන් එකකි.

අක්ෂෝභ්‍ය කුමරාගේ ඉගැන්වීම් අනුව ලෝකධාතු අතර මාරුවී සත්වයන් උපදින තවත් අවස්ථාවක් වෙයි. සමහර වැරදි වැඩ කරන මිනිස්සු පාප කර්මයන්හි බලයෙන් සක්වළ දෙකක් අතර ලෝකාන්තරික නිරයේ උපදිති. සක්වළක් හෙවත් ලෝකධාතුවක් සකස් වනුයේ එක්තරා නියමයක් අනුවය. සෑම සක්වළකම සතර

අපායක්ද දෙව්ලෝ සයක්ද මිනිස් ලොවක්ද බ්‍රහ්ම ලෝකද වෙයි. මෙයින් සක්වළ එක් ඈත කොනක අකණිටා බ්‍රහ්ම තලය පිහිටයි. සක්වළ දෙකක් අතර ලෝකාන්තරික නම් වූ ආගාධය පිහිටයි. වර්තමානයේ කළු කුහර යනුවෙන් හඳුන්වනු ලබනුයේ ලෝකාන්තරික කුහරම බව පෙනේ. ඒ තුළ උපන් අපාගත සත්වයෝ සක්වළ නැසී ගියද කර්මය අවසන් වන තුරු මිය නොයති. ලෝකාන්තරික ආගාධයෙහි උපන් සත්වයා අපමණ දුක්විඳ සියලු කර්ම ගෙවී අවසන් වෙයි. ඔහුගේ කර්ම ගෙවී අවසන් වන විට ලෝකාන්තරික කුහරයෙන් නිදහස් වෙයි. එවන් විටක ඔහු කලින් උපන් සක්වළ නැසී තිබුණහොත් ලෝකාන්තරික නිරයෙන් එහා පැත්තේ පිහිටි යාබද සක්වළ ඔහු උපදියි. මෙලෙස උපදින නැවුම් සත්වයා සියලු කර්ම සංචිතයන් මුදා හල අයෙකි. ඔහු නැවත කර්මයන් උපදවා ගනිමින් අලුත් ජීවියකු ලෙස අලුතින් උපන් සක්වළ ජීවත් වෙමින් සසර දුක යළි විඳියි.

අක්ෂෝභ්‍ය ලෝකාන්තරික කුහර ගැන කරන විස්තරය පුදුමයකට මෙන් නව විද්‍යා මතවාදයක් ලෙසද ඉදිරිපත්ව ඇත. චක්‍රාවාට දෙකක් අතර කළු කුහරයක් ඇති බවත් ඒ කළු කුහරය තුළින් චක්‍රාවාට අතර ද්‍රව්‍ය සංසරණය වන බවත් ඒ විද්‍යාත්මක මතයෙන් කියැවෙයි. කළු කුහරයක් යනු ගුරුත්වාකර්ෂණ ආගාධයකි. අපරිමිත ගුරුත්වාකර්ෂණ බලයක් සුළු ඉඩක ඇසිරීමෙන් කළු කුහරයක් නිර්මාණය වෙයි. කළු කුහරයක් දෙපස චක්‍රාවාට දෙකක් තිබුණහොත් අවකාශ කාලය වක්‍ර වී දෙපසින් එකිනෙක යාවන ගුරුත්ව පුනීලයක් තැනෙයි. යම් වස්තුවක් ගුරුත්ව පුනීලය දෙසට ගමන් කළහොත් එය එක්කෝ කළු කුහරය තුළට වැටී විනාශ වෙයි.

එසේ නැතිනම් එය කළු කුහරය වටේ පුනීලයක ගැට්ට දිගේ යන්නාක් සේ ගමන් කර එහා පැත්තෙන් අනෙක් සක්වළට විසිවෙයි. මේ අපූරු විද්‍යාත්මක උපකල්පනය ලෝකාන්තරික කුහර පිළිබඳ බෞද්ධ මතය සමඟ හරියටම පෑහෙයි.

පෘථිවියට බොහෝ ඈතින් සක්වළ ගණනාවකට එහි සුඛාවතී නමින් ලෝකධාතුවක් වෙයි. මුල් මහායානයේ විස්තර වන පරිද්දෙන්ම සුඛාවතිය මනරම් ලෝකයකි. සුඛාවතිය මෙතරම් ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ අනාදිමත් කලෙක සිට අපමණ සත්වයන්ට සත්‍යය හෙළිදරව් කරන ලද අමිතාභය බුදුන් වහන්සේ එහි වැඩවසන නිසාවෙනි. අක්ෂෝභ්‍ය අමිතාභය බුදුන්වහන්සේගේද ශ්‍රාවකයෙකි. මුල් මහායාන ඉගැන්වීම් අනුව සුඛාවතියෙහි ඉපදීමට ප්‍රාර්ථනා කරන අය එහි නැවත ඉපදීමේ ස්වභාවයක් ඇත. අක්ෂෝභ්‍ය එම මතය තරයේ ප්‍රතික්ෂේප කරයි. පෙර සඳහන් කළ අපාය අතර හුවමාරුව හා ලෝකාන්තර නිරයෙන් එහා පැත්තට විසිවීම හැර සක්වළ අතර සත්වයින් මාරු වෙමින් උපදින හේතුවක් නොමැති බව අක්ෂෝභ්‍ය ඉතා පැහැදිලිව යෝජනා කරයි. සුඛාවතියේද අභිරති ලෝකයේද මිනිසුන්ට ඉතා දීර්ඝ ආයුෂ ඇත. ඔවුන්ගේ දීර්ඝ ආයුෂවලට හේතුව සත්ව මාංශයෙන් වැළකී සිටීමයි. පෙරකල පෘථිවියෙහි බොහෝ සමෘද්ධිමත් යුගයක් පැවතුණි. එකල සත්තුද මිනිස්සුද චිත්ත සන්නිවේදන ක්‍රමවලින් ඔවුනොවුන් අතර අදහස් හුවමාරු කර ගත්හ. පසුකාලීනව සත්ව ඝාතනය ඇරඹුණි. සත්ව මාංශ ආහාරයට ගැනීම ඇරඹුණි. ඒ හා සමඟ මිනිසුන්ගේ චිත්ත බලය බිඳ වැටුණි. සතුන් හා සමාගමය ඉන් අවසන් විය. ආයුෂද ශීඝ්‍රයෙන් පිරිහී ගියේය.

අක්ෂෝභ්‍ය කුමාරයා කියනා හැටියට ලෝක ධාතු අතර අඩුම ආයුෂ විඳිනුයේ පෘථිවියේ මිනිසුන්ය. පෘථිවියේ පරිභ්‍රමණ වේගයද ඊට එක් හේතුවකි. අඩුම ආයු විඳි බුදුන්වහන්සේ ගෞතම බුදුන්වහන්සේය. අඩුම කාලයකින් දස පාරමී දම් සම්පූර්ණ කළේද උන්වහන්සේය.

පාරමිතා බල ගැන මූලික සූත්‍රවල වැඩි විස්තර ඇතුළත් නොවේ. පාරමී බල ගැන මුල්ම විස්තර හමුවනුයේ බුද්ධ පරිනිර්වාණයෙන් සියක් වසක් ගිය තැන සකස් කරන ලද බුද්ධක නිකායට අයත් ග්‍රන්ථයන්හිය. පාරමිතාවන් පිළිබඳ දීර්ඝ විස්තර ඇතුළත් මහායාන හා වජ්‍රයාන ඉගැන්වීම්වල බලපෑම මත ථෙරවාදීන්ගේ පාරමිතා විස්තරය සකස් කර ඇත.

අක්ෂෝභ්‍ය කුමාරයාගේ ඉගැන්වීම් අනුව බුදුවීමට දස පාරමී පිරීම අත්‍යවශ්‍ය වෙයි. බුදුවීමට පාරමී දම් පිරිය යුතු අවම කාලය අසංඛ්‍ය කල්ප හාරලක්ෂයකි. බුදුවරු වීර්යාධික ශ්‍රද්ධාධික ප්‍රඥාධික ලෙස තෙයාකාර වෙති. යමකු ප්‍රඥාධික බුදුවරයකුගෙන් නියත විවරණ ලදහොත් ප්‍රඥාධික බුදුවරයකු ලෙසම සසර දුක තරණය කරයි. අනෙක් බුදුවරුන් සම්බන්ධවද මේ ඉගැන්වීම් සාධාරණය. මෙයද අක්ෂෝභයගේ ඉගැනීම් අතර හමුවන්නකි.

සාග ලෝකයේ මිනිසුන්ගේ ආයුෂයට වඩා සුඛාවතියේ ඇත්තන්ගේ ආයුෂ බොහෝ වැඩිය. එමෙන්ම බුදුවරයකුට අවශ්‍ය නම් කල්පාන්තය තෙක්ම, කල්පාන්ත අග්නිය පැන නගින තෙක්ම ඍද්ධි බලයෙන් ජීවත් විය හැකිය.

සුඛාවතියෙහි වැඩවසන අමිතාභය බුදුහු බොහෝ කලක් වැඩ වාසය කර ආයුෂ අවසානයේ පිරිනිවනට කල් දැන වදාළ සේක. එකල්හි බුද්ධෝපස්ථායක භික්ෂූන්වහන්සේ දණ බිම හොවා ඇඳිලි බැඳ "බුදු පියාණනි පහනක් නිවී ගිය කල්හි එහි ආලෝකය කොහි ගියේදැයි කීමට නොහැකිය. එපරිද්දෙන්ම බුදුවරයකු පිරිනිවනට පත්වූ කල්හි මිනිස්සු බුද්ධත්වය ගැන සැක කරති. ධර්මය ගැන සැක කරති. ආර්ය සංඝරත්නය ගැන සැක උපදවති. බුද්ධ ශ්‍රාවකයන්ට ගරහති. බුදුවරයකු හෝ ඍද්ධිමතකුට කැමති නම් කල්පයක් වුව ඍද්ධි බලයෙන් ජීවත්විය හැකියයි මා අසා ඇත. ඔබවහන්සේ අප කෙරෙහි අනුකම්පා කර කල්පාන්තය තෙක්ම ජීවත් වන සේක්වා" යනුවෙන් ඉල්ලා සිටියහ.

බුදුවරු කී දේ කරති. කරන දේ කියති. ඉල්ලූ දේ දීමට හැකිනම් දෙති. දීමට නොහැකි නම් නොදෙති. එය බුද්ධ ස්වභාවයයි. බුද්ධෝපස්ථායක භික්ෂූන්වහන්සේගේ කීමට අනුකූලත්වය දැක්වීම් වශයෙන් අමිතාභය බුදුහු ඍද්ධි බලයෙන් තවත් බොහෝ කාලයක් වැඩ සිටීමට තීරණය කළහ. සතර ඍද්ධිපාදයන් වඩන ලද කෙනෙකුට කැමති නම් කල්පයක් වුව ජීවත් විය හැකි බව මහා පරිනිර්වාණ සූත්‍රයේ දැක්වෙයි.

පෘථිවියෙහි විපස්සී බුදුන්වහන්සේ වැඩ සිටි කාලයේ අමිතාභය බුදුහු සුඛාවතියේ වැඩවාසය කළහ. මතු මෛත්‍රී බුදුන්ගේ කාලයේද අමිතාභය බුදුහු වෙනසක් නැතිව සුඛාවතියේ වැඩ වසති. එහෙත් බුදුවරු ලෝක ධාතු අතර මාරු වෙමින් ධර්ම ප්‍රචාරයෙහි නොයෙදෙති. තමන්වහන්සේගේ ආඥා ක්ෂේත්‍රයට හසුවන ඕනෑ තැනක වෙසෙන කෙනෙකු ඉදිරියේ තම නිර්මාණකායක්

හුවා දක්වමින් බණකීමේ සමත්කම බුදුවරුන්ට ඇත. ගෞතම බුදුන්වහන්සේගේ ආඥා චක්‍රය සක්වළ දසදහසකි. දසදහසක් සක්වළ අභිංඥාලාභීන්ට ගෞතම බුදුන් අරමුණු කර බණ ඇසිය හැකි විය. එනමුත් ගෞතම බුදුන්වහන්සේට ඕනෑම දුරක සිටින කෙනෙකුට ඇසෙන සේ බණ කීමට හැකිය. පෙරකී ආඥා ක්ෂේත්‍රයෙන් බුදුවරුන්ගේ හැකියාව සීමා නොවේ. ආඥා ක්ෂේත්‍රය යනු අභිංඥාලාභීන්ට බණ ඇසෙන සීමාවයි. කිසිදු අභිංඥාවක් නොමැති කෙනෙකුට වුව බුදුවරයකු තමන් අරමුණු කර කියන බණ ඇසිය හැකිය.

බුදුවරු උදෑසන පිබිද මහා කරුණා සමාපත්තියට සම වැදෙති. තමන්වහන්සේගෙන් පිහිට ලැබීමට සුදුස්සන් හා ඔවුන් සිටින තැන් ආදිය එකල්හි දර්ශනය වේ. බුදුවරුන්ට දුරස්ථ පුද්ගලයින් අරමුණු කර බණ කීමට ඇවැසි විට පළමුව ආලෝක කසිණයට සමවැදී කසිණාලෝක කදම්භයක් එතැනට යවනු ලැබේ. කසිණාලෝකය තුළින් බුද්ධ ශරීරය දර්ශනය වන්නට හරිනු ලැබේ. දුරට ඇසෙන්නට බණ දෙසනු ලබන්නේ ඉන් පසුවය.

# 04

# කල්පයක් ආයු ඇති අමිතාභය බුදුහාමුදුරුවෝ

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ගැන විස්තර කර ලිපි පෙළක් ලියන්නැයි බෙහෝ දෙනෙක් මගෙන් ඉල්ලා සිටිති. දැනට වසර පහකට පමණ පෙර සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය බොහෝ දේ ලියා පළ කළෙමි. බොහෝ කලෙකින් හා දිගු විරාමයකට පසු ඒ ගැන යළි ලිවීමට කල්පනා කළෙමි.

මුල් මහායානයට පදනම සපයනුයේ සද්ධර්ම පුණ්ඩරීක නම් වූ දීර්ඝ දේශනාවකි. නිවැරදි සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය කුමක්ද යන්න පිළිබඳව මහායානිකයන් අතර පවා එකඟතාවක් නැත. ඔවුහු තවමත් එය සොයති. ඔවුන්ට තවමත් එය හමුවී නැත. මහායානිකයන් විසින්ම කියන පරිදි නිවැරදි සද්ධර්ම පුණ්ඩරීකය යනු කුමක්ද යන්න මෙතෙක් නොවිසඳුණු බරපතළ ප්‍රශ්නයකි.

තවත් අතකින් බලන විට සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය යනු මෙරට බෞද්ධයන් අතර අවුල් සහගත තත්ත්වයන් ඇතිකිරීමට තුඩු දුන් මාතෘකාවකි. බුදුදහමේ රහස් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයෙහි ඇතුළත් බවට එක් කතාවක් ඇත. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය බෙදා හැරීමෙන් බොහෝ

ධනවත් වන බවටද මතයක් වෙයි. එය මහායානිකයන් විසින් ගොතන ලද ප්‍රබන්ධයක් බව ථෙරවාදය ගරු කරන පිරිස් අදහති. කොයිහැටි වෙතත් දැනට ශ්‍රී ලංකාව තුළ මෙකී සූත්‍ර ධර්මය පිළිබඳව පුදුමාකාර උනන්දුවක් හටගෙන ඇත.

සද්ධර්ම පුණ්ඩරීකය පිළිබඳ ඓතිහාසික පුරවෘත්තය වසර දෙදහසකට වඩා පැරණිය. ආසියාවේ තැන තැන ඇවිදිමින් කැරලි ගැසූ රෞෂි ගෝත්‍රිකයන්ගෙන් කුෂාන් රජ පෙළපත ආරම්භ විය. කුෂාන් රාජවංශයට අයත් කණිෂ්ක රජු ක්‍රිස්තු පූර්ව පළමුවන සියවසෙහිදී මධ්‍යම හා දකුණු ආසියාවෙහි සැලකිය යුතු බිම් ප්‍රමාණයක් අත්කරගෙන අධිරාජයෙක් බවට පත්විය.

කණිෂ්ක රජු බෞද්ධයකු විය. හේ තම රාජධානියේ වැදගත් ස්ථානයන්හි බුදුපිළිම නිර්මාණය කර සැදැහැවතුන්ගේ වන්දනාමානයට ඉඩ සැලසීය. කණිෂ්කයන් විසින් තැනවූ බුද්ධ ප්‍රතිමාවන් තුළින් ගාන්ධාර හා මථුරා යන සම්ප්‍රදායන් දෙකෙහිම ලක්‍ෂණ නිරූපණය විය. ගාන්ධාර සම්ප්‍රදාය ග්‍රීසියෙන් පැමිණියකි. ක්‍රිස්තු පූර්ව පළමු සියවස වන විට හින්දු කෝවිල් බහුතරකයක් ඉදිකරනු ලැබුවේ මථුරා සම්ප්‍රදායට අනුරූපවය. කණිෂ්ක රජුගේ අනුග්‍රහයෙන් බාමියන් මිටියාවතේ යෝධ බුදුපිළිම ඉදිකරනු ලැබීය. තලේබාන් ත්‍රස්තයන් විසින් විනාශ කරන තෙක්ම බාමියන් බුදුපිළිම බුදුන්වහන්සේගේ රුව රැගත් පැරණිතම මතක සටහන් ලෙස ගෞරවාදරයට පාත්‍ර විය.

නිර්මල බුදුදහම සොයාගෙන එය ග්‍රන්ථාරූඪ කිරීමේ අභිප්‍රායකින් කණිෂ්ක රජු නිරන්තරයෙන් පසු විය. හේ නිර්මල බුදුදහම දත් අයකු සොයමින් තම

රාජධානියේ අස්සක් මුල්ලක් නෑර අඬබෙර යැවීය. ඒ වන විට නිර්මල බුදුදහම දඹදිව් තලයෙන් අතුගෑවී ගොසිනි. කෙසේ නමුත් නාලන්දා විශ්වවිද්‍යාලයෙන් බුදුදහම උගත් නාගර්ජුණ නම් බ්‍රාහ්මණයා කණිෂ්ක රජු වෙත පැමිණ තමන් සතුව නිර්මල බුදුදහම ඇතැයි කීය. රජුද ඔහුගේ බස පිළිගෙන ධර්ම සංගායනාවක් කිරීමට සියලු කටයුතු සූදානම් කළේය.

ඒ ක්‍රිස්තු පූර්ව 72 වන වර්ෂයයි. ධර්ම සංගායන මණ්ඩපය තුළදී සිදුවූයේ රැස්ව සිටියවුන් කිසිසේත් අපේක්ෂා නොකළ දෙයකි. නාගර්ජුන පඬිවරයා මුල් බුදු දහම ප්‍රතික්ෂේප කරමින් සංස්කෘත භාෂාවෙන් ලියැවුණු ග්‍රන්ථයක් මුලින්ම කියැවීය. සසර දුක නිවන එකම මඟ බුද්ධත්වය ලැබීම බව ඒ දීර්ඝ පුස්තකයේ හරය විය. නියම නිවන් මඟ මහායානය හෙවත් සම්මාසම්බුද්ධ යානය බව නාගර්ජුන පුන පුනා කීය.

සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ලෙස නම් කළ ඒ කෘතියෙහි අමිතාභය බුදුන්වහන්සේ ගැනත් සුඛාවතිය ගැනත් බෝසත්වරුන් ගැනත් විස්තර ඇතුළත් විය. තමන් නාග ලෝකයට ඍද්ධි බලයෙන් ගොස් ඒ අමුතු පොත ඉල්ලාගෙන ආ බව නාගර්ජුන කීය. නාලන්දා විශ්වවිද්‍යාලයෙන් බුදුදහම උගත් අර්ජුණ පඬිවරයා නාගර්ජුන ලෙස හඳුන්වන ලද්දේද ඔහු නිතර නාගලෝකය ගැන කතාබහ කළ නිසාය. කණිෂ්ක රජු නාගර්ජුනගේ ඉගැන්වීම් නොපැකිළ විශ්වාස කළේය. හේ මහායාන ඉගැන්වීම් ප්‍රචාරයට මූලික දායකත්වය ලබා දුන්නේය.

සද්ධර්ම පුණ්ඩරීකයෙන් ඇරඹි මහායානය කෙටිකලක් තුළ ඉන්දියානු භූමියේද නැඟෙනහිරෙන්

චීනයේද බටහිරෙන් රුසියාවේද ජනප්‍රිය විය. මහායානය ව්‍යාප්ත කිරීමට වැඩිම දායකත්වය ලබාදුන්නේ මහායාන භික්ෂුවක් වන කුමාරජීව විසිනි. මුලින් ථෙරවාදියකු වූ කුමාරජීව පසුකලෙක මහායානය වැලඳගත්තේය.

බුදුන්වහන්සේ ධර්ම ප්‍රචාරය කළ වපසරිය ඉක්මවීමට අශෝක රජුට හැකිවිය. අශෝක රජු කළ ධර්ම ප්‍රචාරයට වඩා වැඩි ස්ථාවරභාවයක් කුමාරජීවගේ ප්‍රයත්නය නිසා හටගත්තේය. කුමාරජීව සිය රාජකීය පවුල් පසුබිම හේතුවෙන් පහසුවෙන්ම බුදුදහමට රාජ්‍ය අනුග්‍රහය ලබාගත්තේය. ථෙරවාදීන් සුළුතරයක් බවට පත්වීමට එයත් එක් හේතුවක් විය. මහායානය බිහිවී වසර අටසීයක් පමණ ඉක්ම ගිය කල්හි වජ්‍රයාන ගුරුවරුන්ගේ මතවාද හිස එසවීමට පටන් ගත්තේය. ක්‍රිස්තු වර්ෂ 12 වන සියවසේ දී සිදුවූ මෝගල් ආක්‍රමණයන් හේතුවෙන් ඉන්දීයාවේ මහායානයද වජ්‍රයානයද අතුගෑවී ගියේය.

එනමුත් මහායානිකයන් විසින් හෙළිකළ අමිතාභය බුදුන්ගේ කීර්තිනාමය නොනැවතීම වර්ධනය විය. ක්‍රිස්තු වර්ෂ 13 වන සියවසෙහිදී ජපානයේ නිචිරෙන් නමැත්තා අමිතාභය බුද්ධ වන්දනාව ප්‍රචලිත කිරීමට උත්සාහ කළේය ඒ උත්සාහයට විරුද්ධ පිරිස්වල බලපෑමෙන් ජපන් රජය නිචිරෙන් මරන්නට විවිධ උපක්‍රම යෙදීය. කිසියම් අද්භූත බලයක් හේතුවෙන් කිසිවකුට නිචිරෙන් මරණයට පත් කළ නොහැකි විය.

අමිතාභය බුදුන් පිළිබඳවද සුඛාවතී ලෝකය පිළිබඳවද බෝධිසත්ව චර්යාව පිළිබඳවද විස්තර ඇති සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය අදටත් ලෝකයේ ජනප්‍රියතම ග්‍රන්ථයකි. එය ලෝටස් සූත්‍ර යන නමින් යුරෝපයෙහි හා ඇමෙරිකාවෙහි ප්‍රසිද්ධියට පත්ව ඇත.

එනමුත් එලෙස ප්‍රසිද්ධියට පත්වූයේ නියම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය නොව නාගර්ජුණගේ ප්‍රබන්ධයක් බව මේ වන විට හෙළි වී අවසන්ය. දැන් අපි නියම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කථාව ගැන විමසා බලමු. ඒ කතාව ඇත්තෙන්ම රසවත්ය. න්‍යායානුකූලය. තර්කානුකූලය.

සෑම බුදුවරයෙක්ම බුදු වී සත්දිනකින් මව මියයයි. එලෙස මියගොස් තුසිත දෙව්ලොව උපදින මාතෘ දිව්‍යරාජයා ප්‍රමුඛ දිව්‍ය පිරිසට බණ කීමට දෙව් ලොව වැඩීමට බුදුන්වහන්සේට සිදුවෙයි. මෙය සෑම බුදුවරයකු විසින්ම කරනු ලබන සද් කාර්යයකි. බුදුන්, දෙවිවරුන්ට මංගල ධර්ම දේශනයේදී සුදු නෙළුමක් උපමා කර සිය ඉගැන්වීම් පෙළගස්වයි.

ඉන්දියාවෙහි සුදුපාට විශාල නෙළුම් වර්ගයක් ඇත. ඒවා බලන්න ලස්සනය. පාලි භාෂාවෙන්ද සංස්කෘත භාෂාවෙන්ද පුණ්ඩරීක යන යෙදුම ඒ නෙළුමට යෙදෙයි.

"මඩෙහි වැටුණු නෙළුම් ඇටයෙන් නෙළුම් පැළයක් තැනී එය නෙළුම් පඳුරක් බවට පත්වී නටුව ආධාරයෙන් නෙළුම් පොහොට්ටුව මඩෙන් ඉහළට එසවෙයි. ඉන් අනතුරුව නියමිත පරිදි මෝරා විශාල වූ නෙළුම් පොහොට්ටුව සුවඳ හමන නෙළුමක් බවට පත් වෙයි."

"සංසාරය මඩ ගොහොරුවකි. බෝධිසත්වයා නෙළුම් පොහොට්වුවක් වැනිය. දුක වැඩි සැප අඩු සංසාරයේ උපන් බෝධිසත්වයා සසර දුකම ආධාරකයක් ලෙස උපයෝගි කරගෙන සසර සයුර තරණය කළ යුතුය. නෙළුම මඩ ගොහොරුවෙන් සාරය ඇදගන්නාක් සේම සසර දුකම සසරෙන් මිදීමට පාඩම කරගත යුත්තේය."

"නටුව මඩෙන් පිටතට දිගුවන තෙක් නෙළුම් මල නොපිපෙන්නාක් සේම දසපාරමීදම් සපිරෙන තුරු බෝධිසත්වයකු බුද්ධත්වයට පත් නොවේ. බුද්ධත්වයට පත් වූ උතුමෝ නෙළුම් මලක් දසතට සුවඳ විහිදවන්නාක් මෙන් ගුණ සුවඳින් සක්වළ බබළවති. අවසානයේ නෙළුම් මල පරව ගොස් ඵලය ඉතිරිවන්නාක් සේම සුවාසූදහසක් ධර්මස්කන්ධය ඉතිරි කර ලෝක ධර්මයට ඉඩ දෙමින් බුදුවරු පිරිනිවනට සැපත්වෙති."

සෑම බුදුවරයකු විසින්ම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර දේශනාව කරනු ලබන්නේ නම් එය සූත්‍ර පිටකයේ නොමැත්තේ ඇයිද යන ප්‍රශ්නය කෙනෙකුට ඇතිවීම සාධාරණය. ඊට ලබා දිය යුතු පිළිතුර තර්කානුකූල හා ඉතා දීර්ඝ එකකි.

අනන්ත සක්වළ ලෝකධාතුන් පිළිබඳ විස්තරයක්ද වෙනත් ලෝකධාතුන්හි වැඩවසන බුදුවරුන් හා බෝසත්වරුන් පිළිබඳ විස්තරයක්ද සැබෑ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයට ඇතුළත් වෙයි. ලෝකධාතු විස්තරය හැරුණුකොට ධර්මාවබෝධයට අවශ්‍ය ප්‍රධාන ධර්ම කොට්ඨාසයන්ද නියම ධර්මයෙන් සද්ධර්ම ප්‍රතිරූපකයන් වෙන්කර හඳුනාගන්නා අන්දමද සද්ධර්ම පුණ්ඩරීක සූත්‍ර දේශනාවට ඇතුළත් වෙයි.

මෙවැනි සූත්‍රයක් සෑම බුදුවරයකුගේම දේශනා අතර තිබිය යුතු බව නුවණැතියන්ට වැටහෙනු ඇත. නැතිනම් පශ්චිම කාලයේ උපදින මිනිස්සු බුදුමඟ කියා නොමඟ යති. නිවනට මඟයයි සිතා අපායට යන මග යති. එබැවින් සැබෑ බුදුමඟ තෝරා දෙන සූත්‍ර ධර්මයක් අත්‍යවශ්‍ය වේ.

එනමුත් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය කල්තබා කීමෙන් අනිටු විපාක හටගත හැකිය. එබැවින් සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය කීමේදී බුදුවරු උපාය කෞශල්‍යය භාවිත කරති. ඒ මෙසේය. බොහෝ ආයුෂ විඳින මිනිසුන් වෙසෙන කාලයක බුදුවරයකු පහළ වුවහොත් පාරමී දම් සපිරි සත්වයන් බොහෝ ගණනකට ඒ බුදුවරයාගේ ජීවිත කාලය තුළ ඒ බුදුන් යටතේම ශික්ෂණය ලබා මාර්ගඵලාවබෝධයට පැමිණිය හැකිය. එබඳු බුද්ධ ශාසනයන් බුදුවරයාගේ පිරිනිවනත් සමඟම අභාවයට යාම ඇරඹෙයි.

එනමුත් කෙටි ආයුෂ ඇති මිනිසුන් වෙසෙන කාලයක් තුළ බුදුවරයකු පහළ වුවහොත් බුදුවරයාගේ ජීවිත කාලය තුළ පින් සපිරි සියලු සත්වයන්ට බුදුවරයා වෙත ප්‍රවේශ වීමට නොහැකි වේ. එවන් විටකදී බුදුවරයා තම තම ශාසනය ඉදිරියේ කෙතරම් කල් පවතීද යන්න ගණනය කර ඉන් හරි අඩක් කල් ගිය පසු සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මිනිසුන්ට ඇසෙන යාන්ත්‍රණයක් සකස් කරනු ලැබෙයි.

නියම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය හරි ආශ්චර්ය අද්භූත දෙයකි. අප කලිනුත් මතක් කළ පරිදි කෙටි ආයුෂ ඇති බුදුවරයකුගේ ශාසනයක් පවතින විට මිනිසුන්ට සද්ධර්ම පුණ්ඩරීකය අසන්නට ලැබෙනුයේ ශාසනයේ ආයුෂයෙන් අඩක් ඉකුත්වීමත් සමඟය. දැන් එය ඇසිය යුතු කාලයයි. එය අසන්නට සැලැස්වීමේ අරමුණ බොරු බේගල් ඉවත ලා පිරිසිදු බුදුමඟ නැවත පිහිටුවීමයි.

සැබෑ සද්ධර්ම පුණ්ඩරීකය එක් අතකින් ශාන්තිකර්මයක් වැනිය. දුසිල් මහණෝ සද්ධර්ම පුණ්ඩරීකයේ බලයෙන් සිවුරු හැර යති. මේ අතර සැබෑ

සද්ධර්ම පුණ්ඩරීකයේ බලයෙන් මිනිසුන්ට මගපල ලැබීමේ උනන්දුවක් ඇතිවෙයි. අවසානයේ රහතන් වහන්සේලා පහළ වන තෙක්ම බුදුසසුන ශීඝ්‍රයෙන් නැවත සකස් වෙයි. රහතන් වහන්සේලාගේ යුගය යළි පහළ වූ කල්හි දැහැමි පාලකයෙක් මහා ධර්ම සංගායනාවක් කරවයි. මහා ධර්ම සංගායනාවෙන් බුදුදහමේ වෙන්ව තිබූ ශාඛා යළි එක්වෙයි. ඒ හේතුවෙන් ශාසනය විනය අතින්ද පිරිසිදු වෙයි. ධර්මය අතින්ද පිරිසිදු වෙයි.

කෙටි ආයුෂ ඇති කාලවල පහළ වන බුදුවරුන්ගේ ශාසනයන්හි සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ශාසනයෙන් අඩක් කල් ඉකුත් වූ තැන හෙළිවීමට හේතු කිහිපයකි. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයෙහි පිටසක්වළ බුද්ධ භූමි ගැනද අභිංඥාලාභී බෝසත්වරුන් ගැනද දීර්ඝ විස්තර ඇතුළත්ය. කෙටි ආයුෂ ඇති කාලයක පහළ වන බුදුවරයකු සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කළහොත් බුද්ධ ශ්‍රාවකයෝ විදසුන් වැඩීම පසෙක තබා ඍද්ධි බල වඩති. එලෙස ඍද්ධි බල වඩා සුඛාවතියට ගොස් සතියක් කල් ගත කළොත් මෙලොව කාලයෙන් වර්ෂ දෙසීයක් කල් ඉකුත් වෙයි. එහි ගොස් සතියක් කල් සිට ආපසු මෙහි එන විට දන්නා හඳුනන කිසිවකු මෙලොව සිටිනු නොමැත. එයින් සිදුවනුයේ පිරිමැසිය නොහැකි අන්තරායකි.

මට දැනෙන පරිදි මේ කියන අපූරු වෙනස දැන් දැන් සිදුවෙමින් තිබේ. බුදු සසුන නැවත නැඟී සිටින කතාවන් එහෙන් මෙහෙන් ඇහෙන්නට පටන්ගෙන තිබේ. සද්ධර්ම පුණ්ඩරීකය ගැන මිනිසුන් වැඩි වැඩියෙන් කතා කරන්නට පටන්ගෙන තිබේ. බුදුදහමට අනුව රට කරවන කාලයක් එන බව කනින් කොණින් ඇසෙන්නට පටන්ගෙන තිබේ.

දවසක් හරි අමුතු දුරකථන ඇමතුමක් මට ලැබුණි. ඒ දුරකථන ඇමතුම ලබා දුන්නේ කවුදැයි තවම නොදනිමි.

"මම මේ කියන්නෙ මගේම අදහසක් නොවේ. මට ඉන්නව බොහෝම උසස් අභිඥා බලය තියෙන භාවනා ගුරුවරයෙක්. එයා කියනවා මේ බුද්ධ ශාසනය නිවැරදි මඟට යොමු කරන්නෙ දියසේන කුමාරයලු. එයා දැන් ලංකාවෙ පහළ වෙලා කියලයි මගේ ගුරුතුමා කියන්නෙ. ඉතින් තව ටික දවසකින් එයා වැඩට බහීවි. ඔහේගෙ ඔය බෝධිසත්ව කතාවල් පිටසක්වළ බුදුවරුන් ගැන කියන දේවල් දියසේනගෙ ගමනට බාධාවක්. එයාට ඉදිරියට ඒමට බාධාවක්. නිසා ඔහේ බණපොත් ලියන එක මෙයින් නවතන්න ඕන."

ඒ කතාව අසා සිටි මගේ රතුකට්ට පැන්නේය. මමද දරුණු වාග් ප්‍රහාරයක් ආරම්භ කළෙමි.

"ඔහේ දියසේන කෙනෙක් ගැන කිය කිය පාරම්බෑවට එයා හම්බවෙල දැකල තියෙනවද?"

"නෑ එයා තවම අප්‍රසිද්ධ වේශයෙන් ඉන්නෙ."

ප්‍රතිවාදියාගෙන් අතහැරෙන වචනයක් ගෙන ඔහුටම දමා ගැසීම වාද විවාදයන්හි දිනුමට යොදාගත හැකි කදිම ක්‍රමයකි. මම ඔහුගේම වචන ඔහුට එරෙහිව භාවිත කළෙමි.

"ඔන්න ඔතනැයි ඔහේ කියන දියසේනගෙ වැරැද්ද. දැන් බලනව ලංකාවෙ බෞද්ධයන් කොපමණ ඉන්නවද කියල හරියට කීවොත් දෙදහස් එකොළහේදී සීයට හැත්තෑවයි. අන්‍යාගමිකයන්ගේ ජනගහන වර්ධන වේගය ගණනය කළොත් තවත් අවුරුදු පනහකට මෙපිටදී

බෞද්ධයන් සුළුතරය බවට පත්වෙනවා. දැනටමත් බෞද්ධයන් පාට පාට කණ්ඩායම් හදාගෙන භේද භින්න වෙලයි ඉන්නෙ. දියසේනට අද ආවත් පනින්න වෙන්නෙ දැන් තියෙන මඩ වළටම තමයි. තව අවුරුදු කීපයක් ප්‍රමාද වුණොත් දියසේනට සිද්ධ වෙන්නෙ අසාර්ථක උත්සාහයක් කරල නිකං සවුත්තු වෙලා යන්න."

අමුත්තා මා කී කථාවට සවන් දෙන අතර පණ්ඩිත කතා කියමින් බාධා කරන්නට විය. මම දූරකථනය විසන්ධි කළෙමි.

බෝසත්වරුන් හා බුදුවරුන් ගැන ලියන අතර දියසේනයන් ගැන නොලිවීම අඩුවක් ලෙස සැලකිය හැකිය. ලංකාවේ පහළ වන දියසේන කෙනෙකු ගැන මූලික සූත්‍රයන්හි හෝ අට්ඨකථාවන්හි විස්තර නොදැක්වේ. අඩුම තරමේ ලංකාව නම් වූ දිවයින ගැනවත් මූලික සූත්‍රවල සඳහන් නොවේ.

දියසේන ගැන මුල්ම විස්තර හමුවන්නේ කෝට්ටේ යුගයේ ලියැවුණු පැරකුම්බා සිරිත නම් කව් පොතෙනි. පැරකුම් රජු බුදුවසින් දෙදහස් පන්සියක් ඉක්ම ගිය තැන්හි දියසේන නමින් ලක්දිව ඉපිදෙන බව එහි දැක්වෙයි. එහි තවදුරටත් සඳහන් වන පරිදි දියසේනගේ ආගමනය පිළිබඳ රහස හෙළි කර ඇත්තේ සමන් දෙවියන් විසිනි.

දියසේන පුරාවෘත්තය පැරකුම්බා සිරිතට වඩා තරමක් පැරණි බව විපරම් කළහොත් දැනගත හැකිය. සුමන සූත්‍රය යනුවෙන් නම් කර ඇති අප්‍රසිද්ධ තල්පතක් ඇත. දියසේනයන්ගේ පුරාවෘත්තය ඇතුළත් මුල්ම කෘතිය සුමන සූත්‍රයයි. බුදුන්වහන්සේ ලක්දිවට වැඩම කළ අවස්ථාවකදී සමනොල කන්දට අධිගෘහිත සුමන සමන් දෙවියෝ බුදුන් බැහැදැකීමට පැමිණියහ. ලක්දිව

පන්දහස් කල් බුදුසසුන පවතින බවත් වසර දෙදහස් පන්සියක් ඉක්ම ගිය පසු දියසේන නමැති බෞද්ධ නායකයකු ඉපිද බුදුදහමට විශාල සේවයක් කරන බවත් එකල්හි බුදුන්වහන්සේ දේශනා කළහ. සුමන සූත්‍රයේ එවැන්නක් සඳහන් වුවත් එවැන්නක් ත්‍රිපිටකයේ සඳහන්ව නැත.

මෙරට දැනට හටගෙන ඇති දේශපාලන අස්ථාවරභාවය හේතුකොටගෙන දියසේන සංකල්පය නැවත උඩට මතුවෙමින් පවතින අයුරු දැකගත හැකිය. අද සිංහල බෞද්ධයන්ට ඔවුන්ගේ යැයි කිවහැකි නායකයෙක් නැත. බෞද්ධයන්ගේ අයිතිවාසිකම් ගැන බය සැක නැතිව කතා කරන්න කෙනෙකුද නැත. බෞද්ධයන්ට එරෙහිව අතෝරක් නැතිව කෙණෙහිලිකම් කෙරෙද්දී හීන් කෙඳිරියක්වත් නැඟීමටවත් පිටකොන්දක් ඇත බෞද්ධයකු ක්‍රියාකාරී දේශපාලනය තුළ නැත.

අවස්ථාවාදී බෙදුම්වාදීහු ඔවුන්ගේ ඕනෑ එපාකම් වෙනුවෙන් මහජාතියේ දේශපාලන නායකයන් සිහි මුළා කරවන්නට සමත්ව සිටිති.

අද අපේ රටේ පුරවැසියන්ද හිට්ලර්ගේ වදකඳවුරුවලට හසුවූ යුදෙව්වන්ට සමාන කළ හැකිය. කවුරුන් හෝ නායකයකු හදිසියේ ඉදිරියට පැමිණ මේ රට බේරාගනු ඇතැයි ඔවුහු බලාපොරොත්තු වෙති. එහෙත්, ඒ බලාපොරොත්තුව ඉටු නොවන බවද ඔවුහු හොඳාකාරව දනිති. එම මානසිකත්වය ෆෝල්ස් හෝප් සින්ඩ්‍රෝම් (False Hope Syndrome) යන මනෝව්‍යාධියට කිට්ටු තත්ත්වයකි.

දියසේන චරිතය රඟපාන දේශපාලන නායකයකු මෙරටට පහළ වන්නේ නම් කදිමය. එනමුත් ඔය

කියන කිසිම දියසේන කෙනෙකුට හදිසියේ තනිවම ඉදිරියට පැන විජ්ජාවක් පෙන්නා වත්මන් දේශපාලන මඩගොහොරුව වියළා දැමීමට නොහැක්කේය. මේ විදියට වැඩ කෙරුණොත් තව අවුරුදු විස්සකින් නැතහොත් තිහකින් මුහුදට පැන දිවිනසා ගැනීම හැර බෞද්ධයන්ට වෙනත් විකල්පයක් නොමැත. ඒ පරම සත්‍යය අප විසින් හදවතට එකඟව වටහාගත යුත්තේය. දියසේනයන් එකෙකු නොව, දහස් ගණනක් වහාම ඉදිරියට පැමිණ බුදුදහම බේරාගත යුත්තේය.

# 05

## ගණන්කාර බෝධිසත්වයෙක්

ඔබ ඕනෑතරම් ගණන්කාරයන් ගැන අසා ඇතුවාට සැක නැත. හැම ගණන්කාරයෙක්ම කවුරුන් හෝ දේශපාලන නායකයකුගේ සුවච කීකරු සුරතලෙක් වෙයි. ඒ අපේ රටේ ගණන්කාරයන්ගේ හැටිය. ටිබෙට් බුදු දහමේ කියවෙන බෝසත්වරුන් අතර අහිංසකයෝ මෙන්ම ගණන්කාරයෝද වෙති. ඒ ගණන්කාර බෝසත්වරු විශ්වයේ අසාධාරණ බලවේගවලට එරෙහිව නොබියව ක්‍රියාකිරීම ගැන ප්‍රසිද්ධියක් උසුලති.

ටිබෙට් බුදුදහමේ ධ්‍යානි බුදුවරුන්වහන්සේලා පස්නමක් වෙති. බුද්ධ නමින් ආමන්ත්‍රණය කළද ධ්‍යානි බුදුවරුන් අතර බුදුවරු මෙන්ම බෝසත්වරුද වෙති. ඒ සැම දෙනම අතර චණ්ඩිකමින් පළමුවෙනියා වජ්‍රසත්ව නම් වෙයි. වජ්‍රසත්වයන් පෙනුමෙන් උපශාන්තය. බුදුවරයකු වැඩ සිටින අයුරින්ම බද්ධ පර්යංකයෙන් වැඩ සිටින සෙයක් වජ්‍රසත්ව පිළිමයන්හි දක්නට ඇත. එනමුත් වජ්‍රසත්වයෝ නිර්භීතකමෙහි අගතැන්පත්ව සිටිති. ධර්මයෙහි හැසිරෙන්නන්ට බුදුමග යන්නන්ට වජ්‍රසත්වයන්ගෙන් අනතුරක් නැත. වජ්‍රසත්වයෝ ධර්මයේ

හැසිරෙන අයට පුළු පුළුවන් හැටියට උදව් කරති. එනමුත් බුදුමඟට අවකපන මාරසෙනඟට වජ්‍රසත්වයන්ගෙන් සමාවක් නම් නැත. මාරයෝ වජ්‍රසත්වයන්ගේ නම ඇසූ පමණින් හිස් ලූ ලූ අත පලා යති.

වජ්‍රසත්වයගේ ගැන කතා කිරීමට බොහෝ දේ ඇත. එක පොතක් නොව, පොත් පෙළක් වුවද ලියන්නට කරුණු ඇත. එනමුත් ඈත විශ්වයේ සිට අප දෙස කුලුණු නෙතින් බලන ඒ මහා යෝගියා පිළිබඳ ඓතිහාසික තොරතුරු ගැන මුලින්ම දැනුවත්ව සිටීම ප්‍රයෝජනවත්ය.

හීනයානිකයන් හා මහායානිකයන් යනුවෙන් බෞද්ධයන් දෙකොටසකට බෙදෙන බව අපේ රටෙහි පොදු පිළිගැනීමක් ඇත. වජ්‍රසත්ව ගැන මුල්ම තොරතුරු හමුවන්නේ මහායානිකයන්ට අයත් වජ්‍රසේකර සූත්‍රයෙනි. චීන බෞද්ධයන් ක්‍රිස්තු පූර්ව පළමු සියවසේ සිටම වජ්‍රසත්වයන්ට වන්දනා මාන කළ බවට සාධක ඇත.

හීනයානිකයන් හා මහායානිකයන්ට අමතරව වජ්‍රයාන නමින් හැඳින්වෙන බෞද්ධ සම්ප්‍රදායයන් කිහිපයක්ම ඇත. වජ්‍රයානයේ ප්‍රධාන ශාඛා හා උපශාඛා දොළසකි. මූලික බුදු දහමෙහි ප්‍රධානතම වටිනාකම් වන නිවන, කර්මවාදය හා පුනර්භවය පිළිබඳ ඉගැන්වීම් වජ්‍රයානිකයෝ එලෙසම පිළිගනිති. එනමුත් වජ්‍රයාන සම්ප්‍රදායන් හීනයාන සම්ප්‍රදායන්ගෙන් පැහැදිලිව වෙනස් වෙයි.

මහායෝගී මිලාරෙපා විසින් විස්තර කර ඇති පරිදි හීනයානය හා වජ්‍රයානය වෙන් කරන පැහැදිලි බෙදුම් රේඛාවක් ඇත. හීනයානිකයෝ තමන් පමණක් සසරෙන් එතෙර වීමේ ප්‍රතිපදාවක් පිළිගනිති. මහායානිකයෝ

බුදු බව පතා යමින් නිවන් මඟ අතපසු කරති. වජ්‍රයාන මාවත එවැන්නක් නොවේ. වජ්‍රයානය අනුගමනය කරන පුද්ගලයා තමනුත් සසරෙන් එතෙර වී අනුන්ද එතෙර කරවීමේ දැවැන්ත පරිශ්‍රමයක නිරත වෙයි. මිලාරෙපාතුමා විසින් කියා ඇති පරිදි එකී හේතුව නිසා වජ්‍රයානය හීනයානයට වඩා ශ්‍රේෂ්ඨය. සත්තකින්ම වජ්‍රයාන ඉගැන්වීම් නව ථේරවාදයට වඩා බුද්ධ දේශනයට සමීප වෙයි.

මහායාන, හීනයාන හා වජ්‍රයාන මහා සම්ප්‍රදායන් තුනට අතිරේකව මන්ත්‍රයාන හා තන්ත්‍රයාන යනුවෙන්ද ශාඛා කිහිපයක් බුදු සමය තුළින් පසුකාලීනව පැන නැංගේය. මන්ත්‍රයානය හා තන්ත්‍රයානය බිහිවීමට මූලික හේතුව වූයේ වේදය දත් බමුණන් විසින් බෞද්ධ ඉගැන්වීම් ඔවුන්ගේ දැනුම සමඟ බද්ධ කිරීමයි. මන්ත්‍රයාන තන්ත්‍රයාන හා වජ්‍රයාන සම්ප්‍රදායවල රහස් ඉගැන්වීම් ඇති නිසා ඒවා ගුප්ත බුදුසමය (Esoteric Buddhism) ලෙස වර්ග කර ඇති අයුරු දක්නට හැකිය.

පෙරකී මහායාන, වජ්‍රයාන, තන්ත්‍රයාන හා මන්ත්‍රයාන යන සම්ප්‍රදායන් හතරටම වජ්‍රසත්ව යනු නැතිවම බැරි චරිතයකි. සිංහල වෙදකමට අරළු, බුළු, නෙල්ලි හා රසකිඳ නැතිවම බැරිවා සේම අමිතාභය බුදුන්වහන්සේ, අක්ෂෝභ්‍ය බෝධිසත්වයන් වහන්සේ, සමන්තභද්‍ර මුනිවරයා සහ වජ්‍රසත්ව බෝධිසත්වයන් වහන්සේ ගුප්ත බුදු සමයේ නැතිවම බැරි වීරයෝ වෙති.

ටිබෙට් බුදු දහමෙහි ඉගැන්වෙන පරිදි වජ්‍රසත්ව බෝධිසත්වයා විමලා නම් මනුෂ්‍ය ලෝකයේ වාසය කරන්නෙකි. බුද්ධ චීවරයට සමාන ඇඳුමක් ඇඟලාගෙන සිටින වජ්‍රසත්වයන්ගේ දකුණතෙහි වජ්‍රායුධයකි. වමතෙහි

සීනුවකි. විමලා ලෝකය පෘථිවියේ සිට දුරින් තුන්වැනියට ඇති මනුෂ්‍ය ලෝකයයි. විමලාවෙහි වැසියෝ හොඳ බෞද්ධයෝ වෙති. ඔවුහු බොදු සිරිත් අකුරට ඉටුකරති. නමුත් ඈත විශ්වයේ සිට එන අණක් ගුණක් නොදත් අලුකුත්තේරු අසමජ්ජාති පිටසක්වළ ජීවීන්ට එරෙහිව භයානක යුද සටන්වල නියැළෙති.

විශ්වය හරි අවදානම් තැනකි. අනන්ත අවකාශයේ කොයි දිශාවට ගමන් කළත් හිස් අවකාශයේ කෙළවරක් නැත. කෙළවරක් නැති හිස් අවකාශයේ තැනින් තැන සූර්යග්‍රහ මණ්ඩල පිහිටා ඇත. එයින් කවර හෝ තැනක ද්‍රව ජලය ඇත්නම් ජීවය තැනීමට අවශ්‍ය අනෙක් සියලු සාධක බාහිර පරිසරය විසින් සපුරා දෙනු ලැබෙයි. ජීවයේ සම්භවයට අවශ්‍ය සාධක ඇති කල්හි ජීවය බිහිවීම කිසිදු සර්වබලධාරියකුගේ මැදිහත් වීමකින් තොරව සිදුවන්නකි.

එක් සක්වළක් විනාශ වෙමින් පවතින්නේ යයි සිතමු. එකල්හි අර කියන ජලය සහිත ජීවයට සුදුසු ලෝකධාතුව (Habitable Planet) සජීවී සක්වළක් බවට පත්කරමින් හිමි හිමිහිට එහි ජීවය බිහි වෙයි. අපායගත සත්වයන් සක්වළ විනාශයේදී හුවමාරු වීම නිසාද ලෝකාන්තරික නිරයෙන් නිදහස් වීම නිසාද අලුත් සක්වළ සත්වයන්ගෙන් අනුක්‍රමයෙන් පිරීම ඇරඹෙයි.

ලෝකාන්තරික නිරයෙන් නිදහස් වන සත්වයන්ගේ කර්ම ශේෂය ශූන්‍ය වේ. ඔවුහු අලුත් සත්වයන් ලෙස අලුත් සක්වළ උපදිති. අපාය අතර මාරු කෙරෙන සත්වයෝ අලුත් සක්වළ අලුත් අපායන්හි සංචිත කර්ම සහිතව උපදිති. මේ අතර ලෝක විනාශයට හසු නොවූ ඉහළ බ්‍රහ්ම තලයන්හි සිටින සත්වයෝ ආයුෂ ගෙවෙන

පිළිවෙළට හා කුසල හා අකුසල සංචිත කර්ම සහිතව අලුත් සක්වළ ඒ ඒ තලයේ උත්පත්තිය ලබති.

කුමන හෝ සක්වළක ජීවය ආරම්භ වූ තැන් පටන් ආකාශචාරී පිටසක්වළ ජීවීහු ඒ අලුත් සක්වළ ගැන විමසිල්ලෙන් සිටිති. සමහරු අතිනවීන යානාවල නැඟී පිටසක්වළ විනෝද චාරිකාවෙහි යති. වඩාත් දියුණු ජීවීන් සක්වළ තරණය කරනුයේ කාලතරණ නම් මූලධර්මයක් ඇසුරු කොටගෙනය. එසේත් නැතහොත් මාන අතර මාරුවීමේ ක්‍රම උපයෝගී කරගෙනය. කාලතරණය (Time travelling) කරන ජීවීහු කය එක තැනක තබා සූක්ෂ්ම කයකින් විශ්වයේ කැමති තැනකට යති. හරියටම කිවහොත් එය ගමන් කිරීමක් නොවේ. තමන්ගේ කයෙහි සූක්ෂ්ම පිටපතක් පිටසක්වළට පතිත කිරීමේ ක්‍රමයකි.

කාලතරණ ක්‍රමයෙන් සක්වළ තරණය කරන ජීවියා කොන්දේසි කිහිපයකටම යටත් විය යුතුය. කාලතරණයෙහි කැමති අය තමන් ආපසු එන තෙක් තම භෞතික ආරක්ෂා කිරීමට පරිකර්ම කළ යුතුය. නැතිනම් ඔහු නැවත ආ විට කය විනාශයට පත්වී තිබෙන්නට බැරි නැත. කාලතරණයෙහි යෙදී පිටසක්වළ නැවතී සිටිය හැක්කේ සීමිත කාලයකි. පෘථිවි වාසියකුට නම් එම කාලය පෘථිවි දින හතකි. පිටසක්වළට ගිය පසු තමන්ගේ ලෝකයේ කාලයෙන් නිදහස්ව පිටසක්වළට බලපාන අයුරින් දවස් ගෙවී යයි. යමකු කාලතරණයෙහි යෙදී සුඛාවතියට ගොස් ඔවුන්ගේ කාලයෙන් සතියක් එහි සිට පැමිණියොත් මෙලොව වසර දෙසීයක් ගතවී අවසන් වෙයි. ආපසු නිවෙස් බලා එන ඔහුට තම ගම පිහිටි තැන පවා හඳුනාගන්නට නොලැබෙයි. ඔහු ශීඝ්‍රයෙන් වියපත්ව මියයයි.

අප මුලින් කතා කළ වජ්‍රසත්ව නම් බෝධිසත්වයා සූක්ෂ්ම කයින් යුතුව කාල තරණයෙහි යෙදෙන්නෙකි. වජ්‍රසත්වයන් කාලතරණය කර පිටසක්ළවල හැසිරෙනුයේ බුද්ධ ධර්මය පතුරුවා හැරීම, බුද්ධ ශාසනය ආරක්ෂා කර දීම, බෞද්ධයන්ගේ සුබසාධනය හා තවත් එක් වැදගත් කර්තව්‍යයක් වෙනුවෙනි. ඒ වැදගත් කර්තව්‍යය නම් බුදුදහමට වින කටින මාර සෙනඟ පලවා හැරීමයි. භාවනා කරන අයට මාර බලපෑමක් ඇතිවුණොත් එය සාමාන්‍ය කෙනෙකු විසින් දැන ගැනීම පහසු නොවේ. මාරයෝ කිහිප ආකාරයකින්ම බෞද්ධයන්ට එරෙහිව ක්‍රියා කරති.

පාපී මාරයෝ බුදුවරුන් හා මුනිවරයන් ලෙස පෙනී සිට බෞද්ධ ජනතාව නොමඟ යවති. සසර දුක නසන නිවන දැන දෙසනු වෙනුවට සසර දික් කරන විවිධ මාවත් පෙන්වා දෙති. ඔවුහු පුරුද්දක් ලෙස බුද්ධ ශ්‍රාවකයන්ට ආවේශ වෙති. මාරයන් ආවේශ වූ පසු තමන්ටත් නොදැනීම ඔවුන්ගේ ඇදහිලි ක්‍රම හා ගති පැවතුම් වෙනස් වෙයි. කතාව ක්‍රියාව වෙනස් වෙයි.

නිවන් දකින්නට විදසුන් වඩන කෙනෙකුට මාරයා වැහුණොත් ඔහු විදසුන් වැඩීම අත්හැර දමා විකාර පූජා විධි අනුගමනය කරන්නට පටන් ගනියි. සසර දුක නිවන කතා නවත්වා දෙව්ලොව නැවත උපදින ප්‍රතිපදාවන් පමණක් දේශනා කරන්නට පටන් ගනියි. සසරෙහි සැප ගැන කතා කරන්නට පටන් ගනියි. එතැනින්ම ඔහු බුදු මගෙහි ටිකට් කප්පවා ගනියි. ඔහු එතැන් පටන් මාරයාගේ සෙවණැල්ල යටට මිනිසුන් ගාල් කරවන ඉන්ද්‍රජාලිකයකු බවට පත් වෙයි. පාපී මාරයන්ගෙන් ඊට අපමණ සහය ලැබෙයි. පාපී මාරයෝ විකාර පූජා කරන

අයට ඇති පදම් උදව් පදව් කරති. යන එන තැන්හිදී ආරක්ෂා කරති. මාරයන්ට පක්ෂ අයට නොයෙකුත් අයථා ලාභ ලැබේ. නමුත් ඒ මාරයාගේ සිතැඟි ඉටුවන තෙක්ම පමණි.

මේ ඉතාම මෑතකදී දැනගන්නට ලැබුණු සිද්ධියකි. මා ටිකක් දන්නා හඳුනන තරුණ පහේ ස්වාමීන්වහන්සේ නමක් දුරස්ථ ආරණ්‍යයක වැඩ වාසය කළහ. උන්වහන්සේ මෙඅත්බැව්හිම නිවන් දකිනු රිසිව අනලස්ව සමථ විදර්ශනා භාවනා ප්‍රගුණ කළහ. එනමුත් කෙතෙක් භාවනා කළද මාර්ගඵලයක් ලද නොහැකි විය. මියන්මාරයේ පාවෝ භාවනා මධ්‍යස්ථානයේ දැනටමත් මාර්ගඵලලාභීන් හා රහතන් වහන්සේලා වාසය කරන බව උන්වහන්සේට දැනගන්නට ලැබුණි. තරුණ ස්වාමීන් වහන්සේ ගුරු ස්වාමීන් වහන්සේගෙන් අවසර ගෙන මියන්මාර දේශය බලා වැඩම කළහ.

මියන්මාරයේ හෙවත් බුරුම දේශයේ පාවෝහි සිට භාවනා කරද්දී උන්වහන්සේගේ සමථය හා විදර්ශනාව බොහෝ සෙයින් දියුණු විය. පෙරකල රහතන්වහන්සේලා හා ඍෂිවරුන් වැඩ සිටි තැන්වල භාවනාව ඉක්මනින් දියුණු වන බවට පිළිගැනීමක් ඇත. ලක්දිව සිතුල්පව්වද තලගුරු වෙහෙරද භාවනාවේ දියුණුව ඉක්මනින් සිදු වන තැන් දෙකකි.

පාවෝ හි සිට භාවනා කළ ලාංකේය භික්ෂූන් වහන්සේට ඉක්මනින්ම අභිඥා බල ලැබුණි. උන්වහන්සේ ස්වකීය අභිඥා බලයෙන් ලක්දිව බුදු දහමේ අනාගතය ගැන විමසා බැලූහ. උන්වහන්සේගේ දිවැසට දිස්වූයේ අදහාගත නොහැකි දෙයකි. බුදුසසුන වැනසීමේ කොන්ත්‍රාත්තුව භාරගත් වශවර්ති මාරයා

විසින් සිය අභිජාත පුත්‍රයකු ඇතුළු පිරිසක් දෙව්ලොවින් මෙලොවට එවා ඇත. ඔවුන් තම තමන්ට නියමිත රාජකාරි මේ දිනවල ජයටම කරගෙන යනු ලැබේ. මාරයාගේ දරුවන්ගේ අරමුණ බුදු සසුන භේද භින්න කර නැති ප්‍රශ්න ඇති කර සිය පියාගේ අධාර්මික අරමුණ කඩිනමින් සපුරා දීමයි. වශවර්ති මාරයා තම පුතුන්ට අමතරව තුන්සීයක පමණ අතිරේක බලඇණියක් දිවා රෑ සේවයේ යොදවා ඇත. ඔවුන් හැසිරෙන්නේ සුපුරුදු මාර වේශයෙනි. ඔවුන්ට පැවරී ඇති කාර්යය නම් බෞද්ධයන්ගේ සිත්වලට බලපෑම් කර හැකිතාක් භේදභින්න කිරීම හා මාරපාක්ෂික බලවේග සවිමත් කිරීමයි.

එබැවින් අද මෙරට ජීවත් වන බෞද්ධයන් විශේෂයෙන් ප්‍රවේසම් විය යුතුය. ඔබ බණ අසන තැන සසර දිගු කරන කතා කියන්නේද නිවන දුරස් කරන කතා කියන්නේද එතැනට මාරයාගේ බැල්ම වැටී ඇත. ඒ ගැන ආයෙත් සැකයක් නම් නැත. "වහ වහා මාර්ගඵල සංඛ්‍යාත නිවනට පැමිණීම පිණිස වැඩ කරන්න" යැයි කොතැනක හෝ කියනු ඇසේ නම් එතැන සැබෑ බුදු මඟ තිබීමට වැඩි ඉඩක් ඇත.

අප කලින් සඳහන් කළ වජ්‍රසත්වයෝ මාර්ගඵල ලබන ප්‍රතිපදාව ගැන විශේෂඥ දැනුමක් ලබා සිටිති. අසවල් ප්‍රතිපදාවෙන් මාර්ගඵල ලැබේය අසවල් ප්‍රතිපදාව සසර දිගු කරන්නේය යන තීරණය දීමට වජ්‍රසත්ව ගජ සමතෙකි. ඒ විතරක්ද නොවේ. මාර්ගඵල නොලද අයකුට නිවන් දක්නා ජාති දක්වා අපායෙහි නොවැටී සසර ගමන යාමට අවශ්‍ය උපදෙස්ද වජ්‍රසත්වයන් සතුය. මේ සියලු උපදෙස් ශතයක් හෝ අය නොකර අපට ලබා දෙන වජ්‍රසත්වයන් ලෝක බලවතා වන ඇමෙරිකාවේ

ජනාධිපතිටත් වඩා බලවතකු බව අප විසින් පැහැදිලිව තේරුම්ගත යුතුය.

ඔබ බැරි වෙලාවත් වජ්‍රසත්වයන්ට අපහාස කළහොත් කුමකින් කුමක් සිදුවේ යැයි කල්තබා කීමට මට නොහැකිය. වජ්‍රසත්වයන්ට අපහාස කරන්නන්ට එතරම්ම ඉක්මනින් කර්ම විපාක ලැබේ. මට ඒ ගැන අත්දැකීම් සමුදායක් ඇත. එබැවින් මෙතැනින් එහාට මා කියන දේ ගැන ප්‍රවේසමෙන් කරුණු සලකා බලා තේරුම් ගනු මැනවි. හේතු රහිත අසාධාරණ විවේචනයන් නොකරනු මැනවි. නොදන්නා දේ ගැන විවේචනය කර නිකරුණේ විපතෙහි වැටෙන්නට පෙර හේතු යුක්තිය සලකා බලා තීරණ ගනු මැනවි.

වජ්‍රසත්වයන්ගේ ඉගැන්වීම් කෙතරම් විවාදාත්මකද යත් මිනිස් සමාජය විසින් පිළිගත් සත්‍යයන් රැසක් දෙදරවා හැරීමට ඒවා හොඳටම ප්‍රමාණවත්ය. වජ්‍රසත්වතුමා කියන පරිදි මූලික බුදුදහමේ එන කර්මවාදය, පුනරුත්පත්තිය, නිවන වැනි සංකල්ප සැබෑම යථාර්ථයන්ය. ඒවා ටක්කෙටම හරිය. එනමුත් නිවන් මඟ පිළිබඳ මෙලොව වැසියන් සතු දැනුම අසම්පූර්ණය. දෝෂසහගතය. නොමඟ යවනසුලුය.

"කර්ම ශක්තිය කෙබඳු දෙයක්ද යත් එය දෙපිට කැපෙන කඩුවක් වැනිය. කර්මය පිළිබඳ රහස් උගත් අයකුට අනුන්ගේ කර්ම විපාක තමා වෙත ළඟා කරගත හැකිය. තමන්ගේ කර්මවිපාක අනුන් පිටින් යැවිය හැකිය. අකුසල කර්මවිපාක මගහැර කුසල කර්මවල විපාක සිත්සේ භුක්තිවිඳිය හැකිය!" දන්නා භාෂාවෙන් කියතොත් කර්ම බල ශක්ති පාලනය ප්‍රබල යෝගීන්ට පමණක් සීමා වූ භයානක අවියකි!

මෙය කිසිසේත් සිදුවිය නොහැකි දෙයක් සේ පෙනුණද වජ්‍රසත්වතුමා එවැනි දේ සිදුවන අයුරු පැහැදිලිව විස්තර කරදෙයි! "අප කරන හොඳ නරක ක්‍රියාවන්ට අනුරූපව කර්මපථ හා කර්ම රැහැන් නම් වූ දේ බිහිවෙයි. සත්ව ශරීරයෙන් බැහැර සිට සියුම් නූල් වැනි පියෙවි ඇසට නොපෙනෙන දිවැසට පමණක් විෂය වන තන්තු විශේෂයක් සත්ව ශරීරය වෙත පැමිණෙයි. ඒවා කර්ම රැහැන් හෙවත් කර්ම නාළිකා නම් වේ. සමහර කර්ම නාළිකා ශරීරය ආසන්නයෙන් අවසන් වන අතර අනෙක්වා විශේෂිත තැන්වලින් සිරුරට බැඳෙයි."

"භාවනාවෙන් සිත දියුණු කරගත් කෙනෙකුට කර්ම නාළිකා දැකබලා ගැනීමට මෙන්ම සුළු උත්සාහයකින් පසු තමන්ගේ හා අනුන්ගේ කර්ම බලය පිළිබඳ වෙනස්කම් ඇති කිරීමටද හැකිය. බලගතු දෙවියන් මිනිසුන්ට දඬුවම් කරන්නේ කර්ම රැහැන් පටලවා හෝ උපුටා දැමීමෙනි. ඊට දිව්‍යමය වාහක බලය නම් ශක්තියක් යොදවනු ලැබේ."

"භාවනාවෙන් සිත එකඟ කරන සමහරු තම පෙර ආත්ම එකක් දෙකක් හෝ කිහිපයක් දැකගැනීමට සමත් වෙති. පෙර ආත්මවල අඹුසැමියන්ව සිටි අය දැන්ද මෙලොව විවිධ නම්ගොත් ඇතිව සිටින අයුරු බාගෙවිට ඔවුන්ට වැටහී යයි. එවන් පෙර සබඳතා ගැන අනවශ්‍ය ලෙස දිගින් දිගට සොයා බැලීම බොහෝ විට සිදු වෙයි. කර්ම රේඛාව ඔස්සේ ආපසු හැරී යාම නම් භයානක ඉරණම එයින් අයත් විය හැකිය. කර්ම රේඛාව ඔස්සේ ආපසු හැරීයන බොහෝ දෙනෙක් සංසාරගත සබඳතා පසුපස ගොස් සසර සයුරෙහි නැවත නැවතත් අතරමං වෙති. ඔවුහු කර්ම රේඛා ඔස්සේ පසු ගමන් කර සුගති භූමි වෙතින් ඉවත්ව නිරයෙහි පවා උපදිති."

වජ්‍රසත්වතුමා කියන පරිදි උසස් මාර්ගඵලලාභීන් හැරුණුකොට වැඩිදෙනෙක් මරණින් මතු කිසිම වැඩකට නැති - කිසි සැපතක් නැති - මෙලෝ රහක් නැති ප්‍රේතාත්ම යක්ෂාත්ම තිරිසන් ආත්ම ආදී පහත් තලයන්හිම උපත ලබති.

"බොහෝ පින් කර ඇති අයකුට වුවත් තම කර්ම බලයට අනුරූප උසස් උත්පත්තියක් කරා යාමට වාසනාව ලැබෙනුයේ සිහි මුළා නොවී මියගියහොත් පමණි. දිව්‍ය ලෝක බ්‍රහ්මලෝක වැනි උසස් තැන්වල උපත ලබනුයේ අල්පතර සංඛ්‍යාවකි. වැඩිදෙනෙකු මෙලොව හැර යනුයේ අවසිහියෙනි."

මිනිසුන් මෙලෙස ඛේදජනක ඉරණමකට මුහුණ දෙනුයේ ඔවුන්ගේ වරදින්ද? නැත. වජ්‍රසත්වතුමා කියන පරදි වැඩිදෙනෙකුට වැඩ වරදිනුයේ එකම තැනකදීය! කුමක්ද ඒ කාට කාටත් වරදින තැන?

"අපගේ ශරීර තුළ ස්වාභාවික වේදනා නාශක ක්‍රියාවලියක් සිදුවෙයි. වේදනා නසන රසායනිකයක් සිරුර තුළ නිපදවී දැවිලි රිදිලි කැක්කුම් සමනය වෙයි. මරණාසන්න වෙද්දී ඒ ක්‍රියාවලිය අවුල් වෙයි. ස්වභාවික වේදනා නාශක ස්‍රාවය දුර්වල වී අවසානයේ එය අඩපණ වෙයි. මරණාසන්න තැනැත්තකුගේ මුළු ශරීරය වේදනා ගෙන දෙන්නේ කියතකින් කපන්නාක් මෙනි. වෑයකින් සසින්නාක් මෙනි. සිහියෙන් යුතුව මරණයට මුහුණ දෙමින් සිටින තැනැත්තකුගේ සිහි නුවණ අවුල් කිරීමට තරම් ඒ වේදනාව ක්‍රමයෙන් තීව්‍ර වෙයි. මුළු සිරුරම එකම තුවාලයක් මෙන් හැඟී යයි. එවන් විටකදී පහළ වනුයේ පහත් සිතුවිලිද? නැත. වේදනාව, කළකිරීම, කෝපය, වෛරය, අතපය බර ගතිය, අසරණකම වැනි

අප්‍රසන්න සිතුවිලි සමුදායක් එකපිට එක පහළ වෙයි. තමන්ට මෙලොව සියලු දෙය හැර යන්න සිදු වන බවට වැටහීමක් පහළ වෙයි. එකල්හි මහත් බියක් මෙන්ම මෙලොව හැර යාමේ තදබල අකැමැත්තක්ද ඇතිවෙයි. එහි අවසන් ප්‍රතිඵලය කිසිසේත්ම අපේක්ෂා නොකළ එකකි. උපන්දා සිට හොඳ වැඩ කළ අයටත් මහ පින් ඇතියන්ටත් සතර අපායෙහි යළි උපදින්නට සිදුවෙයි.”

# 06

# පිටසක්වළින් එල්ල වන සයිබර් ප්‍රහාර

පිටසක්වළ බෞද්ධයන් ගැන ලියන කියවන එක මට දැන් හොඳට හුරු පුරුදුය. ටිබෙට් බුදුදහමේ එන පිටසක්වළ බෝසත්වරුන් ගැන ලිවීමට ඇති දේ අපමණය. ඔවුන්ගේ කතා ප්‍රවෘත්තීන් මා මෙතෙක් කියවා ඇති විද්‍යා ප්‍රබන්ධයන්ට වඩා රසවත්ය. අපි හෙමි හෙමිහිට ඒ දැනුම හුවමාරු කරගනිමු.

දැනට සතියකට පමණ පෙර අපූරු ආරංචියක් දසත පැතිර ගියේය. "අද හෙටම සයිබර් ප්‍රහාරයක් කියල එකක් එනවලු." රූපවාහිනිය දෙස බලාගෙන සිටි මව කීවාය.

"මොන ප්‍රහාරයක් කියලද කිව්වෙ?"

"සයිබර් ප්‍රහාරයක් එනව කියලයි ප්‍රවෘත්තිවලට කිව්වෙ. පරිගණක අගුළු වැටෙනවලු. දත්ත මැකිල යනවලු. තවත් ඔන්න මොන මොනවද වෙනව කියල කිව්වා. අනේ මන්ද මට නම් ඕව හරි හැටි තේරෙන්නෙ නෑ."

මට කියූ සයිබර් ප්‍රහාරය ගැන සිතේ තබාගෙන අන්තර්ජාලය පිරික්සමින් මට එන විද්‍යුත් තැපැල් ලිපි කියවූයෙමි. පසුගිය සති කිහිපය තුළ පුවත්පත් මාධ්‍යයෙන් මා පළ කළ පිටසක්වළ ඇත්තන්ගේ ලිපි විද්‍යුත් මාධ්‍යවේදීන් විසින් විසිතුරු රූප සටහන් සහිතව බෙදා හැර ඇති ආකාරය දක්නට ලැබුණි. ඒ ලිපිවලට අදාළව පාඨකයන් විසින් යොමුකළ ප්‍රශ්න කෙතෙක්ද යත් ඒවාට පිළිතුරු සැපයීමට මෙවැනි ලිපි සියයක්වත් ලිවීමට සිදුවෙයි. අද වන විට පිටසක්වළ බුදුවරුන් ගැන කතාව හන්දියක් හන්දියක් ගානේ ඇහෙන තරමට ශීඝ්‍රයෙන් ජනප්‍රිය වෙමින් පවතියි. පිටසක්වළ ඇත්තන් පිළිබඳ මා කී කතාවත් පෙර කී සයිබර් ප්‍රහාරය හා සමගාමීව පුදුමාකාර වේගයෙන් ජනතාව අතර පැතිර ගියේය.

පිටසක්වළ මහමොළකාරයන් පිළිබඳ කතා ප්‍රවෘත්තිය තව දුරදිග ඇදගෙන යාමට කලින් සහෘද පාඨකයන් තොරතෝංචියක් නැතිව විමසන ප්‍රශ්න කිහිපයකට උත්තර බැඳීම මාගේ යුතුකමක් ලෙස සලකමි. මේ සක්වළ පමණක් බුදුවරුන් ඉපදෙන බවට කවුදෝ කෙනෙක් පහුගිය දවස් කිහිපයේ අලුත් මතවාදයක් ගෙන මා වෙත දමා ගසනු ලැබුණි. එය සම්පූර්ණයෙන්ම වැරදි වැටහීමකි. බහුධාතුක සූත්‍රයේ දැක්වෙන පරිදි එක සක්වළක එක්වර වැඩ සිටිය හැකිවනුයේ එකම බුදුකෙනෙකු පමණි. වෙනත් සක්වළ බුදුවරුන් වැඩ සිටීමට කිසිදු තහංචියක් නොමැත්තේය.

දෙවැනියට වැදගත් ප්‍රශ්නය නම් පිටසක්වළ මිනිසුන් සිටීද යන්නයි. "හපෝ ඔය ප්‍රශ්නය නම් එපා ආයිත් අහන්න." මම ඔවුන්ට කියමි. ඒ ප්‍රශ්නයට උත්තර දෙන්නට පොත් ගණන් ලියා මටම එපා වී ඇත.

මේ පැරණි බණ කතාවකි. අනුරුද්ධ ස්වාමීන් වහන්සේ බුදුන්වහන්සේගේ සමීපතම ඥාතියෙකි. උන්වහන්සේ රහත් වීමට ප්‍රථම සමථ භාවනාව වඩා අභිඥා උපදවාගෙන සිටියහ. "හැබෑද අනුරුද්ධය ඔබ පිටසක්වළ වාසීන්ගේ තොරතුරු දිවැසින් දකින බව කියන්නේ?" යනුවෙන් බුදුන්වහන්සේ අනුරුද්ධ තෙරුන් විමසූහ.

"එසේය ස්වාමීනි දසදහසක් සක්වළ දෙව් බඹුන් මිනිසුන් ආදී සත්ව කොට්ඨාසත් මාගේ දිවැසට විෂය වන්නේය."

"එයින් තොපට කිසියම් හැඟීමක් ඇතිවූයේද?"

"සෙස්සන් නොදකින පිටසක්වළ ඇත්තන් දැකීමෙන් මට ආඩම්බරයක් ඇතිවිය" යනුවෙන් අනුරුද්ධ තෙරණුවෝ උත්තර දුන්හ. එකල්හි බුදුහු අනුරුද්ධ තෙරණුවන්ගේ මානය දුරු කිරීම් පිණිස උපදෙස් දුන්හ. එයින්ම උන්වහන්සේ අර්හත්වයට පත්වූහ.

බුදුවරයකු පහළ වනුයේ මේ සක්වළ පමණක්ම බව කියන මිථ්‍යාවක් මේ දිනවල පැතිර යයි. සූත්‍ර පිටකයේ ඛුද්ධක නිකායේ අපදාන පාලියේ ගෞතම බුද්ධාපදාන නම් වූ කොටසක් ඇත. අනන්ත සක්වළ ලෝකධාතූන්හි වර්තමානයේ බුදුවරුන් වැඩ වෙසෙන බවත් එම බුදුවරුන් වැඳීමෙන් බොහෝ පින් සිදුවන බවත් එම සූත්‍රයේ පැහැදිලිවම දැක්වෙයි. අප මහා බෝසතාණන් වහන්සේ පිටසක්වළ බුදුවරුන් අරභයා දුන් මනෝමය දානයක් හේතු කොටගෙන එතැන් සිට බුදුවන ආත්මභාවය දක්වා අපායේ නොවැටුණහ.

මැතකදී මට එල්ල වූ බිහිසුණුම චෝදනාව නම් මා මහායානය පතුරවමින් සිටින බවයි. මා මහායානය

මිථ්‍යාවක් බව සාධක සහිතව ඔප්පු කරමින් සිටින අතරතුර එවැනි චෝදනාවක් එල්ල කිරීම මහා සාවද්‍ය පාපකර්මයකි. හරියටම කියතොත් එය යගදාවක් ගෙන තමන්වම තළා පෙළා ගැනීම වැනි මහත් අඥාන ක්‍රියාවකි. මා මේ ලිපි පෙළ ලියනුයේ හීනයාන, වජ්‍රයාන හා මහායායන සම්ප්‍රදායන් ඉතා ප්‍රවේසමෙන් අධ්‍යයනය කිරීමෙන් පසුවය. මා කරන්නට යන ශාසනික යුතුකම බෞද්ධයන්ට නොපෙනේ නම් එය ඔවුන්ගේම අවාසනාවකි. මාගේ එක් නිශ්චිත ඉලක්කයක් වනුයේ බුදුදහමේ සියලු ශාඛා එක් තැන් කරමින් මුල් බුදුදහම නැවත ඇති කිරීමයි. බුදුසසුන නැවත පිහිටුවීමයි. රහතන්වහන්සේලා සමාජගතව ජීවත් වන යුගය නැවත ඇති කිරීමයි.

මෙවැනි භාරදූර කාර්යයකට අත පෙවීමට නුඹ වැනි ලිලිපුට්ටකු නොව, අපම සුදුස්සන් වන්නේය යනුවෙන් ආචාර්ය, මහාචාර්ය, චූලාචාර්ය පට්ටම් දරන කවරකුට නමුත් හිතෙන්නට බැරි නැත. එසේ නම් මාගේ ධර්ම දැනුම උරගා බලනු මැනවි. මා ලත් ධර්මාවබෝධය උරගා බලනු මැනවි. ඕනෑම වියත් මණ්ඩලයක් මැද වාද කර මා කියන ධර්මතාවන්ගේ සත්‍යතාව පෙන්වීමට මා ලැහැස්තිය. මා අපහසුවෙන් එකලස් කළ නිවැරදි නිවැරදි බුදුදහම ඔවුන් සතුව නොමැති බව ඔප්පු කර පෙන්වන්නට මා ලැහැස්තිය. මෙතෙක් කල් නිහඬව සිටි මා මෙසේ විවෘත අභියෝගයක් එල්ල කරනුයේ එක්තරා වැදගත් හේතුවක් මතය. ඒ හේතුව මෙසේ විස්තර කර සිටිමි.

අද වන විට බුදුදහම කෑලි කෑලිවලට කැඩී වෙන්ව ජරාජීර්ණව ගොස් ඇත. එක්තරා නිකායකට අයත් පිරිස අභිධර්මය ප්‍රතික්ෂේප කරති. තව සමහරු

විනය ප්‍රතික්ෂේප කර නිවන තමන්ගේ ඒකාධිකාරයට යටත් බව පෙන්වන්නට ලැහැස්ති වෙති. තව පිරිසක් බුදුන්වහන්සේට අලුත් උප්පැන්න සහතික තැනීමට ගස්ගල්වලින් සාක්ෂි එකතු කරති. මේ සියලු ක්‍රියාවන්ගෙන් සිදුවනුයේ මහත් ආන්තරායකි. මහත් බියකි. මහත් ව්‍යසනයකි. ඒ පාපතර ක්‍රියාවන්ගෙන් බෞද්ධයෝ තව තවත් භේද භින්න වෙති. අහසේ යන සරුංගලයක් කොටස්වලට ඉරී ගියහොත් එය බිම වැටෙනු වළකනු නොහැකිය. මුහුදේ යන නැවක් දෙපලු කළහොත් එය ගිලීයාම වළකනු නොහැකිය. බුද්ධ ශාසනයද එබඳුය. බුද්ධ ශාසනයේ පරිහානියට මූලික හේතුව බෞද්ධයන් කොටස්වලට බෙදී එකිනෙකාට වරද පටවමින් සිටීමයි.

මේ කියන එක හෝ කොට්ඨාසයකට අයත් පිරිස් තම වැරදි දැක ආපසු හැරී ඒමක්ද නොපෙනෙයි. පෙළක් අය ඇමර්සන් වනයෙන් මෙරටට ගෙනා කැනන් බෝල් ගසක් පෙන්වා මේ ලුම්බිණි සල් උයන බව කියති. හරිහැටි නමක් ගමක්වත් කොටා නැති ගල්පර්වතයක් පෙන්වා මේ බුදුන් උපන් තැන බව කියති. උනුන්ගේ හාස්‍යයට ලක්වන එවැනි කියුම් පවා පිළිගන්නා තරමට අද මිනිසුන්ගේ තර්කන ශක්තිය දුර්වල වී ගොස් ඇත. තවත් තැනක මහ අමුතු පූජාවකි. මේවා ගැන කීම පවා කාලය කා දැමීමකි. විකාර නම් ඇති අමුතු අමුතු පූජාවන් දිනෙන් දින අලුතින් හඳුන්වා දෙමින් ඇත. හරි දේ නොවැටහෙන වැරදි දෙය හරි දේ හැටියට සලකන අබුද්දස්ස කාලය අත ළඟම එන්නේද යන සැකයද මට පහළ වෙයි. එබැවින් නොබියව ඉදිරියට පැමිණ පරවාද සුන් කර බුදුසසුන බේරා ගැනීම හැර වෙනත් විකල්පයක් නොමැත. එම තීරණයට මම අද වන විට පැමිණ සිටිමි.

මා මෙතෙක් පිටසක්වළ ජීවීන් ගැන පැවසූ සියලු දේ මුසාවන් නොවන බව යළි යළිත් මතක් කරමි. පිරිසිදුව සිල් රකින, නිති භාවනා කරන, පාරමී දම් සපිරුණු කෙනෙකුට පිටසක්වළ බෞද්ධයන්ගේ උදව් අදටද ලබා ගත හැකිය. ටිබෙට් යෝගීහු අදටද ඒ කාර්යයේ නියැළෙති. ඔවුහු අපේ රටේ නූපන් පළියට ගැරහුම් ලැබීමට සුදුස්සෝ නොවෙති. පිටසක්වළ නායකයන්ගේ පිහිට පැතීමට වෙනම මන්ත්‍ර හා ස්තෝත්‍ර ඇති අතර ටිබෙට් බෞද්ධයෝ දිවා රෑ ඒ කාර්යයේ නියැළෙති. දැන් අපි පිටසක්වළදී සැබැවින්ම සිදුවූ දෙයක් අප දන්නා භාෂාවෙන් කියවා දැන ගනිමු.

එය සුඛාවතියෙහි වූ සුවිසල් බුද්ධ මන්දිරයයි. ඒ තුළ කොළ, දුඹුරු, රන් හා රිදී පාටින් සිත්තම් කළ මල්වැලින් හැඩවූ අපූරු ධර්ම ශාලාවකි. සුදෝ සුදුවන් වූද උපශාන්ත පෙනුමෙන් යුක්ත වූද අමිතාභය බුදු පියාණෝ ධර්මාසනයේ හිඳ සිටිති. උන්වහන්සේගේ එක් පසෙකින් ශ්‍රද්ධාවෙන් අගතැන්පත් වූ මංජු ශ්‍රී බෝසතාණන් වහන්සේය. මංජු ශ්‍රී ඇඳිලි බැඳගෙන අමිතාභය බුදුන්වහන්සේට මහත් ඕනෑකමින් ඇහුම්කන් දෙයි.

"පින්වත් මංජු ශ්‍රී, සාවධානව අසනු මැනවි. නුදුරු අනාගතයේ ඇති වන අනතුරක් ගැන කියමි. එයින් ඔබට හෝ සුඛාවතී ලෝ වැස්සන්ට කිසිදු ගැටලුවක් ඇති නොවෙයි. සිද්ධාර්ථ ගෞතම බුදුන්වහන්සේ අපෙන් සක්වළ පහළොවක් එපිටෙන් පිහිටි සර්වාවතී ලෝක ධාතුවෙහි බුද්ධ ශාසනය මනාව පිහිටුවන ලද්දේය. උන්වහන්සේ දෙව්ලොව සැපත්ව සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මැනවින් දේශනා කරන ලද්දේය. ඒ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයෙන් අමිතාභය බුදුන් වන මා

ඇතුළු දසදහසක් සක්වළ බුද්ධ ක්ෂේත්‍රයන්, බුදුවරුන් හා බෝසත්වරුන් ගැන විස්තරයක් හෙළිදරව් කරන ලද්දේය.

පාපී මාරයාගේ දූවරු ඒ සද්ධර්මපුණ්ඩරීකය අසා දැනගෙන සිය පියාට සියලු පුවත් හෙළිදරව් කළහ. පාපී මාරයා බුද්ධිමතෙකි. කුටෝපායන්හි අගතැන් පැමිණියෙකි. හේ සම්බුද්ධ පරිනිර්වාණය තෙක් ඉවසා සිටියේය. ඉන් නොබෝ කල් ගතවූ පසු පෘතග්ජන ශ්‍රාවකයන්ගේ සිත්වලට බලපෑම් කර අමිතාභය බුදුන් වන මා වෙත එන ව්‍යාජ මාවතක් දේශනා කරන ලද්දේය. ඒ ව්‍යාජ මාවත මහායානය ලෙස නම් කරන ලද්දේය.

තවද අද වන විට ගෞතම බුදුන්වහන්සේගේ ශාසනය ඇති වී දෙදහස් පන්සිය වසක් ඉක්ම ගොස් ඇත. මහායානය යන නමින් ප්‍රසිද්ධ වූ වැරදි මාර්ගයෙහි තව තවත් පිරිස් සමාදන් වීමෙන් සර්වාවතියෙහි බුද්ධ ශාසනය අන්තර්දාන වන කාලයක් උදා වෙමින් ඇත. බමුණන් විසින් ගොතා ලියන ලද මිථ්‍යා ප්‍රතිපදාවන් ප්‍රසිද්ධියට පත්වෙමින් මේ වන විට මහත් හානියක් සිදුවෙමින් ඇත.

එබැවින් වහාම මාගේ අණ පිළිගෙන සර්වාවතී ලෝකධාතුවට ගොස් මිථ්‍යාවේ අන්ධකාරය දුරු කරනු මැනවි. ඒ ගමනට ඔබ සාග ලෝකයෙහි වජ්‍රයෝගිනියද විමලාවෙහි වජ්‍රසත්වයන්ද කැඳවාගත යුතුය. තවද පද්ම ශ්‍රී බෝසතුන්ටද මාගේ අණ සිහිපත් කරනු මැනවි. ඔහුද ඒ ගමනෙහිදී ඔබට සහය වනු ඇත."

මෙයාකාර උපදෙසක් ලද මංජු ශ්‍රී ඊළඟට කළ දෙය වැඩි දෙනෙකු විසින් පිළි නොගනු ඇතැයි මම විශ්වාස කරමි. එනමුත් මේ හෙළිදරව්වෙහිදී හිතට

එකඟව ඇත්ත කතා කිරීම හැර වෙනත් විකල්පයක් නොමැති බව මම තරයේම විශ්වාස කරමි. මා අද ලියා තබන දේ හෙට ලියන්නට බලා සිටියොත් ප්‍රමාද වැඩි විය හැකිය. මේ වන විටත් බෞද්ධයන්ගේ මුවෙහි අගුල් ලන නීතිරීති සම්පාදනය කිරීමට අන්‍යාගමික බලවේගයන් විසින් දේශපාලකයන්ට බලපෑම් කරමින් සිටින බව පෙනෙන්නට ඇත.

එය 2011 වර්ෂය විය යුතුයයි සිතමි. මට දැන් දින කාල වකවානු තරමක් අමතකය. අමිතාභය බුදුන්ගෙන් අණ ලත් මංජු ශ්‍රී මහ දවාලේ මා හමුවීමට පැමිණියේය. එතුමාගේ පෙනුම හැඩහුරුකම ඇඳුම් පැළඳුම් නිශ්චිතව දැකගත නොහැකි වුවත් හේ ඉතා පැහැදිලිව කතා කළේය. මම මුලින්ම මනෝභ්‍රාන්තියකට ලක්වූවෙමි යන සැකය උපදවා ගතිමි. එනමුත් පුදුමයකට මෙන් මාගේ සගයකු ඉදිරියේ පෙනී සිට මට කියූ දේ එයාකාරයෙන්ම කීමට මංජු ශ්‍රී සමත් විය. එසේම මංජු ශ්‍රී විසින් හෙළිදරව් කරන ලද තොරතුරු කිහිපයක්ම ඉපැරණි ටිබෙට් පතපොතෙහි එයාකාරයෙන්ම සටහන්ව තිබෙනු දැක පුදුමයට පත්වීමි. මෙයාකාරයෙන් බෝසත්වරු කිහිපදෙනෙක්ද බුදුවරුන්වහන්සේලා දෙදෙනෙක්ද දිගින් දිගටම මා හට ධර්ම කරුණු දේශනා කරන්නට පටන්ගත්හ. මෙලෝවාසී බෞද්ධයන්ට මුහුණ දීමට සිදුවන අනාගත භය කිහිපයක් ගැන මා දැනුවත් කළහ.

බුදුවරුන් බෝසත්වරුන් කියා සිටින පරිදි මේ ගතවන්නේ ඉතාම තීරණාත්මක වසර කිහිපයකි. ගෞතම බුදුන්වහන්සේ විසින් දේශනා කළ නිර්මල වූ ආර්ය මාර්ගය ඒ බුදුවරු බෝසත්වරු සියලු දෙන එක සිතින් අනුමත කරති. එනමුත් වශවර්ති මාරයාගේ

උපායශීලී දූරදර්ශී ක්‍රියාපටිපාටිය හේතුවෙන් සම්බුද්ධ ශාසනය තව නොබෝ කලෙකින්ම අතුරුදන් වීමේ අන්තරායක් පැන නැඟී ඇත. මාර සේනාධිපතියෝ සය දෙනෙක්ද දෙතුන් සීයක පමණ මාර සෙනඟක්ද ලක්දිව බෞද්ධයන්ගේ සිත්වලට බලපෑම් කරමින් සැබෑ බුදුදහම අවුල් කරවති. බෞද්ධයන් භේද භින්න කරවති. අන්‍ය තරගකාරී ආගම් ප්‍රචාරණයට ඇති තරම් උදව් කරති. අද අප රටේ දේශපාලකයන් දිගින් දිගමට බුදුදහමට නිග්‍රහ කරමින් බෞද්ධයන් පීඩාවට පත් කරමින් සිටිනුයේ එකී මාර සෙනඟ ඔවුන්ගේ සිත අවුල් කළ බැවිනි.

මෙකී මාර බලපෑමෙන් රට ජාතිය ආගම මුදවා ගැනීම වෙනුවෙන් බෞද්ධයන්ට කළ හැක්කේ එකම එක දෙයකි. ඔවුන් සියලු දෙන එක්ව තනි බලවේගයක් බවට පත්ව බුදුදහමට අනුව රට පාලනය කරන බවට පාලකයන් ගිවිස්වාගත යුතුය. නොඑසේනම් බෞද්ධ පාලන තන්ත්‍රයක් වෙනුවෙන් සාමකාමීව එක් විය යුතුය. සැමට සමව සලකන අක්ෂෝභ්‍ය පාලන තන්ත්‍රයක් මෙරට ඇති කළ යුතුය.

මේ අනාවැකි මා සිතේ උපන් දේ බව කියා කෙනෙකුට තර්ක කළ හැකිය. වාද කළ හැකිය. අපහාස උපහාසයට මා ලක් කළ හැකිය. මා කියන දේ ඔබ පිළිනොගන්නේ නම් මේ ලිපිය කපා වෙන් කරගෙන වසර විස්සක් ළඟ තබා ගනු මැනවි. මා කියූ දෙය කොතරම් නිවැරැදිද යන්න එදාට ඔබටම පසක් වනු ඇත.

පැත්ත ගියත් ඇත්ත කීම සිංහල සිරිතයි. මම ඒ සිංහල සිරිතට සැමදා ගරු කරමි. අපේ රටේ ඇත්තන්ගේ දේශපාලන අදූරදර්ශීභාවය ගැන ටිකක් හෝ කතා කිරීම

අනාගත බයෙන් රට මුදවාහැරීමට පිටිවහලක් වේ යයි සිතමි. මෙය මිත්‍රයකු විසින් මට කියූ හාස්‍යජනක කතන්දරයකි. අප රටෙහි ඇත්තන්ගේ අනාගතය පිළිබඳ ඉඟියක් මේ කථා ප්‍රවෘත්තිය තුළින් පැහැදිලිවම ජනනය වෙයි.

පෙර කල එක්තරා ගමක උපායශීලී මිනිසෙක් සිටියේය. ඔහුට තිබුණු ලොකුම කරදරය නම් මීයන් විසින් සියලු භවබෝග කා වනසා දැමීමයි. හේ කදිම මී කතුරක් නිර්මාණය කළේය. එහි එක් කොනක කරවල කැබැල්ලකි. අනෙක් කොනෙහි පොල් කැබැල්ලකි. මැදින් හරහට සවිකර ඇත්තේ හොඳ මුවහත් පිහිතලයකි.

පළමු දින රාත්‍රියේ මීයෙක් පැමිණ කරවල කම්දෝ පොල් කම්දෝ යනුවෙන් කල්පනා කරමින් මී කතුරට ළංව හිස දෙපසට වැනීය. තියුණු පිහි තලයේ ඇතිල්ලුණු මීයා එයින්ම මරණයට පත්විය. හේ පළමු මීයාද කරවල කෑල්ලද පොල් කෑල්ලද එතැනින් ඉවත් කළේය. කරවලත් පොලුත් නොමිලයේ දෙන තැනක් ගැන පසුදින වන විට මීයන්ට දැන ගන්නට ලැබුණි. නොමිලයේ යමක් දෙන තැන සෙනඟ වරදින්නේම නැත. එය දේශපාලන පක්ෂ නායකයන් විසින් සිය දහස්වර ඔප්පු කර පෙන්වන ලද සත්‍යයකි.

දෙවැනි මීයා මී කතුර වෙත පැමිණ "කරවලත් නැත පොලුත් නැත" කියමින් හිස දෙපසට සලන්න විය. තියුණු මුවහත් තලයේ ගැවුණු උගේ හිස කැපී වෙන් විය. මීයන් සියලු දෙනාම එකා පිට එකා වැටෙන තුරු මී කතුර සාර්ථකව ක්‍රියා කළේය.

මෙවැන්නක් සැබෑ ලෝකයේ සිදුවිය නොහැකිය යන්න කියමින් ඔබ තර්ක කරනු ඇත. ඔබ වැරදිය.

සර්වප්‍රකාරයෙන්ම වැරදිය. අද මෙරට දේශපාලන ක්‍රියාදාමය තුළ සිදුවනුයේ ඔන්න ඔය කියන මී කතුරේ ක්‍රියාවයි. සොරුන්ට, මැරයන්ට හා නමගිය අපරාධකරුවන්ට තට්ටු මාරු ක්‍රමයට රට භාර දීම මෙරට දේශපාලන සංස්කෘතියයි. වෙනත් සාධනීය මාවතකට අවතීර්ණවීමට තරම් බුද්ධි ප්‍රභාවක් අපේ ඇත්තන්ට නැත. මහත්මා දේශපාලනයෙහි නිරත වූවන්ට ජනතාවගෙන් පුංචි හෝ ඉඩක් නැත.

අරක්කු බෝතලයට හා බත් පැකට්ටුවට තම අනාගතය පමණක් නොව, රට ජාතිය හා ආගමද පාවා දෙන තරමට සිංහල බෞද්ධයෝ අඥානව සිටිති. දැන් අපට කරවලත් නැත. පොලුත් නැත. හිස කඳෙන් වෙන් කරන තුරු 'සාමය උදෙසා' ඉවසා සිටින්නට තව ටික දවසකින් අපට කියනු ඇත.

සියලු දාගැබ් බුදු පිළිම පොළොවට සමතලා කරන තුරු, සියලු යතිවරුන් දඟගෙයි ලන තුරු සාමයේ නාමයෙන් දැස් පියාගෙන දෙකන්වලට අගුල් ලාගෙන සිටින්නට අපට බල කෙරෙමින් පවතියි. එය දේශපාලන අවස්ථාවාදීන් විසින් අපට උගන්වන්නට යෙදෙන අඥාන පාරමිතාවයි. සද්ධර්ම අන්තර්ධානය සිදුවන්නේ අඥාන පාරමිතාවේ නොවැළැක්විය හැකි ප්‍රතිඵලය ලෙසිනි. නොඑසේව මා විසින් ප්‍රසිද්ධියට පත් බෝධිසත්ව චරිතාපදානවල බලපෑම නිසා නොවේ.

# 07

# පිටසක්වළ බෞද්ධයන්ගේ අනාවැකි

ඒක්තරා බෞද්ධ නිකායකට අයත් සැදැහැවතකු මට ළඟ දිනක මහමඟදී හමුවිය. ඔහුගේ තර්කන බුද්ධිය ඒ බෞද්ධ සම්ප්‍රදායට අයත් නායකයා විසින් ගල් කර තිබුණි. ඔහුට අනුව මහ උගතා වනුයේද තුන් ලෝතතු 'ඒ වු ඉසෙඩ්' දන්නේද ඔහුගේ නායකයා පමණි. අන් අය මැට්ටන්ය. ඔවුන් බුද්ධි ඵලයෙන් හීනය. මෙවැනි අන්තවාදී නිකායකට අයත් අයකු සැදැහැවතකු ලෙස මා නම් කළේ එක්තරා වැදගත් හේතුවක් මතය. දැන් මම ඔබව ඒ හේතුව සරලව පහදා දෙමි.

මිනිසා ආගමක් ඇදහීම පටන්ගත්තේ කොපමණ කලකට පෙරදීද යන්න මෙතෙක් කිසිවකු විසින් හෝ විසඳා නොදුන් ගැටලුවකි. දැනට වසර විසිදහසකට පෙර යුරෝපයේ ජීවත් වූ නියැන්ඩර්තාල් මානවයන් පවා ආගමක් ඇදහූ බව පුරාවිද්‍යාඥයන් විසින් සාධක සහිතව ඔප්පු කර ඇත. මිනිසා ආගම් ඇදහීමට මූලික හේතුව වූයේ සොබාදහම ඔහුට හරිහැටි තේරුම්ගත නොහැකිවීමයි. හිරු පෙරදිගින් නැග බටහිරෙන් බැසයයි. ගින්නෙන් සියල්ල දැවී අළු වී යයි. සුළඟට

හසුවූ සැහැල්ලු දේ ඈතට ඈතට පාවී යයි. එබඳු සංසිද්ධීන් තේරුම්ගත නොහැකි වූ තැන මිනිස්සු ඒ පිටුපස තිබෙන කිසියම් අද්භූත නායකත්වයක් ගැන විශ්වාස කරන්නට පටන්ගත්හ.

ලෝක ආගම් සියල්ලෙහිම දැකගත හැකි එක්තරා පොදු ලක්ෂණයක් වෙයි. ඒ පොදු ලක්ෂණය නම් අන්‍ය ආගමික මතවාදයන් නොඉවසීමයි. අන්‍ය මතවාදයන් උපහාසයට හා හැල්ලුවට ලක් කිරීමයි. අන්‍ය ආගමකට අයත් දෙවියන්ට වැඳුම් පිදුම් නොකළ යුතුය යන්න පරණ තෙස්තමේන්තුවට අයත් දස පනතෙහි පැහැදිලිව සටහන් කර ඇත. සූත්‍ර පිටකයට අයත් බ්‍රහ්ම ජාල සූත්‍රයෙන් එවකට පැවැති අන්‍ය ආගමික මතවාද සියල්ල ප්‍රතික්ෂේප කරනු ලැබීය. සෑම ආගමික නිකායක්ම තමන් හරි අන් අය වැරදි කියා ප්‍රචාරය කරනු දක්නට ලැබේ. තමන්ට අවනත වන අය සැදැහැවතුන්ය. අන් අය මිථ්‍යා දෘෂ්ඨිකයන්ය. මේ ලක්ෂණය කොයි ආගමික කල්ලියටත් එක හා සමාන මහා පොදු සාධකය වෙයි.

දැන් අපට වැදගත් ප්‍රශ්නයක් ඉතිරි වෙයි. ලෝකයේ සියලු ආගම් එකිනෙක නොපෑහේ නම් අප විසින් කළ යුතු වඩාත් සාධාරණ තේරීම කුමක්ද? මේ ප්‍රශ්නය ඉතා සරල එකක් ලෙස ඔබට පෙනෙනු ඇත. නැත. එය සරල ප්‍රශ්නයක් නොවේ. ඔබ මරණින් මතු නිරයට නෙරපනු ලබන්නේද එසේ නැතහොත් ස්වර්ගයේ උත්පත්තිය ලබන්නේද යන ප්‍රශ්නයට පිළිතුර රඳා පවතින්නේ ඔබේ තේරුම නිවැරදිද යන්න මතය. කොයි ආගමික මතවාදය නිවැරදිද එය කොපමණ දුරට නිවැරදිද යන පැනයට පිළිතුර ඔබ අද අදම දැන සිටිය යුතුය. අපගේ ජීවිත කාලය තුළ අනිවාර්යයෙන්ම විසඳාගත යුතු ප්‍රශ්නය වන්නේද එයයි.

මා පිටසක්වළ බෞද්ධයන් ගැන මේ තරම් විස්තර ලිවීමට එක් හේතුවක් නම් පිරිසිදු බුදුදහම හැර වෙනත් විකල්ප ගැලවීමේ මාර්ගයක් නොමැති බව පෙන්වා දීමට ඇති අවශ්‍යතාවයි.

මා පිටසක්වළ බෞද්ධයන් ගැන ලියන පොත්පත් අද වන විට ශීඝ්‍රයෙන් රට තුළ ජනප්‍රිය වෙමින් පවතියි. පිටසක්වළ බුදුවරුන් ගැන රසකර කතා ලියන වෙනත් සිංහලයකු ගැන ඔබ අසා නොතිබෙන්නට බොහෝ ඉඩ ඇත. බෝසත්වරුන් හා සංවාදයේ යෙදෙන තවත් මිනිසකු ගැන ඔබ අසා නැතුවාට සැක නැත.

එක්කෝ මා කියන දේ බොරු විය යුතුය. නොඑසේ නම් මනෝභ්‍රාන්තියකට (hallucination) ලක්ව ඒ කතා ලියනවා විය යුතුය. එසේත් නැතිනම්? ඒ කතා පිටසක්වළ බෞද්ධයන්ගේ සැබෑ තොරතුරු විය යුතුය.

පිටසක්වළ බෞද්ධයන් ගැන සූත්‍ර පිටකයේ තැන් තැන්වල ඇති වැදගත් තොරතුරු ගණනාවක් මම පසුගිය ලිපිවලින් හෙළිදරව් කළෙමි. විජය සක්විති රජු පිටසක්වළ බුදුවරුන්ට වන්දනාමාන කිරීමේ පිනෙන් අපාය වියළවීය. අනුරුද්ධ තෙරණුවෝ දසදහසක් සක්වළ මනුෂ්‍ය වාසයන් ගැන දිවැසින් දැක ගත්හ. කාශ්‍යප බුදුන්වහන්සේගේ සමයෙහි විසූ අභිභූ රහතන්වහන්සේ දසදහසක් සක්වළට ඇසෙන්නට බණ කීහ. මේ සූත්‍ර පිටකයෙහි පිටසක්වළ බෞද්ධයන් ගැන සඳහන් වන වැදගත් තැන් කිහිපයකි.

පිටසක්වළ බෞද්ධ නායකයන් සූක්ෂ්ම කයින් පැමිණ මා හමුවිය යන්න මා නිතර නිතර කියන කරුණකි.

"හා අපිත් භාවනා කරනවා. එහෙමනම් අපටත් ඔය වැනි දේ පෙනෙන්නට ඕන නේද?" යනුවෙන් සමහරු තර්ක කරති. කලාතුරකින් තව කෙනෙකු කියන පරිදි පිටසක්වළ බෞද්ධයන් ගැන අපට වැඩක් නැත. අපි අපේ බුදුන් කී බණ අසාගෙන අපේ ගමන යමු යැයි ඔවුහු කියති. දැන් මම ඒ ප්‍රශ්න සියල්ලම සාධාරණව විසඳා දෙමි.

මුලින්ම මා හමුවට ආ පිටසක්වළ බෞද්ධ නායකයා මංජු ශ්‍රී නම් වෙයි. මංජු ශ්‍රී මා වෙත ආවේ අතිශය සංවේදී හා වැදගත් පණිවුඩයක්ද සමඟය. කුමක්ද ඒ වැදගත් පණිවුඩය? ඒ පණිවුඩය කොටස් කිහිපයකින් විස්තර කිරීම පහසුය. මහායානය යනු බුදුදහමේ ශාඛාවක් නොව, එය වශවර්ති මාරයාගේ නිර්මාණයක් බව ඔහු කී පළමු පණිවුඩයයි. මහායානය නිර්මාණය වීම පිළිබඳව ඔබ මෙතෙක් නොඇසූ සත්‍ය කතා ප්‍රවෘත්තිය මෙසේය.

සිද්ධාර්ථ ගෞතම බුදුන්වහන්සේ සියලු බුදුවරුන්ගේ ප්‍රතිපත්ති අනුව යමින් දෙව්ලොවට වැඩම කර මාතෘ දිව්‍යරාජයා ප්‍රමුඛ පිරිසට අතිශය දීර්ඝ ධර්ම දේශනාවක් කළහ. එම ධර්ම දේශනාව සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය නම් වෙයි.

සංසාරය බියකරුය. බුදුවරයකු පහළවීම දුර්ලභ කරුණකි. බුදුවරයකුගේ බණ කණවැකීම සංසාරයේදී ලැබෙන විරල ගණයේ අවස්ථාවකි. ඒ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගෙන වහ වහා ධර්මාවබෝධයට පත්විය යුතුය යන්න ඒ ධර්ම දේශනයේ සාරාංශයයි.

වෙනත් ලෝකධාතුවල බුදුවරුන් වැඩ වාසය කරන්නේද යන සැකය සද්ධර්මපුණ්ඩරීක සූත්‍රය අසා සිටින දෙවිවරුන්ගේ සිත්වල ඇතිවිය. බුදුපියාණන් වහන්සේ ඒ සැකය දුරුකරනු පිණිස වෙනත්

ලෝකධාතුවල ඇති බුද්ධ ක්ෂේත්‍ර ගැනද දැනට වැඩවසන බුදුවරුන් වහන්සේලා ගැනද බෝසත්වරුන් ගැනද දීර්ඝ දේශනාවක් කළහ. ඒ මනරම් දෙසුම අසා සිටි මාරදූවරු සිය පියාට ඒ ගැන රපෝර්තු කළහ. මාරයා වහ වහා ක්‍රියාත්මක වී මිනිසුන්ගේ සිත්වලට බලපෑම් කර මහායානය නම් වූ අපභ්‍රංශය නිර්මාණය කළේය.

මා කලින්ද විස්තර කළ පරිදි මහායානය පදනම් වනුයේ වසවත් මරුන් විසින් මිනිසුන්ට ආරූඪ වී කරන ලද ප්‍රකාශයන්ය. මහායානයේ ඇති ලෝකධාතු විස්තරයෙහි නිවැරදි තැන් ඇත. නමුත් මහායාන ගමන්මග කෙළවර වනුයේ වසවත් මරුගේ ප්‍රාසාදයෙනි. ප්‍රකෘති ශ්‍රාවකයන්ගේ කාලය අවසන් වන තුරු මහායානිකයෝ සසරෙහි දිගට ගමන් කරති. බුද්ධ ශාසනය අවසාන වූ කල්හි ඉඳහිට මහායානිකයෙක් පසේබුදුබව ලබයි. මහායානය යනු වශවර්ති මාරයාට සෙනඟ එකතු කිරීමට තනන ලද උපක්‍රමයකි. බෝසත්වරුන් කියන පරිදි මහායානය බුදුදහමේ ශාඛාවක් නොවේ. එය වශවර්ති මාරයා විසින් ඍජුව මෙහෙයවන ආගමික නිකායකි.

පිටසක්වළ බෝසත්වරුන් මේ කියන අනෙක් වැදගත් කරුණ නම් සුඛාවතියේ වෙසෙන අමිතාභය බුදුන් සමීපයේ උපත ලබන ප්‍රතිපදාවක් අපට නොමැත්තේය යන්නයි. මේ කරුණ අමිතාභය බුදුන්වහන්සේ විසින්ද මතක් කර දෙනු ලැබීය.

"පින්වත. මුළු විශ්වයෙහි ලෝකධාතු සියල්ලටම පොදු වූ ගුණාංග තුනක් ඇත. අනියත, සන්තත හා සංකර යන ගුණාංග තුන ලෝකධාතුන් සියල්ලටම පොදුය. එබැවින් සියලු ලෝකධාතුන්හි සංස්කාරයන් අනිත්‍යය. සංස්කාරයන් අනිත්‍ය බැවින් දුක්ඛ සත්‍යය

සියලු ලෝකධාතුන්ට පොදුවෙයි. කිසියම් ලෝකධාතුවක සිටින යම් කෙනෙකු සසර දුක නැති කරන්නේ නම් චතුරාර්ය සත්‍යය අවබෝධයෙන්ම එය සිදුවිය යුතුය. ඕනෑම ලෝකධාතුවක ලෝක සත්‍යය හෙළිකරගනු ලබනුයේ බෞද්ධ අවබෝධතා මාර්ගයෙන් පමණි. ඒ හැර දුක නිවීමට වෙනත් මාවතක් නොමැත. අමිතාභය බුදුන් වෙසෙන සුඛාවතියේ ඉපදීමේ ප්‍රතිපදාව පෘථිවි වාසීන්ට නිෂ්පල වූවකි."

තවද ලෝකාන්තර නිරය හරහාද නිරය අතර සත්වයන් මාරු කිරීමේ ක්‍රමය හරහාද ආසන්නතම සක්වළෙහි ඉපදිය හැකිමුත් පෘථිවියේ කෙනෙකුට සඛාවතියෙහි ඉපදීමට කිසිදු ක්‍රමයක් නැත. අමිතාභය බුදුන්වහන්සේ තවත් විටෙක මෙසේ දේශනා කළහ.

" පින්වත. පෘථිවි තලයෙහි ගෞතම බුදුන් වහන්සේගේ ශාසනය තවම විද්‍යාමානය. ඒ ශාසනය තුළ ඔබට උගන්වන ලද ප්‍රතිපදාව සමාදන්වීමෙන් සසර දුකට පිළියම් කළ හැකිය. නිසැකවම සසර සයුර තරණය කළ හැකිය."

අමිතාභය බුදුන්වහන්සේ කොපමණ දූරදර්ශී නායකයකුද යන්න පහත දැක්වෙන ප්‍රකාශයෙන් වටහා ගත හැකිය.

"අමිතාභය බුදුන් නම් වන මට වැඳීමෙන් පිදීමෙන්ද මා අරභයා පුද පූජා කිරීමෙන්ද බොහෝ පින් අත්වෙයි. එය බොහෝ කල් වැඩ පිණිස හේතුවෙයි. නමුත් පෘථිවිවාසීන්ගෙන් කිසි කලෙක එවැන්නක් බලාපොරොත්තු නොවෙමි. ඔබ ගෞතම බුද්ධ ශාසනයේ මතු පැවැත්ම කැමැත්තේ නම් අමිතාභය බුද්ධ වන්දනාව ප්‍රචලිත නොකළ යුතුය."

අමිතාභය බුදුහු සිතට දැනෙන්නට ඉතා මොළොක්ව සරලව බණ කියති. අමිතාභය බුදුන්ගෙන් මා බණ ඇසූ කාලයේ තවත් අපූරු අත්දැකීමක් ලබා ගත හැකිවිය. එක්තරා දේවතාවෙක් මා වෙත පැමිණ අසවල් දිනයේ අසවල් වේලාවේ අමිතාභය බුදුන්වහන්සේ මා අරභයා බණ කියන්නේය යනුවෙන් මා දැනුවත් කිරීම පුරුද්දක් කර ගත්තේය. අද මට නොව, අසවලාට ඇසෙන්නට බණ කියන්නටැයි මා ආරාධනා කළොත් එදින බණ ඇසෙන්නේ මා විසින් නම් කළ නියෝජිතයාටය. මට නොවේ.

අපේ නිවස ආසන්නයේ වෙසෙන එක්තරා මිනිසෙක් කිසිදු රැකියාවක් සොයාගත නොහැකිව දුක්බරිත මුහුණින් යුතුව මා හමුවට ආවේය. රාත්‍රියේදී හිත සන්සුන් කරගෙන භාවනා කරන මෙන් උපදෙස් දී මම ඔහුව ගෙදර යැවීමි. හේ පසුදින කඩිනමින් මා හමුවට පැමිණියේය.

"ඊයේ රාත්තිරියෙ මම අර කිව් විදියට භාවනා කළා. හරි පුදුම දෙයක්නෙ මට සිදු වුණේ."

"ඇයි හීනෙන් බය වුණාවත්ද?"

"නැහැ. මම භාවනා කරන අතර හොඳ සිහියෙන් හිටියෙ. එහෙම ඉන්නකොට හරි ලස්සන බුද්ධ රූපයක් පේන්න ගත්තා. ඒ බුද්ධ රූපෙ දිහායින් ඉතා පැහැදිලි කටහඬක් ඇහුණා."

"මොනවද ඇහුණෙ."

"පින්වත. ඔබ කෙරෙහි හටගත් අනුකම්පාවෙන් මෙසේ දේශනා කරමි. කාම සම්පත් සොයන සත්වයාට ඒ තුළින් සැනසීමක් නොලැබෙන්නේමය. කාම සම්පත්

අත්හැර දැමීම සැනසීමේ ආරම්භය වන්නේය. මම එය සනාථ කරනු පිණිස උපමා කථාවක් ඔබට කියමි.

එක්තරා මිනිසෙක් එළකිරි බීම ප්‍රිය කළේය. හේ කිරි එළදෙනක මිලයට ගෙන නිවසට රැගෙන ආවේය. තවද හේ මෙසේ කල්පනා කළේය. මේ රට හැම තැන සොරු වෙසෙති. මාගේ කිරි එළදෙන කවුරුන් හෝ සොරාගත හැකිය. මෙසේ සිතු ඒ අඥාන මිනිසා එළදෙන නිවස තුළම බැඳ දැමීය. එළදෙන ඒ මිනිසා දෙන ආහාර සියල්ල කා දමා නිවස තුළම මළපහ කළාය. නිවස තුළම මූත්‍රා කළාය. ඔහු එතැන් පටන් සෑම දිනකම ගත කළේ කෝපයෙනි. හේ ඉවසීමේ සීමාව ඉක්ම ගොස් අසරණ සතාට ශාප කරන්නට පටන් ගත්තේය.

එම නිවස පසුකර යමින් සිටි ඥානවන්තයකුට අඥාන මිනිසාගේ ශාපය ඇසුණි. හේ එතැනට පැමිණ සියලු පවත් විමසා කොක්හඬලා සිනාසුණේය. වැස්සිය ගෙට ගෙනැවුත් බැඳගත්තේ නුඹමම නේද? නුඹ විසින් ශාප කරගත යුත්තේ නුඹටමම නේදැයි ඥානවන්තයා ඇසීය.

පින්වත, කාම සම්පත් සියලු විනාශයට මුල වන්නේය. කම් සැපතෙහි ඇල්ම දුරලීම සැනසීමෙහි ඇරඹුම වන්නේය."

දැන් මම අතිශය තීරණාත්මක හා අතිශය සංවේදී ප්‍රශ්නය වෙත සෙමින් පිවිසෙමි. මේ කරුණුවල සදාචාරාත්මක වටිනාකමක් ඇතිබව සැබෑය. යම් තරමක හෝ සාහිත්‍යමය රසයක් ඇති බවද සැබෑය. නමුත් ගැටලුව වන්නේ අමිතාභය බුදුන්වහන්සේ වැනි ආගන්තුක චරිත හරහා මෙවැනි දේ සන්නිවේදනය වන බව කීමේ යුක්ති යුක්තභාවයයි.

පෘථිවි වාසීන් දෙස බැලීමට අමිතාභය බුදුන් වහන්සේට හදිසියේම සිතුණේ ඇයි? බෝසත්වරුන් හදිසියේම පොළොවට බැස ධර්ම දේශනා කරන්නට පටන් ගත්තේ ඇයි? ඔන්න දැන් අහගන්න ඒ වැදගත් හේතුව. මම එය බෝසත්වරුන් කී දේ මගේ වචනවලින් ලියා තබමි.

"ගෞතම බුදුන්වහන්සේගේ ශාසනය තව වසර පන්දහසක් කල් පවතින්නට පූර්ව සැලැස්මක් විය. එම සැලැස්මෙහි කේන්ද්‍රස්ථානය ශ්‍රී ලංකාවයි. ඒ සැලැස්මෙහි වැදගත්ම හවුල්කරුවන් වනුයේ සිංහලයන්ය. සිංහල ජාතිය බුදුදහම සමඟ ඉපිද බුදුදහමේ අවසානයත් සමඟ අවසන්ව ඉතිහාසයට එක්වෙයි. සිංහලයෝ බුදුදහම රැක්මේ වගකීමෙන් බැඳුණාහු වෙති. යම් කලෙක සිංහලයන් බුදුදහම අත්හළේද එකල්හි බුද්ධ ශාසනයේ අන්තර්ධානයද වෙයි. සිංහලයන්ගේ අවසානයද එයම වෙයි."

එනමුත් අමිතාභය බුදුන් හා බෝසත්වරුන් විසින් නිතර නිතර අවධාරණය කරන පරිදි මේ පූර්ව සැලැස්ම උඩු යටිකුරු කරවන කුමන්ත්‍රණයක්ද වෙයි. ඒ කුමන්ත්‍රණය හරි යාමේ ඉඩක්ද ඇත.

"වශවර්ති මාරයා ඔහුගේ සේනාධිපතියන් සය දෙනෙක්ද දෙතුන් සීයක මාර සෙනඟක්ද දිවා රෑ නොබලා සේවයේ යොදවමින් සිංහලයන් බුදුදහමෙන් වෙන් කිරීමට කුමන්ත්‍රණය කරයි. හේ අලුත් ආගමික නිකායවල් නිර්මාණය කරවයි. අලුත් අලුත් පූජාවිධි බිහිකරවයි. ලෝකෝත්තර නිවන් සුවය අගය නොකරන නව පරම්පරාවක් බිහි කරවයි. වශවර්ති මාරයා සියලු බෞද්ධ නායකයන් භේද කරවයි. දිවෙන් දිව ගාගෙන සිටි

බෞද්ධ නායකයන් සියලු දෙන නයි පොළඟුන් මෙන් වෛරීව හැසිරෙන තෙක්ම භේද කරවයි. එකිනෙකා මරා ගන්නා තෙක්ම ඒ භේදය දුරදිග යවයි. බුදුදහම බේරා ගැනීමේ වැඩ පිළිවෙළක් කවුරුන් හෝ ඇරඹුවොත් ඒ පිරිසට මතක හිටින පාඩම් උගන්වා අධෛර්ය කරවයි."

බෝසත්වරුන් විසින් හෙළිකර ඇති පරිදි තවත් විශාල අන්තරායක් ඉදිරියට පැමිණෙයි. එයත් වශවර්ති මාරයාගේම සැලසුම් සහගත වැඩපිළිවෙළකි. මේ වැඩපිළිවෙළ ගැන මම 2012 වර්ෂයේ මුලදී විද්‍යුත් මාධ්‍යයන්ගෙන්ගෙන් මුල්වරට හෙළිකළෙමි. 2012 දී මා කියූ අනාවැකිය ගැන බොහෝ දෙනෙක් සැක පහළ කළහ. මම 2012 වර්ෂයේ රූපවාහිනී නාළිකාවක් හරහා කියූ ඒ අනාවැකිය දින කාල වකවානු අනුව හරියටම සිදුවිය. මේ ගැන සැක පහළ කරන කෙනෙකු වේ නම් ඒ වැඩසටහන සජීවී ලෙස විකාශය කෙරුණු නාළිකාවෙන් ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දැනගත හැකිය. ඊට අදාළ පටිගත කිරීම් පිළිබඳ විස්තර ස්වර්ණවාහිනියේ වැඩකළ හෝ වැඩ කරන ජයකොඩි නම් තරුණ මහතාගෙන් අසා දැන ගත හැකිය.

"2014 වන වර්ෂයේ ජනවාරි මාසයේදී මැද පෙරදිගින් ඇරඹෙන ආගමික අන්තවාදීන්ගේ සටනක් කෙටි කලකින්ම රටවල් හයක් කරා ව්‍යාප්ත වනු ඇත. එම අරගලය ඉදිරියට ගෙන යාම හෝ මැඩ පැවැත්වීම පිළිබඳ අවසන් තීරණය ඇත්තේ ඇමෙරිකා එක්සත් ජනපදය මතය. වෙනත් කිසිදු රටක් ඊට අත පෙවීමෙන් ඒ යුද ගිනි නිවිය නොහැකිය. යම් හෙයකින් එක්සත් ජනපදය ඒ යුදගිනි නිවා නොදැමුවහොත් ලෝක යුද්ධයක් දක්වාම එම තත්වය වර්ධනය වී කිව නොහැකි තරම් ජීවිත හා දේපළ හානි සිදුවනු ඇත."

බෝසත්වරුන් විසින් පළ කළ ඒ අනාවැකියේ මුල් කොටස සිරියාව හා ඉරාකය දෙසින් අද වන විට සැබෑ වෙමින් පවතියි. මැදපෙරදිගින් ඇරඹුණු යුද ගින්න තුන්වන ලෝක යුද්ධයේ ආරම්භය බව බෝසත්වරු කියති. ඔවුන් කියන හැටියට ඒ ගැන ශ්‍රී ලංකාවාසී අපට කළ හැකි දෙයක්ද නැත. ඇමෙරිකා එක්සත් ජනපදය මැදිහත්ව යුදගිනි නිවාලීම සිදු නොකළහොත් අපට ඇත්තේ එකම එක විකල්පයක් පමණි. ආගමික අන්තවාදීන් නිවසටම පැමිණ හිසට තුවක්කුව එල්ල කිරීමට පෙර අඩුම ගණනේ සෝවාන් ඵලයටවත් පැමිණීමයි.

දැන් මගෙන් මෙබඳු ප්‍රශ්නයක් ඇසීමට ඔබට සිතෙනු ඇත. ඇයි මේ රහස් කියන්නට බෝසත්වරුන් ඔබ වෙතම ආවේ? අසවල් බෞද්ධ නිකායේ අධිපති අසවල් ස්වාමීන් වහන්සේ වෙත ඔවුන් පැමිණියේ නැත්තේ ඇයිදැයි ඔබ මගෙන් අසනු ඇත. "හා මමත් භාවනා කරනවා මට එවැන්නක් පිළිබඳ හාංකවිසියක හෝ දැනුමක් නැතැ" යි කලාතුරකින් හෝ කෙනෙකු විසින් කියනු ඇත. නැති අවදානමක් මවා පා වාසි ගන්නට ප්‍රලාප කියන බව කලාතුරකින් හෝ කෙනෙකු කියනු ඇත. මා විසින් එවැන්නන්ගේද සිත් පහන් කළ යුතුය.

බුදුන් වහන්සේ කිඹුල්වත් නුවර වැඩවාසය කරන කල්හි දසදහසක් සක්වළවාසී ඍද්ධිමතුන් උන්වහන්සේගෙන් බණ ඇසීමට පැමිණි බව සූත්‍ර පිටකයේ මහා සමය සූත්‍රයේ දැක්වෙයි. සුඛාවතියේ අග්‍ර දායක මංජු ශ්‍රී බෝධිසත්වයන් වහන්සේද ඔවුන් අතර විය. මංජු ශ්‍රී මා හමුවට පැමිණියේ ගෞතම බුදුන්

වහන්සේ විසින් පෙර සැලසුම් කරන ලද පරිදිය. එම වැඩපිළිවෙළට අමිතාභය බුදුන් වහන්සේගේද පූර්ණ අනුග්‍රහය ලැබුණි.

මංජු ශ්‍රී ත්‍රෛනිකායික නායක ස්වාමීන් වහන්සේලා හමුවීමට නොපැමිණ මා හමුවට පැමිණීමේ හේතුව මා විසින් පහදා දිය යුතුය. රට කරවන මහ බලධාරීන් මගහැර මා හමුවට පැමිණීමේ හේතුව මා විසින් පහදා දිය යුතුය. මම එය පළමුව උපමා කතාවකින් පහදා දෙමි. ඉන් පසුව විස්තර කර දෙමි.

එකෝමත් එක කාලයක දුරු රටක මහා නෝන්ජල් නම් වූ රජකෙනෙක් දැහැමෙන් සෙමෙන් රාජ්‍ය පාලනය කළේය. මහා නෝන්ජල් රජතුමාට සුරූපී දියණියක් විය. ඈ කෙතෙක් රූමත්ද යත් ඇගේ රූ සිරි දුටු වනදෙව්ලියෝ ලැජ්ජාවෙන් පසුබා ගියහ. සුරූපී රාජකුමරිය ගැන අසල්වැසි රටවල තේජවන්ත කුමාරයන්ට දැනගන්නට ලැබුණි. ඔවුහු රජකුමාරිය තමන්ට ඉල්ලා පියරජුට දූතයන් යැවූහ. නැතිනම් යුදකර යටත් කරන බව කීහ.

ඉන් එක් කුමරුවකුට දුව දුන්නොත් අනෙකා සතුරු වෙයි. යුද කර රට අල්ලයි. දුවගේ විවාහ මංගල්‍යයෙන් පසු එක් රටක් හැර සියලු රටවල් සතුරු රටවල් වේ. මහානෝන්ජල් රජු උපක්‍රමශීලී අයෙකි. හේ තම දියණිය සරණපාවා ගන්නට කැමති කුමාරවරුන් සියලු දෙනාට සහභාගි විය හැකි සාධාරණ තරගයක් ඇති බවට දැන්වීම් යැවීය.

තරග දිනයෙහි සුරූපී දූ කුමාරිය කිඹුලන් ගහන විලක් මැද පිහිටි කුඩා ගල් පර්වතයක් උඩ තනි කරනු ලැබීය. කුමාරවරු සුරූපිණිය ගැන සිත් ඇතිව විල් තෙරට වී නොඉවසිලිමත්ව සිටියහ.

"කුමාරවරුනි, නුඹලාගේ තරාතිරම මට වැඩක් නැත. මේ තරගය කා හටත් සාධාරණය. නුඹලාගෙන් නිර්භීතම කුමාරයා තෝරා මාගේ දියණිය සරණ පාවා දෙන්නෙමි. කුමරිය කෙරෙහි සිත් ඇති අයකු වේ නම් කිඹුලන් ගහණ විලට පැන පීනා ගොස් ඇය බේරාගෙන එනු මැනවි."

එය කිසිවකු විසින් හෝ භාර ගැනීමට අසීරු, සිතා ගැනීමටවත් නොහැකි තරම් දුෂ්කර අභියෝගයකි. කුමාරවරු විල් තෙරට වී එකිනෙකාගේ මුහුණු දෙස බලමින් පැයක් හමාරක් නිකරුණේ ගෙවා දැමූහ. රටවැසි බොහෝ පිරිස්ද විදේශ රටවලින් පැමිණි නියෝජිතයෝද විල් තෙරට පැමිණ එකිනෙකා මත තෙරපෙමින් ඊළඟ ඇසිල්ලේ කුමක් සිදුවෙන්නේද යන කුතුහලයෙන් යුතුව බලා සිටියහ.

මේ අතර 'ජබෝස්' යන හඬක් විල් තෙර පිහිටි බැම්මක් දෙසින් ඇසුණි. පිරිස අතර සිටි වයස අසූවක් පමණ වෙතැයි අනුමාන කළ හැකි මහල්ලෙක් විලට පැන දිය දෙබෑකර පීනා ගොස් කුමරිය බේරාගෙන ගොඩට පැමිණියේය.

සිතූ දෙය සිදු නොවේ. නොසිතූවක්ම සිදුවේ. මහානෝන්ජල් රජු වහාම ඉදිරියට ගොස් මහල්ලා පිළිගත්තේය.

"ඔබ කළ ඒ වීර ක්‍රියාව ගැන මම පුදුමයෙන් පුදුමයට පත්වීමි. රජවරුන් වන අප කා හට වුවත් දුන් පොරොන්දු එලෙසම ඉටු කළ යුතුවෙයි. එබැවින් මම ද කුමරිය ඔබට සරණ පාවා දෙමි. බෑණනුවනි, ඔබගේ පැල්පතෙන් අදම නික්ම විත් මාගේ මාළිගයේ වාසය කරනු මැනවි. එහෙත්, මට ඔබෙන් ඇසිය යුතු එක්

ප්‍රශ්නයක් ඇත. නුඹ මෙවැනි නිර්භීත තීරණයක් ගත්තේ කෙලෙසද යන්න මට දැන් පහදා දිය යුතුය."

ඒ වන විට මහල්ලා දියබත්ව හොඳටම වෙවුලමින් සිටියේය. හේ වෙව්ලමින් බිඳුණු හඬින් යුතුව මෙසේ කීය.

"මහරජ තුමනි, අසූවයස් පිරුණු මහල්ලකු වන මට නුඹගේ දූ කුමරියගෙන් පලක් නැත. එහෙත්, මට මේ උදව්ව කරනු මැනමි. මා විලට තල්ලු කළේ කවුදැයි සොයා බලා ඔහුට සුළු තරවටුවක් කරනු මැනවි."

මහල්ලාගේ ප්‍රකාශය ඇසූ මහානෝන්ජල් රජු එවේලේම ළය පැළී මිය ගියේය.

මටද කීමට ඇත්තේ එවැනි කතාවකි. සමාජයේ වෙසෙන උගතුන් යයි කියාගන්නා පිරිස් බුදුදහම ගැන කියන කතා විමසිල්ලෙන් කියවූයෙමි. ඔවුන්ගේ තර්ක විතර්ක විචාරයන් ආදිය ප්‍රවේසමෙන් සලකා බැලීමි. බුදුදහම ගැන මා සතු ගැඹුරු අන්තර්ඥානය සමඟ හැරෙන්නටවත් ඔවුන්ට නොහැකි බැව් මම කෙටි කලෙකින්ම පසක් කර ගතිමි.

එක් එක් සූත්‍ර ධර්මයන් ගැනත් බෞද්ධ නිකායයන්හි එන ඉගැන්වීම් ගැන මා සතු දැනුමට අභියෝග කරනු තබා ප්‍රශ්නයට ගැළපෙන උත්තරයක් දීමේ හැකියාව පවා කට කියවන බොහෝ දෙනෙකුට නොමැති බව පසක් කර ගතිමි.

වාද විවාදවලදී අනෙකාට ගරහා ලකුණු දා ගැනීම සැබෑ දිනුමක් නොවේ. මැර බලය යොදා වාද විවාදවලට එන්නන් දුර්මුඛ කිරීම දක්ෂකමක්ද නොවේ. ඕනෑම ජගතෙක් ඕනෑම වියතෙක් බුදුදහම ගැන මා හා

විවාදයට එන ලෙස මා විසින් මින් පෙර වාර කිහිපයකදී අභියෝග කර ඇත. ඒ අභියෝගය භාරගත් පිරිස් වට දෙකක් තුනක් යන විට පරුෂ වචනවලින් මට බැණ වැදී හෙමිහිට ලිස්සා ගියහ.

කිසිවකු හෝ ඉදිරියට පැමිණ බුදුදහම බේරා ගනීවි යැයි මම විශ්වාස කළෙමි. බුදුදහම බේරා ගන්නට ඉදිරියට පැන්න අය එක්කෝ තමන් වටේ සෙනඟ රැස්කරගෙන බුදුදහම කැබලිවලට ඉරා දැමූහ. නැතිනම් ඔවුහු මහ සද්දයෙන් පටන්ගෙන අවසානයේ හීන් කෙඳිරියකින් ගමන අවසන් කළහ.

කිසිවකු හෝ බුදුදහම බේරා ගන්නට සමත් නොවන තැන මම හීන් කෙඳිරියකින් එම කටයුත්ත ආරම්භ කළෙමි. මා වටා සෙනඟ එක් කරනු වෙනුවට බුදුදහම සම්පූර්ණයෙන් හදාරා ප්‍රතිසංවිධානය කළෙමි. අද බොහෝ දෙනෙකු බය සැක නැතිව මාර්ගඵල ගැන කතා කරනුයේ දැනට දශකයකට පෙර මා විසින් අරඹන ලද පෙරස්ත්‍රොයිකාවේ ඍජු ප්‍රතිඵලයක් ලෙසය.

මුල් බුදුසමය නැවතත් බබළවන්නට ප්‍රතිසංවිධානයක් හෙවත් පෙරස්ත්‍රොයිකාවක් සිදු කිරීම අත්‍යවශ්‍ය වෙයි. බුදුදහම වටා බලහත්කාරයෙන් එල්ලන ලද දේව ඇදහිලි ඉවත් කළ යුතු වෙයි. බුදුදහමට අලුතින් එකතු කළ විසූකදස්සනයන් සියල්ල වහා දුරු කළ යුතුය. එවැනි විසූක දස්සනයන් මැස්කරේඩ් යන නමින් සුද්දෝ හඳුන්වති. බෞද්ධ ඇදහිල්ල බ්‍රසීලයේ සම්බා සැණකෙළියක තත්ත්වයට මාරු වීම අතිශයින්ම ශෝචනීය වේ. බෞද්ධයන්ට හරිමඟ කියා දිය යුතුය. මෙතෙක් කල් දණින් වැටී ජීවත් වූ බෞද්ධයන් යළි සිය දෙපය මත නඟා සිටුවිය යුතුය. බුදුදහමේ ඒහිපස්සික ගුණය මතුවන්නේ එවිටය.

දුප්පතුන් සාගින්නේ හඬද්දී ඔවුන් ගැන තුට්ටුවකට මායිම් නොකරනවුන් දන්සැල් දමා වෙසක් පෝයට බලහත්කාරයෙන් කන්නට බොන්නට දෙන්නේ ලංකාවේ පමණි. ස්වාමීන් වහන්සේලා වැරහිලි අඳිද්දී ගඩොල්වලට ඇඳුම් අන්දවන්නේ ලංකාවේ බෞද්ධයන් පමණි. සතා සීපාවා කුසගින්නේ හඬද්දී මුළු රටක පලතුරු එක් තැනක ගොඩගසා සතුටු වන්නේ අපේම ඇත්තන් පමණි. ශ්‍රී ලංකාවාසී බෞද්ධයනි, ධර්මයේ ඒහිපස්සික ගුණයට නුඹලා අපහාස කරනවා නොවේද? නුඹලාගේ අඥාන ක්‍රියා දකින අන්‍යාගමිකයන් බුදුදහමට ගරහන බව සිහිපත් කළ යුතු නොවේද?

මම පෙරකී පැහැදිලි කරදීම යළි අරඹමි. මා විසින් අද වන විට ලියා පළ කරන්නට යෙදුණු බෞද්ධ ග්‍රන්ථ සංඛ්‍යාව හැත්තෑවකි. ඒවායෙන් කොටසක් නොමිලයේම බෙදා හරිනු ලැබීය. ඒ සෑම කෘතියකින්ම අරමුණු කළේ එකම එක ප්‍රධාන ඉලක්කයකි. නිර්වාණගාමී ප්‍රතිපදාව පැහැදිලිව පිරිසිදුව නිරවුල්ව හෙළිකිරීම ඒ පොත් ලිවීමේ අරමුණ විය. මම නිවන වටේ ඇවිද්දවන ථෙරවාදී සම්ප්‍රදාය වෙනුවට මුල් බුදුසමය ඇසුරෙන් පැහැදිලි මාවතක් විවර කර දුනිමි. බෝසත්වරුන් සැබෑ ධර්මධරයකු වන මා හමුවට නොපැමිණ වෙන කවුරුන් හමුවන්නද?

මංජු ශ්‍රී බෝසතුන් තනිව මා හමුවට පැමිණියත් දින කිහිපයක් යන විට තවත් බෝසතුන් කිහිප පොලක් පැමිණියහ. බෝසත්වරුන්ගේ ඉගැන්වීම් සියල්ල පාහේ මා විසින් මනාව ලියා පොත් ලෙස සකස් කර ඇත. ඒ සියලු ඉගැන්වීම් අතරින් වජ්‍රසත්වයන්ගේ මාර්ගඵල හා සසර ගමන පිළිබඳ රහස් වෙසෙසින් කැපී පෙනෙයි. වජ්‍රසත්වයන්ගේ ඉගැන්වීම් සියල්ලම පාහේ වජ්‍රසත්ව

සූත්‍ර නිර්දේශය යන නමින් මා විසින් මුද්‍රණය කර නොමිලයේ බෙදා හරිනු ලැබීය. බොහෝ දෙනෙකුගේ ඉල්ලීම් ඉටු කරනු පිණිස වජ්‍රසත්වයන්ගේ ඉගැන්වීම් ගැන කරුණු කිහිපයක් මෙහි පහත සටහන් කරමි.

කියන්නට තියෙන දේ මුහුණටම කියන වජ්‍රසත්ව මාරයාටවත් බය නැත. හේ 'කච්බෝයි සම්ප්‍රදායේ' දරදඬු බෝධිසත්වයෙකි. තමන්ට නිරපරාදේ අපහාස කරන කෙනෙකුට උපරිම දඬුවම් ලැබීමට සැලැස්වීම ඔහුගේ එක් අමුතු ලක්‍ෂණයකි. ඔහු කියන අනාවැකි කෙස් ගහටම ඇත්ත වෙයි. හේ මෙරට සිදුවන ආණ්ඩු පෙරළි ගැන මෙන්ම තනතුරු මාරු ගැනද අනවැකි කීය. ඒ අනාවැකි ටක්කෙටම හරි ගිය බැවින් වජ්‍රසත්වයන් ගැන මසිතෙහි ඇත්තේ කියා නිම නොකළ හැකි තරම් ප්‍රසාදයකි.

අපි දැන් වජ්‍රසත්වයන්ට සවන් දෙමු.

"පින්වත නිවන් මඟට පිළිපන් පිරිස් ඒ මගෙන් ඉවතට හැරවීම මහත් පාපයකි. මිත්‍රභේදය දරුණු පාප කර්මයකි. තහවුරු නොකළ ආගමික මතවාද පසුපස යාම අනාගත බියට හේතුවකි. තහවුරු නොකළ ආගමික ව්‍රතයන් සමාදන්වීමෙන්ද ඒවායෙහි මිනිසුන් යෙදවීමෙන්ද වැළකිය යුතුය."

මෙහි වජ්‍රසත්වයන් අමතන්නේ බෞද්ධයන්වය. තහවුරු නොකළ ආගමික ව්‍රතයන් යන්නෙන් අදහස් කරන්නේ අද කෙරෙන විච්චූර්ණ පූජා ආදියයි. හතු පිපෙන්නාක් මෙන් අලුතින් හඳුන්වා දෙන විවිධාකාර පූජා ක්‍රමවලින් සසර දිගු කරන බැවින් ඒවායේ යෙදීම වජ්‍රසත්වයන්ගේ උපදෙස්වලට පටහැනි වෙයි. වහාම සමථ විදර්ශනා භාවනා කර මාර්ගඵල උපදවාගැනීමේ වැදගත්කම වජ්‍රසත්වයෝ මෙසේ කියති.

"මරණින් මතු මිනිසකුව උපදින්නේ දෙසීයකින් එක්කෙනෙකු වැනි සුළු සංඛ්‍යාවකි. දෙව්ලොව උපත ලබනුයේ හයදහසකින් කෙනෙකි. බඹලොව උපදිනුයේ පනස්දහසකින් කෙනෙකි. අහෝ සසරෙහි බියකරු බව බලනු මැනවි. ඉතිරි සියලු දෙන මරණින් මතු අපාගත වෙති."

වජ්‍රසත්වයන් මේ කියන සංඛ්‍යා ලේඛන බෞද්ධයන් ගැන සලකා බලා කී බව මම සිතමි. ඒ අබෞද්ධයන් බඹලොව ගියද දෙව්ලොව යාම විරල බැවිනි. වජ්‍රසත්ව තනිකරම කතා කරන්නේ බෞද්ධයන්ගේ සුබසෙත ගැනය. ඔවුන්ගේ මතු ආරක්ෂාව ගැනය.

අප රටෙහි වෙසෙන සමහර බෞද්ධයන් වැරදි ප්‍රතිපත්තීන්ට හසුව නිරපරාදේ සසර දිගුකරගන්නා බව වජ්‍රසත්වයන්ගේ මතයයි.

"අද බොහෝ දෙනෙක් පින්කම් කර අවසානයේ මෙපින් බලෙන් මතු බුද්ධ ශාසනයක රහත්බව ලැබේවා යනුවෙන් ප්‍රාර්ථනා කරති. මේ ප්‍රාර්ථනය දෝෂ සහගතය. බුදුපසේ බුදු මහරහත් යන ත්‍රිවිධ යානයෙන්ම සසර දුක කෙළවර කළ හැකිය. යමකු මතු රහත් බව පැතුවොත් ඉතිරි යානා දෙක ප්‍රතික්ෂේප කළ හා සමාන වෙයි. බුදුවන්නට පින් තිබුණද බුදුබව ප්‍රතික්ෂේප කළ බැවින් එතැනට යා නොහැකිය.

අබුද්ධෝත්පාද කාලවල සමහර පිරිස් පසේ බුදුවරුන් ලෙස සසර දුක කෙළවර කරති. රහත් බව පමණක් ප්‍රාර්ථනා කළ තැනැත්තාට එම විකල්පයද අහිමි වෙයි. තනිකර රහත් බව ප්‍රාර්ථනා කරන තැනැත්තා අපායෙහි දුකට වුව වැටිය හැකිය. ඔහු මේ භවයේ

මාර්ගඵල නොලදහොත් මරණින් මතු සරණාගමනය බිඳෙයි. එයින් ඔහු නැවත අපායේ ඉපදීමට සුදුස්සකු බවට පත් වෙයි."

මේ කරුණුවල ඇත්ත නැත්ත ගැන කෙනෙකුට මා හා වාද විවාද කරන්නට සිත් දෙනු ඇත. මේ ඉගැන්වීම් තර්ක කර බිඳ හෙළන්නට සිතෙනු ඇත. ඉතින් අපි වාද කරමු. හැබැයි මේ ලිපි පෙල තුළින් නොවේ. අපි ප්‍රසිද්ධියේම වාද කරමු. සියලු ප්‍රතිවාදී මත දරන අය එක් පිලකට එන්න. මම තනිව ඒ සියලු දෙනා හා වාද කර පරදමි. මන්ද, මා සිටිනුයේ සත්‍යය පැත්තෙහිය. මා සිටිනුයේ සදාචාරය පැත්තෙහිය. මා සිටිනුයේ අවිහිංසාවාදය පැත්තෙහිය. මා සිටිනුයේ තර්කන බුද්ධිය පැත්තෙහිය. මා සිටිනුයේ පිරිසිදු බුදුදහම පැත්තෙහිය.

මාගේ ඒකායන ඉලක්කය වසර පන්දහසක් කල් බුදුසසුන පැවතෙන ප්‍රායෝගික වැඩපිළිවෙළක් සකස් කර ඉදිරිපත් කිරීමයි. එය පිළිගැනීම හෝ නොගැනීම ඔබට බාරය. බුද්ධ ශාසනය බේරා ගැනීම මට තනිව කළ හැක්කක් නොවේ. මම බෝසත්වරුන්ගෙන් අසා දැනගත් අක්ෂෝභ්‍ය පාලන තන්ත්‍රය මෑතකදී හෙළි කළෙමි. මම කිසිදු නිකායකට අයත් නොවූ සුපිරිසිදු සද්ධර්මය ඉදිරිපත් කරමි. සැබෑම තොරතුරු හෙළි කරමි.

සත්‍යයට පාටක් නැත. හැඩයක් නැත. රසක් නැත. පුද්ගල භේදයක් හෝ කාලභේදයක් ඊට නැත. ඒ සත්‍යයට ඉඩ දෙන්න.

# 08

## සෝවාන් ඵල සහතික ලියා දෙන බෝසත්වරු

ප්‍රසුගිය කාලවකවානුවේ පැවති අයහපත් කාලගුණය ගැන වැදගත් යමක් ලියා තබන මෙන් බොහෝ දෙනෙක් මගෙන් ඉල්ලුම් කරති. ඒ ඉල්ලීම් අතරට තවත් එක් දුරකථන ඇමතුමක් පැමිණියේය.

"මහත්තය අවුරුදු කීපෙකට කලියෙන් පත්තරවලින් කියූ අනාවැකි දැන් එක එක ඇත්ත වෙනවා. මම මතක් කරන්නයි ගත්තෙ. මම ඒ ලිපි සේරම කපල තියාගෙන එකිනෙක නැවත කියවනවා. මහා ගංවතුරක අනතුරක් ගැන මහත්තය පැහැදිලි අනාවැකියක් කියල තියෙනවා."

ඔහු කී දේ සැබෑය. පිටසක්වළ බෝසත්වරුන්ගේ උපදෙස් පරිදි මහා ගංවතුරක් ගැන ලියා තැබීමි. පෘථිවිය වෙත ඇදී එමින් පවතින ග්‍රහකයක් ගැන ලියා තැබීමි. හරියටම ලංකාව හරහා තැනෙන අලුත් භූ තැටියක් ගැන ලියා තැබීමි. ඒ අලුත් භූ තැටිය හේතුවෙන් වසර හාරසීයක් ඇතුළත ලංකාද්වීපයේ පැත්තක් ගිලා බැසීමේ අනතුරක් ගැන කීවෙමි. මේ සියලු අනාවැකි අද වන විට කොටසෙන් කොටස ඇත්ත වෙමින් පවතියි.

ඔබ පිළිගත්තත් පිළි නොගත්තත් ලංකාද්වීපයට යටින් පොළොව දෙබෑ වෙමින් පවතියි. එම ව්‍යසනයේ පළමු දූත ලක්ෂණ ලෙස වැල්ලවායේ සිට මාතලේ දක්වා දරුණු භූ පැලුම් ඇතිවීමට නියමිතය. මහා නායයාම්වලට එක් හේතුවක් වන්නේ තවම පිටට නොපෙනෙන ඒ භූ පැල්මයි.

එනමුත් මා කියන මහා ගංවතුර තවම පැමිණියේ නැත. පසුගිය දිනක ඇතිවූ මහා ගංවතුර දේශපාලකයන් විසින් තනන ලද එකකි. එය ස්වභාවික ආපදාවක් නොවේ. දේව ශාපයක ප්‍රතිඵලයක්ද නොවේ. ඒ ගංවතුර ඉවක් බවක් නොමැතිව මෙරට සිදුකෙරෙන පාරිසරික හානිවල සෘජු ප්‍රතිඵලයකි.

ගංගාවල මාර්ගයන් හරස් කර වේලි ඉදි කරන විට වේල්ලෙන් ඉහළට ජලාශයක් නිර්මාණය වෙයි. දක්ෂිණ අධිවේගී මාර්ගය තනා ඇත්තේ මාතර සිට කොට්ටාව දක්වා ඉදිකළ දැවැන්ත වේල්ලක් මතය. දැඩි වර්ෂාවක් ඇතිවන විට ඒ වේල්ල හරහා ඉක්මනින් වතුර බැස්සවීමට ක්‍රමයක් නැත. මෙවර ගංවතුරෙන් මෙපමණ විපත් ඇතිවීමට ඒ හේතුව ඇතුළු තවත් පාරිසරික සාධක කිහිපයක්ද මුල්වී ඇති බව පැහැදිලිව පෙනෙන්නට ඇත.

අපේ ප්‍රධාන මාතෘකාව බෝසත්වරුන් ගැනය. අපි බෝසත්වරුන් ගැන පුදුම හිතෙන දේ කතාබහ කළෙමු. පිටසක්වළ බුදුවරුන් ගැන උන්වහන්සේලාගේ කරුණා ගුණය ගැන දිගින් දිගටම ලියූවෙමු. පිටසක්වළ බුදුවරුන් වැඩ සිටින බව සූත්‍ර පිටකය තුළින්ම කරුණු සනාථ කර පෙන්වූයෙමු. පිටසක්වළ ජීවීන් සමඟ කතාබහ කළ බෞද්ධ භික්ෂූන්වහන්සේලා ගැන තොරතුරු ඉදිරිපත් කළෙමු. මා සාග ලෝකවාසී නිල් පැහැ රුධිරය ඇති මිනිසුන් ගැන කී කතා ටිබෙට් පතපොතෙහි එලෙසම

සඳහන් වෙයි. අනුරුද්ධ තෙරුන්වහන්සේ දිවැසින් දුටු පිටසක්වළ ජීවීන්ද නිල් පැහැය ගත් බවට විස්තර ඇත.

පිටසක්වළ බෞද්ධ නායකයන් අපේ ඇත්තන්ගේ ජීවිතවලට මැදිහත්ව කුමන ආකාරයේ විප්ලවයක් කරන්නට උත්සාහ කරන්නේද යන්න මෙතැනදී මතුවන වැදගත් ප්‍රශ්නයකි. මා කලින්ද මතක් කළ පරිදි පිටසක්වළ බෞද්ධ නායකයන්ගෙන් වැඩි කොටස බෝසත්වරු වෙති. ඔවුන් බුද්ධත්වය ලැබීමට පෙර බෝධිචර්යාවේ නිරත විය යුතුය. බුද්ධ ශාසනය නඟා සිටුවීම බෝධිචර්යාවේ එක් අනිවාර්ය අංගයකි. බෝසත්වරුන් කියන පරිදි බුද්ධ ශාසනයේ දියුණුවට වැඩ කරන තරමට බෝසත්වරුන්ගේ තෙද බල වැඩිදියුණු වෙයි. අන් බෝසත්වරුන් අතර පිළිගැනීම වැඩි වෙයි. එබඳු උසස් ගණයේ බෝසත්වරුන්ට අමිතාභය බුදුන්ගේ ආදරය කරුණාව නිතැතින්ම ලැබෙයි. ඔවුහු අමිතාභය බුදුන්ගේ පණිවිඩකරුවන් ලෙස තෝරා පත් කර ගැනෙති. අමිතාභය බුදුන්ගේ පණිවුඩකරුවකු ලෙස ස්ථිර පත්වීම් ලැබීම ඉතා වාසනාවන්ත සිද්ධියකි.

අමිතාභය බුදුන්වහන්සේ අප දන්නා විශ්වය තුළ සිටින සියලු බෞද්ධයන්ගේ අසහාය නායකයාය. අනන්ත සක්වළ අපරිමිත ලෝකධාතු සංඛ්‍යාවක් උන්වහන්සේගේ ආඥා ක්ෂේත්‍රයට ඇතුළත්වෙයි. ඒ කවර හෝ තැනක බුදුවරයකු පහළ වීම අමිතාභය බුදුන්වහන්සේගේ දිවැසට විෂය වන කරුණකි. යම් ලෝකධාතුවක බුදුවරයකු පහළ වූ තැන් පටන් අමිතාභය බුදුහු ඒ ලෝකධාතුව ගැන විමසිල්ලෙන් සිටිති. ඒ බුදුවරයාගෙන් පසු ඒ ශාසනය බොහෝ කල් රැකදීම අමිතාභය බුදුන්වහන්සේ විසින් තම යුතුකමක් ලෙස ඉටුකරනු ඇත.

ඇයි අමිතාභය බුදුන්වහන්සේට පමණක් එවැනි විශේෂ වගකීමක්? ඔබ මගෙන් අසනු ඇත. ඊට පිළිතුරු මෙසේය. අමිතාභය බුදුන්වහන්සේ වැඩ සිටින සුඛාවතියෙහි වෙසෙන්නන්ගේ ආයුෂ බොහෝ දීර්ඝය. අදින් කල්ප අනූ එකකට පෙර විපස්සී බුදුන්වහන්සේගේ කාලයේදීත් අද මෙන්ම අමිතාභය බුදුහු වැඩ වාසය කළහ. මතු මෛත්‍රී බුද්ධශාසනය පහළ වී එය අවසන්ව කල්ප විනාශය සිදුවුවද සුඛාවතියට එය බල නොපායි. එය දුරස්ථ ලෝකධාතුවකි. එහි කාල ගණනය අපේ කාලයට වඩා බොහෝ සෙමින් සිදුවන්නකි. උන්වහන්සේ සහ සමන්තභද්‍රතුමා විශ්ව බෞද්ධ එකමුතුවෙහි ආදීතම නායකයෝ වෙති.

බොහෝ ආයුෂ ඇති අමිතාභය බුදුන්වහන්සේ දුරස්ථ සක්වළ වෙසෙන බෝසත්වරුන් හා බුදුවරුන් අතර සන්නිවේදනයෙහි යෙදෙති. එලෙස සන්නිවේදනයෙහි යෙදෙමින් බුදුදහම ප්‍රචලිත කිරීමට හැකි සෑම පියවරක්ම ගනිති. බෞද්ධයන් විපතින් ගලවා ගැනීමට හැකි සෑම පියවරක්ම ගනිති.

පෘථිවියේ වෙසෙන අයකුට අමිතාභය බුදුන් වහන්සේ දර්ශනය වීම කළාතුරකින් හෝ සිදුවන ඉතාම තීරණාත්මක සිදුවීමකි. අමිතාභය බුදුන්වහන්සේ දර්ශනය වූ සෑම අවස්ථාවකදීම බුද්ධ ශාසනයේ දැවැන්ත ප්‍රතිසංවිධානයක් සිදුවෙයි. බෝසත්වරුන් කියන පරිදි මා අමිතාභය බුදුන්වහන්සේගේ පළමු නියෝජිතයා නොවන්නේය. මට පෙර තවත් මෙලෝවාසීන් කිහිප දෙනෙකුට අමිතාභය බුදුන්වහන්සේ දර්ශනය වී නිවැරදි ධර්ම මාර්ගය නැවත හැර දෙනු ලැබීය.

ඔඩ්ඩියාන දේශයේ පද්ම සම්භව කුමාරයා වජ්‍රයාන බෞද්ධ සම්ප්‍රදායේ ආරම්භකයා වෙයි. අමිතාභය

බුදුන්වහන්සේ සමඟ සෘජුව ගනුදෙනු කිරීමේ හැකියාව ඔහු සතු විය. ටිබෙට් බුදුදහමට අයත් නයින්ග්මා සම්ප්‍රදාය ඇරඹුණේ පද්ම සම්භවගේ ඉගැන්වීම් පදනම් කරගෙනය.

පුල්ලහාරියේ තිලෝපා මුනිවරයා දෙවන වජ්‍රයාන පරම්පරාවේ ආරම්භකයා වෙයි. දෙවන වජ්‍රයාන පරම්පරාව බිහිකිරීමේ මූලිකයා සමන්තභද්‍ර මුනිවරයාය. සමන්තභද්‍රතුමා අමිතාභය බුදුන්වහන්සේගේ සමීපතම සගයෙකි. එකිනෙකින් බොහෝ ඈත ලෝකධාතුවල සිටින ඒ දෙමිත්‍රයන් අතර සංවාදයන්හි ප්‍රධාන මාතෘකාව බුදුසසුනෙහි චිරස්ථිතියයි. තිලෝපා, නාරොපා, මර්පා, මිලාරෙපා, ගම්පෝපා, රෙචුංපා යන මහා යෝගීහු දෙවන වජ්‍රයාන පරපුරට අයත් වෙති. තිබ්බත බුදුදහමට අයත් කග්යුත්ප පරම්පරාව ඔවුන්ගෙන් පැවත එන්නකි.

වජ්‍රයාන බුදුදහම ලාංකේය උගතුන්ට බොහෝ ආගන්තුකය. සමහරු එය මහායානයේම කොටසක් ලෙස වරදවා සලකති. වජ්‍රයානය හා මහායානය සමකර සැලකීම ප්‍රබල ලෙස දෝෂදර්ශනයට ලක්විය යුතු වරදකි. මෙඅත්බැව්හි සසර දුක කෙළවර කරන කිසිදු උපායක් මහායානයට ඇතුළත් නොවේ. එනමුත් කග්යු වජ්‍රයාන සම්ප්‍රදාය අනුව බුදු පසේබුදු මහරහත් යන පදවි තුනට පිළිගැනීමක් ඇත. කග්යු සම්ප්‍රදායේ එන ත්‍රියාන සංකල්පයට අනුව තමන්ට කැමති යානයක නැඟී සසර දුක කෙළවර කළ හැකිය. නයින්ග්මා වජ්‍රයාන සම්ප්‍රදාය අනුව නිවන් දැකීමේ මාර්ග නවයකි. ඒ මාර්ග නවයට විවිධ තාන්ත්‍රික උපක්‍රමයන්ද ඇතුළත් වෙයි.

දැන් අපි ප්‍රධාන මාතෘකාවේ හරි මැදට පිවිසෙමු. බෝසත්වරුන් හා බුදුවරුන් කෙළින්ම මා හා ගනුදෙනු

කිරීම මා විසින් සාධාරණීකරණයට ලක්කළ මැනැවැයි සිතේ. අපි දැන් ඒ අපූරු විස්තරයට සංවේදී වෙමු.

මා උපතින් බෞද්ධයකු හෝ කතෝලිකයකු නොවේ. මම උපතින් බෞද්ධයකු යැයි වෙමියි කීමට තරම් සුදුස්සකු නොවීමි. මන්දයත් උපතින් බෞද්ධයකු වන්නේ ජාත සෝතාපන්නයකුම පමණි. ජාත සෝතාපන්නයකු යනු පෙර භවයේ සෝවාන්ව සිට නැවත මෙහි උපදින අයෙකි. සෝවාන් වීමෙන් පසු සරණාගමනය නොබිඳෙයි. එබැවින් සෝතාපන්නයා යළි උපදිනුයේ බෞද්ධයකු හැටියටය.

මම ඉතා ළාබාල අවධියෙහි පොහෝ දිනවල මිත්තණිය සමඟ පන්සල් යාමට හුරුව උන්නෙමි.

"කාටද අත්තම්මෙ රහතන්වහන්සේලා කියන්නෙ?"

"රහතන්වහන්සේල කියන්නෙ අහසින් යන්න පුළුවන් හාමුදුරුවරුන්ට."

ඒ විස්තරය අසම්පූර්ණ වුවද කුඩා දරුවකුට මීට වඩා ගැඹුරින් එය තේරුම්ගත නොහැකිය.

"ආත්තම්මෙ දැන් රහතන් වහන්සේල වැඩ ඉන්නවද?"

"දැන් කොයින්ද පුතේ රහතන් වහන්සේල. උන්වහන්සේල සේරම පිරිනිවන් පාල ඉවරයි."

"ආත්තම්මෙ දැන් කෙනෙකුට උත්සාහ කළොත් රහත් වෙන්න බැරිද?"

"දැන් රහතන් වහන්සේලගෙ කාලෙ ඉවරයි පුතේ."

එකල්හි මාගේ වයස අවුරුදු හතරක් නැත්නම් පහක් පමණ යැයි සිතේ. රහතන් වහන්සේලා ගැන මා

සිත්හි පහළ වූ පහන් හැඟීම කෙතෙක් තියුණු වීද යත් මම එවේලේ හයියෙන් කෑ ගහන්නට පටන් ගතිමි.

"ආත්තම්මේ මම කොහොම හරි රහතන් වහන්සේලාගේ දකිනවා. ආත්තම්මේ මම ආසයි රහතන් වහන්සේලා ගේ උඩින් ඇතට ඇතට පියාඹල යනව දකින්න."

"හොඳයි පුතේ. එහෙනම් පුතාවත් ඒ වැඩේ භාරගෙන කරන්න."

මම ආත්තම්මාගේ අභියෝගය නොපැකිළ භාර ගතිමි. මට එතැන් සිට අවශ්‍ය වූයේ රහතන් වහස්සේලා අහසින් වඩින කාලයක් යළි ඇති කිරීමයි. කල්යත්ම මට ඇතින් ඉතා පැහැදිලි කටහඬවල් ඇසෙන්නට විය.

"ඔබට අනාගතයේ බුදුදහම ගැන වැදගත් කාර්ය භාරයක් ඉටු කිරීමට සිදුවෙයි. පළමුව ඔබ උගතකු බවට පත්විය යුතුය. ඔබ කියන්නට යන දේ මිනිසුන් පිළිගන්නා තරමට ඔබ උගතෙකු විය යුතුය." එනමුත් මා කියන්නට යන දේ ගැන කල්තබා දැනුවත්ව නොසිටියෙමි. මම රහතන් වහන්සේලාගේ යුගය ඇති කරනු පිණිස දිගින් දිගටම බුදුදහම හැදෑරුවෙමි. මට හැකිතාක් ගුරුවරුන් සොයාගොස් ඔවුන්ගෙන් ගුරුහරුකම් ගතිමි.

දිගින් දිගටම බුදුදහම හදාරන විට මට ඉතාම වැදගත් දෙයක් ප්‍රත්‍යක්ෂව අවබෝධ විය. ලංකාවාසී බෞද්ධයන් වන අප මෙතෙක් අදහන ලද දේ බුදුදහම නොවේ. බුදුදහමෙන් පෝෂණය වූ ගෝත්‍රික ඇදහිලිවල එකතුවකි. මා විසින් ඒ අපූරු නිරීක්ෂණය කරන තෙක් කිසිවකු හෝ ඒ ගැන ප්‍රසිද්ධියේ නොකීම මම අදටත් පුදුමයක් කොට සලකමි.

මම මේ ලිපි පෙළ තුළින් කියන ඕනෑම ඉගැන්වීමක් ඔප්පු කර පෙන්වීමේ සූදානමින් සිටිමි. මා කියන ධර්ම කරුණු ඒ තරමටම නිවැරදිය.

අපි අද ඕනෑවටත් වඩා ගෝත්‍රික ආගම් පැත්තට බරව සිටිමු. මුල් බුදුසමයෙන් පවරා දුන් යුතුකම් සියල්ල අද වන විට අමතකව ගොස් ඇත. මුල් බුදුසමය අනුව සෝවාන්වීම බෞද්ධයකුගේ පරම යුතුකමයි. එය බෞද්ධයකු වීමේ අවම සුදුසුකමයි. අර්හත්ඵලයට පත්වීම පැවිද්දකුගේ පරම යුතුකමයි. "මේ එළඹ ඇත්තේ ගෞතම බුද්ධ ශාසනයයි. මේ බුදුසසුනෙහි වෙසෙන යම් පැවිද්දකු අර්හත්ඵලයට පත් නොවූවොත් ඒ පැවිද්දා නිග්‍රහ ලබන්නට සුදුස්සෙකි. මේ බුදුසසුන කාලයේ සිටින ගිහියකු අවම වශයෙන් සෝවාන්ඵලයට පත් නොවූවහොත් ඔහුද නිග්‍රහ ලබන්නට සුදුස්සෙකි" යනුවෙන් ඛුද්ධක නිකායෙහි සඳහන් කර ඇත.

එනමුත් අපේ රටේ බෞද්ධයන් යයි කියා ගන්නා අති බහුතරය තවමත් මාර්ගඵල ගැන උනන්දුවක් නොදක්වති. මාර්ගඵල ලැබීම තමන්ගේ පරම යුතුකම බව නොදනිති. තමන්ගේ පරම යුතුකම නොදත් යතිවරු තමන් බුදුදහමේ අයිතිකරුවන් බව රටට පෙන්වන්නට නිසරු මාධ්‍ය සන්දර්ශන පෙන්වති. එය පීනන්නට නොදත් අය ගොඩ පීනමින් මිනිසුන් රැවටීම වැනි මුග්ධ ක්‍රියාවකි.

බුද්ධ ශාසනය මේ වන විට අප රටෙන් අතුරුදන්ව ඇත. දැන් ඇත්තේ බුද්ධ ශාසනය නොව, එහි ඡායාමාත්‍රයකි. මම දැන් ඒ ප්‍රකාශයද පහසුවෙන් ඔප්පු කර පෙන්වමි. බුද්ධ දේශනයේ සංයුක්ත නිකායේ සූත්‍ර සසඳා බලන කල්හි බෞද්ධයකු වීමට නම් අවම වශයෙන් සෝවාන්ඵලයට වත් පැමිණිය යුතුය. බෞද්ධයකු යනු

දිවි හිමියෙන් බුදුන් සරණ ගිය අයෙකි. දිවි හිමියෙන් දහම් සරණ ගිය අයෙකි. දිවි හිමියෙන් ආර්ය සංඝයා සරණ ගිය කෙනෙකි. අවම වශයෙන් සෝතාපන්න ඵලයට පැමිණි කිසිවකු බෞද්ධයකු නොවන අතර, මරණින් මතු ඔවුන්ගේ සරණාගමනය බිඳී අබෞද්ධයන් බවට පැමිණෙති. මේ කරුණ බෝධිසත්වයන්ට පවා බලපාන බව සූත්‍ර පිටකයේ එන කරුණු අනුව පෙනෙයි.

බෞද්ධයකු හෙවත් සෝතාපන්න ඵලයට පැමිණියකු නොකරන වැරදි නවයක් වෙයි. ඉන් එක් වරක් නම් අන් ශාස්තෘවරයකුගේ සරණ යාමයි. සරණ යාම යනු පිහිට පැතීම හා සමාන දෙයකි. අපේ බෞද්ධයන්ට ශාස්තෘවරුන් දුසිමක් පමණ වෙති. අප රටේ අදහන දෙවිවරුන්ගෙන් අති බහුතරය හින්දු දේවකථාවන්හි එන ප්‍රධාන නළුවන් වන අතර, ඉතිරි දේව චරිත සියල්ල ගෝත්‍රික ඇදහිලිවල ශේෂයන් බව පැහැදිලිය. විෂ්ණු දෙවියන් ගැන හෝ ස්කන්ධකුමාර දෙවියන් ගැන සූත්‍ර විනය අභිධර්ම යන තුන්පිටකයේ කිසිදු තැනක හමු නොවේ. අසවල් අසවල් දෙවියන්ට බුදුසසුන බාරකළ බව අපේ ඇත්තන් කියතත් උන් එකෙක්වත් ඕනෑ වෙලාවට ළඟ නැත. අපේ දේශපාලන නායකයන් පවා දුකේදී සැපේදී දුවන්නේ තිරුපති කෝවිලට මිස ගමේ පන්සලට නොවේ. ගමේ පන්සලත් ආගන්තුක දෙවිවරුන් විසින් ආක්‍රමණය කර උන්ගේ භුක්තියට සවිකරගෙන ඇත.

ත්‍රිපිටක ධර්මයෙහි එන සැබෑ බුදුදහම දේව කන්නලව් නැති තමන්ගේම විමුක්තිය තමන්ම සලස්වා ගැනීමට උගන්වන එකකි. එනමුත් අපේ ඇත්තන් සියලුම වැදගත් කරුණුවලදී දෙවියන්ට මුල් තැන දෙති.

බෝසත්වරුන් මා හට උපදෙස් දී ඇති පරිදි සදෙව්ලොව වෙසෙන කිසිම උසස් දෙවියකුට මිනිසුන්ගේ පූජා වට්ටිවල ඇති ආහාර රස බැලිය නොහැකිය. දෙවියන්ට ඔවුන්ටම පමණක් විෂය වූ දේව ආහාර ඇත. බෝසත්වරුන් කියන පරිදි පූජාවට්ටිවල ඇති ආහාර පරදත්තුපජීවී ප්‍රේතයන්ට පමණක් විෂය වෙයි. අන් කිසිදු අමනුෂ්‍යයකුට පූජා වට්ටිවල ඇති පලතුරුවල රස බැලිය නොහැකිය.

දෙවියන්ට වැඳීම පෘථග්ජනයන්ට අයත් ප්‍රතිපදාවකි. මහා යෝගී වජ්‍රසත්වයන් කියන පරිදි අප විසින් කළ යුත්තේ දෙවියන්ට වැඳීම නොවේ. දෙවියන්ගෙන් වැඳුම් ලබන තත්වයට පත්වීමයි. මා දැන් සැරසෙනුයේ දෙවියන්ගෙන් වැඳුම් ලබන ඒ රහස් ප්‍රතිපදාව ඔබට හෙළිකිරීමටයි.

දෙවියන්ගෙන් වැඳුම් පිදුම් ලැබීමට කැමති අය එක්කෝ විදර්ශනා භාවනාව ප්‍රගුණ කළ යුතුය. නැතිනම් කරුණා භාවනාව ප්‍රගුණ කළ යුතුය. එසේ නැත්නම් බෝධිචර්යාව ප්‍රගුණ කළ යුතුය.

විදර්ශනාව ප්‍රගුණ කිරීම පහසු නමුත් කරුණා භාවනාව වැඩි දෙනෙකුට විෂය නොවේ. කරුණා භාවනාව ගැන මූලික සූත්‍රවල දැක්වුණත් එය ප්‍රගුණ කරන ආකාරය විස්තර කර නැත. විසුද්ධි මාර්ගයේ ඇති විස්තරවලට අනුකූලව කරුණා භාවනාව ප්‍රගුණ කිරීම අපහසුය.

බෝධිසත්ත්වවරුන් කියන පරිදි ලෝකසත්වයන් කෙරෙහි කරුණාව පහළ කර ගත හැක්කේ සාමාන්‍ය කෙනෙකුට වඩා උසස් අයෙකුට පමණි. කරුණාව යනු දුකට පත් සත්වයන් කෙරෙහි අනුකම්පාව ඇතිකර ගැනීමයි. සාමාන්‍ය කෙනෙකු කරුණා භාවනාව

වඩන්නේ නම් පළමුකොට ඔහු බෝධිසත්ව චර්යාව සමාදන් විය යුතුය. සැබෑම බෝධිසත්වයකු කරන ලෙස විපතට පත්වූ ජනයාට අනුකම්පා කිරීම, බුදුසසුනෙහි උන්නතියට වැඩ කිරීම බෝධි චර්යාවෙහි අත්‍යවශ්‍ය අංගයන් වෙයි. මෙයාකාර බෝධිචර්යාව සමාදන් වූ තැනැත්තෙක් කරුණා භාවනාව වැඩීමට සුදුස්සකු වෙයි. මන්දයත් ඔහු සෙස්සන්ට වඩා උසස් අයකු බවට පත්වීම ආරම්භ කර යම් දුරක් ගිය බැවිනි.

කරුණා භාවනාව උසස් ලෙස වැඩීමට කැමති තැනැත්තා පළමුකොටම නිශ්ශබ්දතාව හොඳින් ඇති තැනකට ගොස් පළක් බැඳ හිඳගත යුතුය. දැන් මෙයාකාරයට සිතුවිලි මාත්‍ර වශයෙන් කරුණාව ඇති කරගත යුතුය. "සංසාරය බොහෝ බියකරුය. සසරෙහි සැප ටිකකි. දුක බහුලය. ලෝක සත්වයන්ගෙන් වැඩි දෙනෙක් විපතට පත්ව බොහෝ දුකින් වාසය කරති. සසර දුකින් මිදීමට ඇත්තේ එක මගකි. එය නිර්වාණාවබෝධයයි. ඉදින් මමද නිර්වාණාවබෝධයට පත්ව මට හැකිතාම් සත්වයන් ඒ මඟ යවමි. මමද සසරෙන් මිදෙමි. අනුන්ද සසරෙන් මුදවමි. සියලු දුක් විඳින සත්වගට මාගේ කරුණාවෙන් ශාන්තියක්ම වේවා." මෙය කරුණා භාවනා පරිකර්මයයි.

මෙයාකාරයෙන් ටික වේලාවක් සිතමින් හිඳින කල මම බෝධිසත්වයකු වෙමිය යන හැඟීම ඇති වෙයි. මේ හැඟීම ඇතිවූ කල්හි සිතට ප්‍රීතියක් දැනෙයි. ඒ ප්‍රීතියට සංවේදීව සිට හෘදය දෙසට අවධානයෙන් සිටින කල්හි නෙළුම් මලක පිරිසිදු රත්පැහැයෙන් යුතුව හදවතෙහි ලේ ධාතුව සිතට ග්‍රහණය වෙයි. එය කරුණා භාවනාවෙහි උද්ග්‍රාහ නිමිත්තයි. මෙලෙස උපයාගත් උද්ග්‍රාහ නිමිත්ත නිතර මෙනෙහි කිරීම් වශයෙන් වඩන

විට තියුණු ප්‍රතිභාග නිමිත්ත උපදියි. ප්‍රතිභාග නිමිත්ත වමට දකුණට ඉදිරියට පසුපසට උඩට යටට ආදී ලෙස පැතිරවිය යුතුය. එලෙස පතුරවා හළ ප්‍රතිභාග නිමිත්ත ඇසුරුකොට සිත සමාධිගත කිරීම ඊළඟ පියවරයි.

මෙයාකාරයෙන් හුරු කරන ලද කරුණා භාවනාව බොහෝ ප්‍රතිඵලදායකය. මා ඉහතින් කී පරිදි කරුණා භාවනාව හෝ බෝධිසත්ව චර්යාව හෝ විදර්ශනා භාවනාව ප්‍රගුණ කළ කිසිවකු දෙවියන්ට වැඳීම අවශ්‍ය නොවේ. එවැන්නන්ට දෙවියෝ ඉබේම ආකර්ෂණය වෙති. සම්‍යග්දෘෂ්ටික දෙවියන් ආකර්ෂණය කරගැනීමෙන් බොහෝ ඉෂ්ඨ ප්‍රතිඵල ලැබිය හැකිය.

මම කාලයක් කරුණා භාවනාව හුරු කළෙමි. ප්‍රතිභාග නිමිත්ත දක්වා භාවනාව දියුණු නොවූවද එයින් බොහෝ උසස් ප්‍රතිඵල ලැබුණි. සමහර අවස්ථාවල දේව සභාවන්හි වැදගත් තීරණ මා වෙත සෘජුවම දැනුම් දෙනු ලැබුණි.

දෙදහස් දහහතර වර්ෂයේ සැප්තැම්බර් මාසයේ එක්තරා දිනක හවස් වරුවේ දෙවියෙක් මා හමුවට පැමිණ සිටියේය.

"ඔබට විශේෂ ප්‍රවෘත්තියක් දැනුම් දෙන්නයි මම ආවෙ. මේක දේවසභාවෙ තීරණයක්."

"මොකක්ද ඒ තීරණය?"

"අපි තීරණය කළා ලංකාණ්ඩුවට සහයෝගය නොදෙන්න."

"ඇයි ඒ වගේ හදිසි තීරණයකට ආවෙ?"

"මේක තරමක් දිග කතාවක්. ලංකාවෙ රජවරු මරණින් මතු කිහිප විටක්ම නැවත මෙරට රජකමට

පත්වුණ අවස්ථා තියෙනවා. ඔය දැන් ඉන්න රජ්ජුරුවොත් කලින් මේ රට පාලනය කරපු කෙනෙක්. එයා අපේම කෙනෙක්. එයාට මෑතක් වෙනතුරු දේවසභාවෙ පූර්ණ අනුග්‍රහය තිබුණා."

"ඇයි දැන් අනුග්‍රහය කපා හැරලද?"

"ඔව්. ඒක සිද්ධ වුණේ එයාගෙම ක්‍රියාවක ප්‍රතිඵලයක් විදියට. එයා අපෙන් අවසර නැතිව ලංකාවෙ සිතියම වෙනස් කළා. ඉතින් අපි දේව සභාව ඒකරාශි වෙලා තීන්දුවක් ගත්තා ලබන අවුරුද්දෙ මුල් මාස තුන ඇතුළත රජ්ජුරුවන්ව ගෙදර යවන්න."

දෙවියා කියන අණ්ඩර දෙමළය මට නොතේරුණි. ලංකා සිතියම වෙනස් කිරීම ගැන මම නැවත දෙවියා විමසමි.

"මෙන්න මේකයි ලංකා සිතියම වෙනස් කළා කියන්නෙ. අර හම්බන්තොට රට ඇතුළෙ වරායක් කියල එකක් හැදුවනෙ. ඒක මිනිසුන්ට වරායක් විදියට පෙනුනට දෙවියන්ට ඒක පෙනෙන්නෙ මුහුද රට ඇතුළට ඇවිත් කියල. ලංකා භූමියේ කොටසක් මුහුදට බිලිදීම ගැන දෙවියො කම්පා වෙලා."

ඒ දෙවියා කී අනාවැකිය හිතවත් ජ්‍යොතිර්වේදීන් දෙදෙනකුට කීමි. තවත් හිතවතුන් ගණනාවකට දැනුම් දුනිමි. ඒ අනාවැකිය කොතරම් නිවැරදිද යන්න මට පසක් වූයේ සියල්ල අකුරටම සිදුවූ පසුවය. මාගෙන් ඒ අනාවැකිය ලද අය අදටද නිතර මා සිහිපත් කරති.

දැන් සියල්ල නරක අතට හැරෙමින් පවතියි. ඒ ගැන සැකයක් නැත. ලංකාව බෞද්ධ රාජ්‍යයක්ව තිබී අනාගමික රාජ්‍යයක් බවට සීරුමාරු වෙමින්

තිබෙයි. අන්‍යාගමික මූලධර්මවාදීන් තමන්ට ලබාදුන් කොන්ත්‍රාත්තුව ඉටුකර අවසන් කරන තුරු කටපියාගෙන සිටිනු යන්න අද බෞද්ධයන්ට නිරත දෙවේලේ ඇසෙන පොදු පණිවුඩයයි. අද මෙරට ඇතිව තිබෙන අති භයානක තත්ත්වය හමුවේ බෝසත්වරු හා අමිතාභය බුදුන්වහන්සේ අපට සක්‍රීයව උදව් කිරීමට කැමතිව සිටිති.

බෝසත්වරුන් පෙන්වා දෙන පරිදි බහුතර බෞද්ධයන්ගේ විඤ්ඤාණය දේවපුත්‍ර මාරයන් විසින් අවුල් කර ඇත. වශවර්ති මාරයාට අවශ්‍යව ඇත්තේ බුදුදහම සීසීකඩ ඉරා විනාශ කර දැමීමයි. බෞද්ධයන් අතින් මෙරට පාලන තන්ත්‍රය උදුරා ගැනීමයි. බෞද්ධයන් වන අප එයට කෙලෙස මුහුණ දිය යුතුද? අමිතාභය බුදුන් වහන්සේ අපට මෙලෙස කියති.

"පින්වත, බෞද්ධයන් වන නුඹලා සීසීකඩ වෙන්වීම ශාසන අන්තර්ධානයේ මුල වන්නේය. බෞද්ධ නායකයන් මේ අවස්ථාවේදී උපක්‍රමශීලී විය යුතුය. වෙන්වූ පිරිස් උපක්‍රමශීලී ලෙස එක් කළ යුතුය. බෞද්ධයන්ගේ බලය ඉස්මතු වන්නේ වෙන්වූ පිරිස් එක්වීමෙනි."

"තවද පින්වත, බුදුදහම නගා සිටුවීමේ කාර්යයේදී ඔබට බොහෝ නින්දා අපහාස එල්ල විය හැකිය. ඒ නින්දා අපහාස විඳීම වළකනු නොහැකිය. එබැවින් නින්දා අපහාස ලබන සෑම විටදීම මාගේ නාමය සිහි කරනු මැනවි. මම නුඹ අද විඳින නින්දාවන්ට පිළිතුරු ලෙස භෞතික සම්පත්වලින් තෑගි එවමි. මාගේ උපදෙස් පරිදි බුදුසසුන බබළවන්නට නොබියව ඉදිරිපත් වන අය ප්‍රසිද්ධ කරවමි. ධනයෙන් ධාන්‍යයෙන් යස ඉසුරුවලින් ඔවුන් සුවපත් කරවමි."

අමිතාභය බුදුන්වහන්සේ වදාළ ඒ දෙය අකුරටම ඉටුවෙයි. ඔබ අද නොබියව ඉදිරියට පැමිණ බුදුදහම බේරාගැනීම පිණිස කටයුතු කළහොත් හෙට ඔබ යසඉසුරෙන් සමෘද්ධියට පත් කිරීමේ වගකීම අමිතාභය බුදුන්වහන්සේ විසින් නොපැකිළව භාරගනු ඇත. තවද බුදුසසුන බේරාගන්නට යන මේ ගමනේදී ඇතිවිය හැකි සතුරු කරදර පිළිබඳව අමිතාභය බුදුහු මෙසේ දේශනා කරති.

"පින්වත, සතුරන් දමනය කිරීමේ විශ්ව සම්මත නියමයන් දෙකක් ඇත. ඉන් පළමුවන්න නම් සතුරන්ගේ සෑම ක්‍රියාවකමට ප්‍රතික්‍රියා දැක්වීම අනවශ්‍ය බවයි. සතුරා ඔබේ ප්‍රතික්‍රියාව බලාපොරොත්තු වෙයි. ඔහු ප්‍රතික්‍රියා දැක්වීමට සූදානමින් සිටියි. ප්‍රතික්‍රියා නොදැක්වීම බියසුළු බව නොව පරිණත බවයි.

තවද දෙවැනි කාරණය වන්නේ සියලු සතුරන් එකිනෙකා දමනය කිරීම නිවැරදි ක්‍රියාමාර්ගය නොවන බවයි. පළමුව සතුරන් එන දිශාව දැනගන්න. සතුරන් පැනනගින මූලය නිවැරදිව හඳුනාගන්න. මූලය සිඳලන්න. එය නිසැක ජයග්‍රහණය පිණිස පවතියි."

අමිතාභය බුදුන්වහන්සේ සහ බෝසත්වරුන් විසින් පෙන්වා දෙන ජයග්‍රහණයේ මාවත පියවර දහයකින් සමන්විතය. ඉන් මුල් පියවර සතර වැඩි ප්‍රසිද්ධියකින් තොරව අවසන් කර ඇත. එම පියවර හතර අවසන් වන තුරු ඒ පියවර කවරේදැයි ප්‍රසිද්ධ නොකළ යුතුව තිබුණි.

අමිතාභය බුදුන්වහන්සේ විසින් දැන් අපට පස්වන පියවර නිර්දේශ කර ඇත. එම පියවර ප්‍රසිද්ධියේ කළ යුතු බැවින් හැකි උපරිම වෙර දරා එය ප්‍රසිද්ධියට පත් කළ යුතුය. බුද්ධ ශාසනය රැකගැන්මේ ඒ වැඩපිළිවෙළෙහි

පස්වන පියවර නම් සියලු බෞද්ධයන් කොන්දේසි විරහිතව තනි බලවේගයක් ලෙස ඒකරාශී වීමයි. මේ පියවරේදී කිසිවකුගේ පෞද්ගලික මතවාදයක් ඉදිරියට නොපමුණුවා ශාසන අන්තර්ධානය වළකනු පිණිස බෞද්ධයන් නිතර රැස්වී කතා කළ යුතුය. සෑම බෞද්ධ නිකායක්ම සෑම බෞද්ධ නායකයෙක්ම බුදුසසුන බේරාගනිමු යන තේමාව ඇතිව එකට එක්විය යුතුය. මෙයාකාර එක්වීම අවසානයේ තවත් සුවිශේෂී දෙයක් සිදුවීමට නියමිතය.

එය දියසේනයන්ගේ පහළ වීමයි. නිමිතිකරුවන් කිහිපදෙනෙක්ම කියන හැටියටද බෝසත්වරුන් කියන හැටියටද බුදුසසුන පන්දහසක් කල් පවතිනුයේ දියසේනයන්ගේ වික්‍රමයන්ගේ ප්‍රතිඵලයක් ලෙසය. දියසේනයන් විසින් බුදුදහමේ චිරස්ථිතිය වෙනුවෙන් බොහෝ දේ කරවන බව කියවෙයි. නැකැත්කරුවන් හා දක්ෂ ශාස්ත්‍රකරුවන් කියන පරිදි දියසේනයන් මේ වනවිටත් ඉපදී අප්‍රසිද්ධ වේශයෙන් වාසය කරයි. දෙවිවරු නියමිත වේලාව එනතෙක් ඔහුව සඟවන බව කියැවෙයි. දියසේනයන් පමණට කලින් කරළියට පැමිණියහොත් අවස්ථාවාදීන්ගේ ප්‍රහාරවලට ඔහු ලක්වනු ඇත.

හැබැයි. මා ප්‍රත්‍යක්ෂව දන්නා එක් වැදගත් දෙයක් ඇත. දියසේනයන් දැනටමත් ප්‍රමාද වූවා වැඩිය. අනාගමික රටක් තුළ දියසේනයන්ට කළ හැකි ලොකු දෙයක් නැත. බෞද්ධයන් අරක්කු බෝතලයට රට ජාතිය ආගම පාවා දෙන මේ යුගයෙහි සැබෑ ආධ්‍යාත්මික නායකයන්ට ඉඩක් ඇත්තේම නැත.

මේ යන විදියට ගියොත් හිරු සඳු දෙදෙන එකවිට පායන අබුද්දස්ස යුගය ළඟදීම උදාවනු ඇත.

# 09

# අමිතාභය බුදුන් වහන්සේගෙන් පණිවුඩයක්

මෙකල සෝවාන් ඵලය ලැබිය හැකිද නොහැකිද යන්න පිළිබඳව දැනට වසර ගණනාවකට පෙර ශාස්ත්‍රීය මතගැටුමක් ඇතිවිය. බහුතර මතය වූයේ මෙකල සෝවාන් විය නොහැකිය යන්නයි. බහුතර මතයට පදනමක් නොවීය. එනමුත් මෙකල සෝවාන් විය නොහැකි බව සිතට කාවැදෙන සේ පෙන්වා දීමට සමහර උගත් බෞද්ධ පිරිස් සමත් වූහ.

මම සුළුතර පිරිසට අයත් වීමි.

කලිනුත් දිනක මතක් කළ පරිදි ආත්තම්මාට කුඩා කලදී ලබා දුන් පොරොන්දුව කෙසේ හෝ ඉටුකිරීම මාගේ අභිලාෂය විය. ආත්තම්මාට මා දුන් පොරොන්දුව නම් රහතන් වහන්සේලාගේ යුගය නැවත කෙසේ හෝ බිහිකරන බවයි. එවකට මා කුඩා දරුවකු වුවත් ආත්තම්මා එක් දෙයක් පැහැදිලිව දැන සිටියාය. යමක් කීවොත් හොඳින් හෝ නරකින් කරන පුරුද්දක් මට ඇති බව ඇය සක්සුදක් සේ දැන සිටියාය.

රහතන් වහන්සේලාගේ යුගය නැවත ඇති කිරීම එකම අභිලාෂය වුවත් එය කෙසේ කවරාකාරයෙන් කළ යුතුද යන්න පැහැදිලි නොවීය. මම එක හුස්මට බණ පොත් කියවාගෙන ගියෙමි. ආත්තම්මා ඇයට පුළුළුවන් හැටියට බණපොත් සපයා දී මට සහය වූවාය.

මම පොඩි පොඩි බණපොත්වලින් පටන්ගෙන අභිධර්ම පොත් දක්වාම කියවාගෙන කියවාගෙන ගියෙමි. ඒ කියවීමේ පුරුද්ද මා පාසලෙන් සමුගත් පසුවද එක දිගටම පැවතුණි. මේ අතර මට රජයේ පාසලකට උපාධි ගුරුපත්වීමක් ලැබුණි. එතැන දැවැන්ත පුස්තකාලයක් විය. එතැන තිබූ බෞද්ධ පොත් ප්‍රමාණය ඇත්තෙන්ම පුදුම එලවනසුලුය. හීනයාන හා මහායාන දර්ශනවාදයන් රැගත් පැරණි පොත් රාශියක්ම කිසිවකුගේ අවධානයට ලක්නොවී පොත් රාක්ක පුස් කමින් තිබුණි. මම ඒ සියල්ල එකිනෙක ගෙන ඉතා ප්‍රවේසමෙන් කියවීමි.

දිනක් අපූරු සිද්ධියක් ඇතිවිය. මම පුස්තකාලාධිපතිනියගේ මේසය ඉදිරිපිට අසුන්ගෙන සිටියෙමි.

"මම මෙතැන ඉන්න කාලෙ අවසන් වෙලා කියල මගෙ හිත කියනවා?"

"ඒ කොහොමද ඔයා එහෙම කියන්නෙ?"

"මම හිතනව මම ජීවත් වෙන්නෙ බුද්ධාගම වෙනුවෙන් කියල. මම අද අන්තිම බණ පොතත් කියවල ඉවර කළා. මම අත්දැකීමක් හැටියට දන්න දෙයක් තමයි මම ඉන්න තැන තියෙන අන්තිම බණ පොත කියවල ඉවර වුණ ගමන් එතැනින් යන්න වෙනවා."

"ඒක හරි පුදුම කතාවක්නෙ?"

"හොඳයි බලන්න ඒක ඇත්ත වේවිද කියල?"

මාගේ කතාව ඇසූ පුස්තකාලාධිපතිනිය තුෂ්ණීම්භූතව බලා සිටියාය. දහවල් දොළහට පමණ වැදගත් ලිපියක් ලැබුණි. ඒ ලිපියද රැගෙන පුස්තාකාලාධිපතිනිය හමුවීමි.

"මම ආවේ අදින් පස්සෙ එන්නෙ නෑ කියල මතක් කරල යන්න. මට හෙට රුහුණු විශ්වවිද්‍යාලයෙ වැඩ භාරගන්න යන්න තියෙනවා?"

පුස්තකාලාධිපතිනිය පුදුමයෙන් පුදුමයට පත්වූවාය.

මාර්ගඵල ගැන මා දක්වන උනන්දුව මෙරට උගතුන්ගේ හාස්‍යයට ලක්වූයේ වරක් හෝ දෙවරක් නොවේ. මම මාර්ගඵල ගැන විස්තර කෙරෙන සියලු ධර්ම කරුණු ඒකරාශී කර පොත් මුද්‍රණය කරවා බෙදා හැරියෙමි. මා ලියූ බෞද්ධ පොත් සංඛ්‍යාව හැත්තෑවකි. මාර්ගඵල ගැන මුල් බුදුසමයේ කියැවෙන සියලු දේ මා විසින් මේ වන විට ලියා අවසන්ය. සැකෙවින් දක්වතොත් මුල් බුදුසමය ගැන ලියන්නට තවත් දේ මට ඇත්ද යන්න පවා සැක සහිතය. ධ්‍යාන මාර්ගඵල සමාපත්ති ආදිය ගැන කිසිදු පොතක් නොබලා කටපාඩමෙන් කීමේ හැකියාවක් මට ඇත. ඒ ඉගැන්වීම් සියල්ල තනි චිත්‍රයක් ලෙස සකස් කර පෙන්වීමට මට හැකිය.

මා පිටසක්වළ බුදුවරුන් බෝසත්වරුන් දකිනුයේ මුල් බුදුසමය හදාරා අවසන් වී මාස පහකට නැතිනම් හයකට පසුවය. 2011 හා 2012 වර්ෂ අතර වූ කාලවකවානුව බෝසත්වරුන් හා බුදුවරුන් සමඟ සාකච්ඡා බහුලව ඇතිවූ සමයකි. බෝසත්වවරු මාගේ ආරාධනාවක් නොමැතිවම පැමිණ විවිධ පණිවුඩ ලබා දුන්හ. මම ඉන්ද නොනැවතී බෝසත්වරුන්ගෙන් විවිධ

ධර්ම ගැටලු විමසීමි. ඒවාට ලැබෙන පිළිතුරු මතු පරපුරෙහි ප්‍රයෝජනය පිණිස ලියා තැබීමි.

සමහර බෝසත්වරු සූක්ෂ්ම කයින් යුතුව මා හමුවට පැමිණියහ. තවත් අය දුරස්ථව හිඳ පැහැදිලිව අදහස් හුවමාරු කරගත්හ. පිටසක්වළ බුදුවරු දුර සිටම කසිණාලෝකය හරහා ධර්මය දේශනා කළහ. විශ්වයේ බෞද්ධ ජනාවාසවල පිහිටීම මට දැන් තරමක් දුරට විස්තර කළ හැකිය.

අපට ළඟින්ම පිහිටි මනුෂ්‍ය ලෝකය සාග ලෝකධාතුවයි. අළුපැහැ මිථ්‍යා දෘෂ්ඨික ජන වර්ගයක්ද නිල් පැහැ බෞද්ධ ජන වර්ගයක්ද එහි වෙසෙති. විශ්ව සම්මත නීති අනුව බෞද්ධයෝ අළු පැහැ මිථ්‍යා දෘෂ්ඨිකයන් දැඩි කොන්දේසි මත සංවර කරගෙන සිටිති. අළුපැහැ ජීවීන්ට කැමති පරිදි වර්ගයා බෝ කිරීමේ නිදහස නැත. කැමති තැනක යාමට නිදහස නැත. ඔවුන් යන එන සියලු තැන් නිල් පැහැ නායකයන්ගේ තියුණු පරීක්ෂාවට ලක් වෙයි. නිල් පැහැ ජීවීන්ගේ නායකයා කත්‍රික සක්විති රජුය. කත්‍රිකයන්ගේ දෙටු පුත් අක්ෂෝභ්‍ය සක්වළ චාරිකාවේ යෙදෙමින් බුදුදහම පතුරුවයි.

2011 හා 2012 වර්ෂ අතර කාලයේදී අක්ෂෝභ්‍ය කුමරු සූක්ෂ්ම කයින් යුතුව මා හමුවට ආවේය. අපි බොහෝ දේ කතා කළෙමු. බුදුදහම හා රාජ්‍ය පාලනය අක්ෂෝභ්‍ය කුමරුන්ගේ ජනප්‍රියතම මාතෘකාවන් වෙයි.

ඔහුගේ දේශපාලන මතවාදය අක්ෂෝභ්‍ය පාලන තන්ත්‍රය නම් වෙයි. සැමට සමව සැලකීම අක්ෂෝභ්‍ය ප්‍රතිපත්තීන්ගේ වැදගත්ම ලක්ෂණයයි. මම මින් පෙර අවස්ථාවක අක්ෂෝභ්‍ය ප්‍රතිපත්තීන් ගැන සවිස්තරව දැක්වූවෙමි. දැන් මා හෙළිකරන්නට යන වැදගත් රහස්

බෞද්ධයන්ගේ සැනසිල්ලට හේතු වේ යයි කල්පනා කරමි. මේ කරුණු පිළිවෙළ අනුව ගළපා නොමැති අතර කියවීමට පහසු පිණිස ඒවායේ අනුපිළිවෙළ මා විසින් නැවත සකස් කරනු ලැබීය.

තවත් වැදගත් කරුණක් මතක් කළ යුතුය. අක්ෂෝභ්‍ය සිංහල භාෂාවෙහි නිපුණත්වයක් දක්වන්නෙකි. ඔහුට අනුව සිංහල භාෂාව විශ්වීය මවු භාෂාවන්ගෙන් පැවත එන්නකි. එබැවින් ඔහු විසින් සිංහල කතා කරන්නේ අප භාෂාව හසුරුවන ආකාරයට තරමක් සමානවය.

"පින්වත් අක්ෂෝභ්‍ය කුමාරයාණනි, මෙකල්හි රහතන් වහන්සේලා වැඩ වාසය කරන්නේද?"

"පින්වත, ඔබ දන්නා පරිදි ධර්මයේ අකාලික ගුණයෙහි වෙනසක් කිසි කලෙක ඇති නොවේ. සද්ධර්මය ඇත්තේ කොතැනද රහතන් වහන්සේලා පහළ වීමට බාධාවක් එතැන ඇති නොවේ."

"ලක්දිව දැනට රහතන් වහන්සේලා වැඩ වාසය කරන්නේද?"

"එසේය. දැනට ලක්දිව රහතන් වහන්සේලා තිස් නමක් වැඩවාසය කරති."

"රහතන් වහන්සේලා දැනට වැඩ වාසය කරනුයේ කුමන ස්ථානයන්හිද?"

"සිතුල්පව්ව ආශ්‍රිත වනයේ රහතන් වහන්සේලා පස්දෙනෙක් මේ දිනවල වැඩ සිටිති. සමනොල කන්දේ එක් රහතන් වහන්සේ නමක් වැඩ වෙසෙති. සියලුම රහතන් වහන්සේලා දැනට අප්‍රසිද්ධියේ වාසය කරති."

රහතන් වහන්සේලා ගැන දැනගන්නට ලැබීමෙන් අපමණ සතුටක් ඇතිවිය. මටද මාගේ ගමනාන්තය ගැන විමසන්නට සිත්විය.

"මෙය ඔබගේ අවසාන ආත්මභාවය නොවන්නේය. එහෙත්, ඔබ මිනිසුන් අතරට පැමිණියේ සුවිශේෂී වගකීමක් පෙරදැරිවය. අප ඔබ හමුවීමට එක් හේතුවක් වන්නේද එයයි. ගෞතම බුදුන් වහන්සේගේ කැබලිවලට ඉරී ගිය ශාසනය ඒකරාශී කර රහතන් වහන්සේලාගේ යුගය නැවත බිහි කිරීමේ කටයුත්තේ වැදගත් රාජකාරියක් ඔබ වෙත පැවරී ඇත්තේය."

"ඒ වගකීම කවුරුන් විසින් පනවන ලද්දක්ද?"

"එය ඔබගේම පූර්වකෘත ප්‍රාර්ථනයක් හේතුවෙන් සිදුවන්නකි. ඔබ ඊට සත්බුදුවරුන් වහන්සේලාගේ ආශීර්වාද ලද්දේය. ඔබ ඊට ගෞතම බුදුන් වහන්සේගෙන් ආඥා ලද්දේය. සර්වාවතී ලෝකධාතුවෙහි සම්බුද්ධ ශාසනය නැවත පිහිටුවීමට පිරිස් ඒකරාශි කිරීම ඔබගේ වගකීම වන්නේය."

මට සත්බුදුවරුන් ගැන තවදුරටත් අසා දැන ගැනීමට කැමැත්තක් ඇතිවිය. අක්ෂෝභ්‍ය සත්බුදුවරුන් ගැන මෙසේ විස්තර කළේය.

"ඔබ වෙසෙන සර්වාවතී ලෝකධාතුවෙහි ගතවූ අනූඑක් කල්පයක් තුළ බුදුවරු සත්නමක් පහළ වූහ. සිඛී විපස්සී වෙස්සභූ කකුසඳ කෝණාගමන කාශ්‍යප ගෞතම නම් වන ඒ බුදුවරුන් සත්දෙනා වහන්සේලාගේ ආඥා බලය අදටද වලංගු වෙයි. මෙරට ඉපදී සිටින අයගෙන් පහළොස් දෙනෙක් සත්බුදුවරුන්ගේ ආශීර්වාද ලද අය වෙති. ඒ පහළොස් දෙනාට සත්බුදුවරුන්

විෂයෙහි බුද්ධානුස්සති භාවනා කර්මස්ථානය වඩා උසස් ප්‍රතිඵල ලද හැකිය. බලංගොඩ ප්‍රදේශයේ එක් ස්වාමීන් වහන්සේ නමක්ද කුරුණෑගල පොත්ගුල් පිරිවෙණේ ස්වාමීන්වහන්සේ නමක්ද ඒ අය අතර වෙති. උන්වහන්සේලා අෂ්ඨ සමාපත්තිලාභීහු වෙති."

මෙරට කෙරතම් මාර්ගඵලලාභීන් සංඛ්‍යාවක් සිටින්නේද යන ගැටලුව විසඳා ගැනීමට මට අවශ්‍ය විය. මම එය අක්ෂෝභ්‍ය කුමරුන්ගෙන් ඇසීමි.

"මෙරට සෝවාන් ඵලයට පැමිණි අය එකොළොස් දහසක් සිටිති. මේ භවයේ සෝවාන් වීමට පින ඇති අය දහසක් සිටිති. සෝවාන් ඵලයට පැමිණි අය අතිබහුතරයක් ජාත සෝතාපන්නයෝ වෙති. පෙරඅත්බැව්හි සෝවාන් වූ අය එලෙස ජාතසෝතාපන්නව උපත ලැබ සිටිති. මේ අයගේ එකතුව දොළොස්දහසකි. එයින් එක්දහස් පන්සීයක පිරිසකට මේ භවයේ රහත්වීමට පින ඇත."

අක්ෂෝභ්‍ය තව බොහෝ දේ කීය. බෞද්ධ පාලන තන්ත්‍රයකට මාරු වීම හැර බුදුදහම රැක ගැනීමට වෙනත් මාවතක් නොමැති බව අක්ෂෝභ්‍යගේ මතයයි. සාග ලෝකයේ තට්ටුමාරු දේශපාලනයක් නැත. රජුගෙන් පසු ඊළඟට සිහසුන හිමිවන්නේ කාටද යන්න සාග ලෝකයේ වැසියන්ට ගැටලුවක් නොවේ. මන්දයත් සියලු සැපසම්පත් ජනතාව අතර සමසේ බෙදී යන බැවිනි. පාලකයා සෑම රටවැසියකුටම සමසේ සැලකිය යුතු බැවින් උස්මිටිකම් කුලමල භේද එහි නැත.

එනමුත් සාග ලෝකයේ පවත්නා ප්‍රධානතම ගැටලුව වර්ණභේදවාදයයි. පෙර කල අළු මිනිසුන්ට අයත්ව තිබුණු සාග ලෝකයේ පාලන බලය දැන් ඇත්තේ නිල් පැහැ රුධිරය ඇති මිනිසුන් වෙතය. නිල් මිනිස්සු අළු පැහැ

මිථ්‍යාදෘෂ්ඨිකයන් දැඩි නීතිරීතිවලට යටත්කර හසුරුවති. ඔවුහු සිය ගහණය වර්ධනය කර සාග ලෝකය නැවත අත්පත් කරගැනීමට මාන බලති. නිල් මිනිසුන්ගේ වැඩ කටයුතුවලට එන්නාක් සේ පෘථිවිය මතට පැමිණ තම වර්ගයා බෝ කරන ක්‍රම අත්හදා බලති. කෙසේ නමුත් දැනට අළු මිනිසුන්ට සිය වර්ගයා බෝ කිරීම තහනම්ය.

අළුපැහැ පිටසක්වළ ජීවීහු පීරිසි හැඩැති යානාවල නැඟී පෘථිවියට එති. මෙහි ඔවුන්ට පැවරී ඇති රාජකාරි කිහිපයකි. ඉන් එකක් නම් විවිධ බෙහෙත් පැළෑටි හා ඛනිජ වර්ග සාග ලෝකය වෙත ප්‍රවාහනයයි. එය තනිකරම හොර රහසේ කෙරෙන කටයුත්තකි. සාග ලෝකවාසීහු හිමාල පර්වත ප්‍රාන්තයේ වැඩෙන ගස්වර්ග ගැන වැඩි අවධානයක් යොමු කරති. සඳමත සාග ලෝකවාසීන්ට අයත් පර්යේෂණාගාරයක් ඇත. එය බොහෝ කාලයක් තිස්සේ පැවත එන්නකි.

සාග ලෝකවාසීන්ට අකැමැත්තෙන් වුවද පෘථිවිවාසී නායකයන් සමඟ තානාපති සබඳතා පැවැත්වීමට සිදුවිය. ඊට හේතුවූයේ සාග ලෝවාසීන් තිදෙනෙකුම ඇමෙරිකන් හමුදාව විසින් ජීවග්‍රහයෙන් අල්ලා ගැනීමයි. ඒ සිද්ධියෙන් පසු ඇමෙරිකාව හා සාග ලෝකය අතර තානාපති සබඳතා ඇතිවිය. ඇමෙරිකානු ජනාධිපතිවරු සාග ලෝකවාසී පණිවිඩකරුවන් සමඟ මුහුණට මුහුණ ලා හමුවූහ. ඇමෙරිකානු ජනාධිපති තනතුරෙහි සිටි බරක් ඔබාමා සාග ලෝකවාසීන්ගෙන් උපදෙස් ලබා ගත් අයෙකි. හේ මැදපෙරදිග ඇතිවන යුදමය තත්ත්වය ගැන අපට වඩා කලින් දැන සිටියේය.

රහතන් වහන්සේලා පිළිබඳව අක්ෂෝභ්‍ය කුමරු විසින් හෙළිකළ කරුණුවල ඇත්ත නැත්ත දැන

ගැනීමේ බලවත් කුතුහලයක් මට ඇති විය. මම වහා ක්‍රියාත්මක වී රහතන් වහන්සේලා සිටින ඉසව් ගැන තොරතුරු සෙවීමි. මම කුරුණෑගල හා පොල්ගහවෙල අතර පොත්ගුල් පිරිවෙන නම් විහාරස්ථානයක් ඇති බව සොයාගතිමි. එතැනට ගිය මාගේ පණිවිඩකරුවකුට අතිශය දක්ෂ යෝගී භික්ෂූන්වහන්සේ නමක් හමුවිය. උන්වහන්සේ කටුකුරුන්දේ ඥානානන්ද නම් වෙති. මේ අතර සිතුල්පව්ව ආශ්‍රිතව වැඩ වාසය කළ රහතන් වහන්සේලා වෙනත් පෙදෙසකට වැඩම කළ බව දැන ගන්නට ලැබුණි. මේ අතර මා මිත්‍ර වනවාසී සෝමානන්ද හිමියෝ කෑගල්ලට ආසන්න උස් කඳු මුදුනක වූ සේනාසනයක හිඳ අර්හත්ඵලය සඳහා විදසුන් වැඩීම ඇරඹූහ. මෙයාකාරයෙන් මාස ගණනක් කිසිදු තොරතුරක් නැතිව කල්ගත විය.

මා අපේක්ෂා නොකළ මොහොතක පෙර කී සෝමානන්ද හිමියෝ අප නිවසට වැඩම කළහ. උන්වහන්සේගේ සුපුරුදු උපශාන්ත පෙනුම පරයන ජයග්‍රාහී විලාසයක් එදින දිස්විය.

"ඕන්න මහත්තයෝ යංතං වැඩේ කරගත්තා."

"ඇයි ආරණ්‍යයෙ අලුතින් කුටියක් හදාගත්තද?"

"නෑ මහත්තයො, සංසාරෙ කරගහගෙන ආපු බර පොදිය බිම තිබ්බා."

නිම් හිම් නැති සතුටක් මට දැනුණි. රහතන් වහන්සේ කෙනෙක් දුටු පළමු දිනය එයයි. සැක කරන්නට හේතුවක් නැත. සෝමානන්ද හිමියන් කිසි දිනක බොරුවක් කියා නැත. අප දෙදෙනා අතර සංවාදය රාත්‍රී දහයහමාර පමණ වන තෙක් පැවතුණි.

"අපෙ හාමුදුරුවන්ට සැතපෙන්න වෙලාව හරි."

"හපොයි මහත්තයො දැන් නම් ගිහිගෙයි දවසක්වත් ඉන්න බෑ. මොකද රහතන් වහන්සේලාට ගිහිගෙය අකැපයි. මම අදම යන්න ඕනෑ කෑගල්ලට. මාව ගාල්ලට ඇරලවන්න. මට ඒ හොඳටම ඇති."

සෝමානන්ද හිමියන්ගේ උපදෙස් පරිදි මධ්‍යම රාත්‍රියේදීම උන්වහන්සේ ගාල්ලට ඇරලූයෙමි.

පෙරදිග රටවල බෞද්ධයන්ගේ විග්‍රහය අනුව බුදුදහමෙහි මහායාන හා හීනයාන වශයෙන් ප්‍රධාන ශාඛා දෙකකි. මහායානිකයන්ට අනුව අප හීනයානිකයන්ය. අප හීනයානිකයන් ලෙස ඔවුන් සලකනුයේ බුදුබව අතහැර අර්හත් පදවිය ලැබීම මදිපුංචිකමක් සේ සිතාගෙනය. දැනට වසර දොළහකට පමණ පෙර 'වෙස්ටර්න් බුඩිස්ට් ඕඩර්' නම් අපරදිග බෞද්ධ සමාජයකට අයත් විද්වත් පිරිසක් මා හමුවට පැමිණියහ.

අපි බුදුදහම ගැන වැදගත් කරුණු රැසක් සාකච්ඡා කළෙමු. ඔවුන් කියන අන්දමට අප කියන හීනයාන මහායාන වෙනස බටහිර රටවල අයට නොතේරෙයි. ඔවුහු හීනයාන සූත්‍ර හා මහායාන සූත්‍ර දෙකම කවලමේ භාවිත කරති. හීනයානය හා මහායානය අහසට පොළොව සේ ප්‍රතිවිරුද්ධය. මේ දෙක අතර වෙනස නොදැන බුදුදහම ගැන කථා කිරීම අන්ධයා ඇතා ගැන විස්තර කිරීම වැනි නිරර්ථක ක්‍රියාවකි.

කෙසේ නමුත් බටහිර රටවල පිරිස් බුදුදහම විග්‍රහ කරන වෙනස් ක්‍රමයක් ඇත. එය නම් ප්‍රකට බුදුසමය හා ගුප්ත බුදුසමය යන වර්ගීකරණයයි. බටහිර විද්වතුන්ට අනුව හීනයාන මහායාන දෙකම ප්‍රකට බුදුසමය

නියෝජනය කරයි. ගුප්ත බුදුසමය ලෙස හැඳින්වෙනුයේ ටිබෙට් බුදු දහමයි.

ගුප්ත බුදු දහමට අදාළ ඉගැන්වීම් සියල්ලම පාහේ පිටසක්වළ මුනිවරුන් විසින් ඉන්දියානු හා ටිබෙට් යෝගීන්ට කරන ලද හෙළිදරව් කිරීම් මත පදනම්ව ඇත. තිලෝපා මුනිවරයා හා පද්මසම්භව ගුප්ත බුදුසමයේ ප්‍රධාන ශාඛා දෙකෙහි ආරම්භකයෝ වෙති. ටිබෙට් ගුප්ත බුදුසමය එකතැන පල්වෙන එකක් නොවේ. ටිබෙට් යෝගීහු විසිවන සියවස දක්වාම පිටසක්වළ දැනුම හෙමි හෙමිහිට ලබා ගනිමින් ගුප්ත බුදුසමය පෝෂණය කළහ. පිටසක්වළ මුනිවරුන් මා අභිමුව පෙනී සිට සිදුකළේ අලුත් දෙයක් නොවේ. ඔවුහු රහතන් වහන්සේලාගේ යුගය නැවත බිහිකිරීමට මා යන ගමනෙහිදී වරින් වර උපකාරී වෙති.

පිටසක්වළ මුනිවරුන් හා බෝසත්වරුන් හෙළිදරව් කළ වටිනා දැනුම් සම්භාරයක් මා සතුව ඇත. ඒ සියලු ඉගැන්වීම් ආගමික වශයෙන් මෙන්ම ආචාර විද්‍යාත්මක වශයෙන්ද අතිශය වැදගත්ය. මා විසින් අසාගත් එවැනි ඉගැන්වීම් අතර වඩාත්ම අභිරහස් ගණයේ තොරතුරක් මෙතැන් සිට හෙළිකිරීමට බලාපොරොත්තු වෙමි. මෙම කරුණු මා විසින් සටහන් කරගෙන වසර ගණනාවක් යන තෙක් ඒවායේ සත්‍යාසත්‍යතාව ගැන පිරික්සුවෙමි. එම කරුණු සත්‍ය බව පෙනී යන ඓතිහාසික සාක්ෂි ගණනාවක්ම සොයා ගැනීමෙන් පසු ඒ අපූරු කතා ප්‍රවෘත්තිය ඔබ වෙත තබමි.

"එය තුසිත දෙව්ලොව පිහිටි මනරම් මන්දිරයකි. අප මහාබෝසතාණෝ පාරමීදම් පුරා අවසානයේ තුසිත

දෙව් ලොව සන්තුෂිත දිව්‍යරාජෝත්තමයා නමින් පහළව බොහෝ පිරිවර ඇතිව ඒ මනරම් දෙව් මැඳුරෙහි වාසය කළේය. සන්තුෂිත දෙව්රජ තෙමේ බුදුවීමට පින් ඇතිව ඊට කල්බලමින් නොඉවසිලිමත්ව වාසය කළේය.

එය සම්බුද්ධෝත්පත්තියට වසර දහස් ගණනකට පෙර දිනයකි. සන්තුෂිත දෙව්රජ තෙමේ සිය දිව නෙතින් මනුෂ්‍ය ලෝකය දෙස බලා කාලය - ද්වීපය - දේශය පළමුව විමසා බැලීය. එකල පෘථිවියෙහි වාසය කළ අතිබහුතර පිරිස ම්ලේච්ඡ ගෝත්‍රියන්ය. ම්ලේච්ඡ වනචාරීන්ට අමතරව එකල දියුණු ශිෂ්ඨාචාරයක්ද විය. එය දෙගම්මැදි රජධානිය යන විරුදාවලිය ලත් මෙසපොතේනියාවයි.

මෙසපොතේනියානු රජ පවුල අනුනාක නම් වන පිටසක්වළ ජීවීන්ගෙන් පැවත ආ අතිභයානක මිනිස් කොට්ඨාසයකට අයත් වූහ. අනුනාකීහු කලාතුරකින් මිනිසුන් මරා ආහාරයට ගත්හ. එය ආගමික පූජාවිධියක් බව බහුතර ජනතාවට හඳුන්වා දුන් බැවින් ජනතා ප්‍රතිරෝධය අවම විය. මිනිස්සු අනුනාකයන් දේවත්වයෙන් පුදමින් නිසරු වහල් ජීවිත ගෙන ගියහ. අනුනාක යන වදනෙහි තේරුම දෙවියන්ගෙන් පැවැතෙන නැතහොත් දෙවියන්ට දෙවැනි වන යන්නයි. ඉපැරණි මෙසපොතේනියානු භාෂාවෙහිද පාලි භාෂාවහිද අනුනාක යන්නට සමාන තේරුම් ඇත.

අනුනාකයෝ ම්ලේච්ඡ වනචාරී මිනිස් කොට්ඨාසයන් වරින් වර අල්ලාගෙන ඔවුන් වහලුන් ලෙස හික්මවූහ. ඒ වහලුන්ට ආර්ය යන නම යෙදුණි. ආර්ය යන්නෙහි හික්මුණු මිනිසා යන අර්ථය ඇත.

ඒ විෂම පරිසරය තුළ බුදුවීමට සුදුසු නැති බව අවබෝධ කරගත් සන්තුෂිත දෙව්රජ තෙමේ කදිම උපායක් පිළියෙල කළේය.

මහා බලවත් දෙවිවරු දෙදෙනෙක් තුසිත දෙව්ලොවෙන් නික්ම ආර්යයන් අතර උපත ලද්දෝය. ඉන් එක් අයෙක් ප්‍රභූ නම් විය. අනෙකා මිත්‍ර නම් විය. ප්‍රභූ හා මිත්‍ර දෙදෙනා කල්යල් බලා ආර්යයන්ගෙන් පිරිසක්ද රැගෙන මෙසපොතේමියාව අතහැර ඉන්දු නිම්නය බලා පැන ආහ. ඔවුන් සමඟ පැමිණි පිරිසෙන් බොහෝ දෙනෙක් කාන්තාරයේදී සා පිපාසයෙන් මිය ගියහ. ඉතිරි අය ඉන්දු ගංගා නිම්නයේ මුල්ම ජනාවාස පිහිටවූහ. ප්‍රභූ සහ මිත්‍ර යන දෙදෙනා පසුකලෙක දේවත්වයෙන් පුද ලදහ. මේ දෙදෙනාගේ නාමයන් ඍග්වේදයේද පෙර අපර දෙදිග ඉපැරණි ග්‍රන්ථයන්හිද පැහැදිලිව සඳහන් වෙයි.

ප්‍රභූ සහ මිත්‍ර යන දෙදෙනා විසින් ගොඩනගන ලද ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය තවදුරටත් ව්‍යාප්ත වූ කල්හි සාග ලෝකවාසී වජ්‍රයෝගිනිය ඍද්ධි බලයෙන් එහි පැමිණියාය. වජ්‍රයෝගිනිය ඔවුන්ට කුණ්ඩලනී යෝගය ඇතුළු යෝග රැසක් හෙළිදරව් කළාය. ඇය විශ්වයේ මව සහ කුණ්ඩලනී මාතා යන විරුදාවලි ලද්දාය.

මෙයාකාරයෙන් ඇතිවූ ඉන්දු නිම්න ශිෂ්ඨාචාරය හරහා ඉන්දියාවේ මධ්‍ය දේශයට ආර්යයෝ සංක්‍රමණය වූහ. එතෙක් කල් ඉන්දියාවේ සිටි ශූද්‍රා ගෝත්‍රිකයන් ආර්යයන්ගේ දාසයන් නැතහොත් වහලුන් බවට පත්විය. ආර්යයෝ ශීඝ්‍රයෙන් බලවත් වී ඔක්කාක රාජ්‍ය වංශය බිහිකළහ.

සන්තුෂිත දෙව්රජ තෙමේ නැවතත් ලොව බැලීය. එකල දඹදිව මධ්‍ය දේශයෙහි බුදුසසුන පිහිටුවීමට සුදුසු පරිසරයක් බිහිව ඇතිබව පෙනුණි. හේ දිව්‍ය සභාවක් කැඳවා තමන් බුද්ධත්වය ලැබීම සඳහා නික්ම යන බව නිවේදනය කළේය. අඩු තුන්කෙළක් දෙවිවරු හා දිව්‍යාංගනාවෝ සන්තුෂිත දෙව් රජුගේ නිවේදනය පිළිගෙන බුදුසසුනෙහි විවිධ තනතුරු ලබනු පිණිස දෙව්ලොවින් නික්ම දඹදිව උපත ලදහ.

මෙයාකාරයෙන් සිද්ධාර්ථ බෝසතුන් මෙලොව ඉපදීමද බුද්ධත්වයට පත්වීමද අසූමහ ශ්‍රාවකාදීන් හමුවීමද කල්තබා සැලසුම් කළ පිළිවෙළක් අනුවම සිදුවිය. අග්‍රශ්‍රාවකාදීන් මුණගැසීම කල්තබා සැලසුම් කළ පරිදිම සිදුවිය. සම්බුද්ධ ශාසනයේ ආරම්භයත් එහි ව්‍යාප්තියත් අවසානයත් සන්තුෂිත දෙව්රජුන්ගේ මහා සැලැස්මක් මත සිදුවන්නකි.

සිද්ධාර්ථ ගෞතම බුදුන්වහන්සේ පහළ වී මංගල බණ කියන දිනයෙහිදී ඒ සඳහා එළිමහනක් තෝරාගනු ලැබීය. මංගල ධර්ම දේශනය කරනුයේ බ්‍රහ්ම ස්වරයෙනි. බ්‍රහ්ම ස්වරය උච්ච නොවූද හීන නොවූද මධ්‍ය ස්වරයකි. ඒ මංගල ධර්ම දේශනාව ඇසීමට ගව් තුනක් දුරට දෙවිවරු රැස්ව සිටියහ. අල්පේශාඛ්‍ය මහේශාඛ්‍ය භේදය නොසලකා දෙවිවරු තමන්ට හැකි පමණ ළංවී බණ අසන්නට පෙළ ගැනුණහ. ඒ හා සමග "කෝ මටත් ඉඩ. කෝ මටත් ඉඩ" යන දිව්‍යමය කෝලාහල හඬ ඇසුණි.

මෙයාකාරයෙන් බරණැස ඉසිපතනයේදී දෙවිවරුන් රැස්වූ පසු පස්වග මහණුන් අරභයා මංගල ධර්ම දේශනය කරනු ලැබීය. දසදහසක් සක්වළ ඒ ධර්මස්වරයෙන්

අනුනාද විය. දසදහසක් සක්වළ සෑද්ධිමත්හු ඒ මංගල ධර්ම දේශනය අසා සැනසුණහ.

මෙයාකාරයේම අපූරු සිද්ධියක් මල්ල රජ දරුවන්ගේ උපවත්තන සල් උයනෙහි අවසාන ධර්ම දේශනයේදීද ඇතිවිය.

මෙලෙසින් සම්බුද්ධෝත්පාදය ඇති වී පරිනිර්වාණය දක්වාම ශාසනය පිරිසිදුව පවතියි. එතැන් පටන් වසර දෙදහස් පන්සියක් ගතවන තුරු සම්බුද්ධ ශාසනය අනුක්‍රමයෙන් අපිරිසිදු වෙයි. ඊට සද්ධර්ම ප්‍රතිරූපක එක් වෙයි. නිවැරදි ධර්මය යට යයි. සද්ධර්මයට වඩා රසවත් වූ වඩා කන්කලු වූ සද්ධර්ම ප්‍රතිරූපකයන් ජනප්‍රිය වෙයි.

සම්බුදු සසුන පන්දහසක් කල් පවතින සැලසුමක් පෙර පටන් පැවතියේය. සම්බුද්ධ ශාසනය හටගෙන වසර දෙදහස් පන්සියක් ඉක්ම ගිය තැන ශාසනයෙන් පැන නැඟි භේදයන් දුරලන දූරදර්ශී වැඩ පිළිවෙළක් සැකසෙයි.

සද්ධර්මය සහ සද්ධර්ම ප්‍රතිරූපක වෙන් කර පෙන්වන සැබෑ සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මිනිසුන්ගේ කන වැකෙයි. පර්යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවේද යන ත්‍රිවිධ අංගයන් සහිතව බුද්ධ ශාසනය නැවත බලවත්ව ඇතිවෙයි.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසු මේ කියන ශාසන ශෝධන කාර්යය භාරව සිටිනුයේ අමිතාභය බුදුන් වහන්සේ සහ සමන්තභද්‍ර මුනිවරයාය. උන්වහන්සේලා දෙදෙනා සමස්ත විශ්වයේ පැරණිතම බෞද්ධ සාමාජිකයෝ වෙති. බුදුදහමේ යාවජීව ආරක්ෂකයෝ වෙති.

මෙයාකාරයෙන් නැවත පිරිසිදු වූ මනාව නැවත පිහිටුවන ලද බුදු සසුනෙහි නැවතත් බොහෝ රහතන් වහන්සේලා පහළ වෙති. රහතන් වහන්සේලා නැවත පහළ වීමෙන් පසු ලංකාද්වීපයෙහි බෞද්ධ රජකෙනෙක් පහළ වී මහා ධර්ම සංගායනාවක් කරයි. එයින් පසු බොහෝ කලක් සමෘධව තිබෙන බුද්ධ ශාසනය නැවතත් පරිහානියට ලක් වෙයි. සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර පන්දහසක් කල් ඉකුත් වූ පසු අවසන් සෝතාපන්නයා මෙලොව හැරයයි. ශාසන අන්තර්ධාන කාලය තීරණය කරනුයේ මේ සසුනෙහි අවසන් සෝතාපන්නයා මෙලොව හැර යාමෙනි.

අවසන් සෝතාපන්නයා මෙලොව හැර ගිය පසු අපූරු සිද්ධියක් ඇති වෙයි. ලොව පුරා විසිරී තිබෙන සර්වඥධාතුන් වහන්සේලාගෙන් දර්ශනීය ආලෝකයක් විහිදෙන්නට පටන් ගනියි. එකල්හි මිනිස්සු ධාතු වන්දනාවට පෙළ ගැසෙති. ඒ සිද්ධිය ධාතු මංගල්‍යය නම් වෙයි. ධාතු මංගල්‍යය අවසානයේ සියලු සර්වඥධාතුන් වහන්සේලා එක්ව තනි බුද්ධ ශරීරයක් මැවෙයි. ඒ බුද්ධ ශරීරය විසින් තවත් බුද්ධ ශරීරයක් මවනු ලැබේ.

දැන් බුද්ධ ශරීර දෙකම එකිනෙකට වෙනස් ප්‍රාතිහාර්ය පාති.

"බුදුවරුන් දෙනමක් පහළ වී ප්‍රාතිහාර්ය පාති" යි අඥාන මිනිස්සු කෑකෝ ගසන්නට පටන් ගනිති. නැණවත්හු බුදුන්වහන්සේගේ ශාසන අන්තර්ධානය එදින සිදුවන බව දැන හඬති. වැළපෙති. පොළවේ හැපෙති. සියලු ප්‍රාතිහාර්ය අවසානයේ බුද්ධ ශරීර දෙකම නැගෙනහිර දෙසට හැරී දැවී අළුවත් ඉතිරි නොවී සුන්ව යයි. මෙය

ශාසන අන්තර්ධානය පිළිබඳ කතා ප්‍රවෘත්තියයි. මෙහි කී ප්‍රාතිහාර්ය සියල්ල බුදුන්වහන්සේගේ අධිෂ්ඨානයේ මහිමය නිසාම සිදුවන්නකි. නොඑසේව කිසිවකු විසින් හසුරුවන සිදුවීම් නොවේ.

සැදැහැවත් බෞද්ධයනි. මෙකල බුද්ධ ශාසනය පසු බැස ගොස් අතුරුදන් වෙන සෙයක් දිස්වුණද ඒ පසුබැස්ම තාවකාලිකය. සියලු බෞද්ධයන් තනි බලවේගයක් ලෙස එක්වන දිනය තෙක් ඒ පසුබැස්ම දිගටම සිදුවනු ඇත. බෞද්ධයන් තනි බලවේගයක් ලෙස එක්වූ දින පටන් මා කියූ අනාවැකි සියල්ල එකිනෙක ඇස් පනාපිටම ඔප්පු වනු ඇත.

එක්වී සැනසෙමුද වෙන්ව සිට වැනසෙමුද යන තීරණය ඉදිරි වසර කිහිපය තුළ තීරණය කරනු මැනවි. ඊට වඩා ප්‍රමාද වුවහොත් ඔබට මියයන්නට සිදුවනුයේ අබෞද්ධයන්ට අයත් රටකදී බව ලියා තබා ගන්න. මේ කියන අනාවැකිය කිසිවකු හටත් බොරු කළ නොහැකිය. යමෙකු ඒ අනාවැකිය බොරු කළොත් මම එදිනට බුදුදහම ගැන ලිවීම නවතමි.

ඔබ සියලු දෙන තනි බලවේගයක් ලෙස එක්වන තුරු අමිතාභය බුදුහු සුඛාවතියෙහි සිට බලා හිඳිති. සමන්තභද්‍ර මුනිවරයා ඈත විශ්වයේ සිට බුදුසසුනේ උන්නතිය ඇතිවන තෙක් කාරුණිකව බලා සිටිති. උන්වහන්සේලාගේ එකම අභිප්‍රාය බුදුසසුන තව බොහෝ කල් රැකදීමයි.

# 10

# නිරය පාලකයාගෙන් අති භයානක අනාවැකියක්

සත්‍යාවබෝධයට පැමිණි එක්තරා සෙන් ගුරුවරයෙක් ජපානයේ වාසය කළේය. හේ විවිධ ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් අනුන්ට ධර්මාවබෝධය ලබාදීම පිළිබඳව ප්‍රසිද්ධියක් ඉසිලීය. දිනක් එක් ගම්වැසියෙක් ඔහු වෙසෙන පන්සල ළඟින් ගමනක් ගියේය. සෙන් ගුරුතුමා එවෙලේ මහහඬින් සිනාසුණේය. දෙවැනි දිනයේ ගම්වැසියා පන්සල ලඟින් යන විට හේ මහහඬින් අඬන්නට විය.

"ඊයේ ඔබතුමා මහහඬින් හිනාවුණා. අද හොටු පෙරාගෙන අඬනවා. මොකක්ද මේකෙ තේරුම?" ගම්වැසියා ඇසීය. මෙන්න මේකයි ඒකෙ තේරුම.

"ඒ මගේ හැටි. මම ඊයෙ හිනාවුණා. ඉතින් ඒ නිසා අද මට අඬන්න වුණා."

මේ ප්‍රකාශය අසා සිටි ගම්වැසියා ලෝකස්වභාවය අවබෝධ කරගෙන සත්‍යාවබෝධය ලැබීය.

තමන්ට එල්ල වන ආපදාවකදී කරන්නට කිසි දෙයක් නැති තැන මිනිස්සු හඬති. වැලපෙති. මා දිගු

කලක් භාවනා කළද බෝසත්වරුන් ගැන බොහෝ කතා ලියූවද බුදුදහමේ අවිනිශ්චිත අනාගතය ගැන සිතන විට ඉකි ගසමින් හඬන්නට මටද සිත්වෙයි.

බුද්ධාගමේ අයිතිකාරයන් යයි කියා ගන්නා පිරිස් විසින් අද වන විට බුදුදහම කැලි කැලිවලට ඉරා දමා ඇත. පෙළක් අය කියන පරිදි බුදුන් උපන්නේ ලංකාවෙහිය. ඉන්දියාවේ ඇති සියලු ස්මාරක ලංකාවේ තිබූ බෞද්ධ ස්මාරකයන්ගේ අනුරූ මිස වෙන යමක් නොවේය. ලුම්බිණි සල් උයන පිහිටියේ ලංකාවේ පන්සලකය. මේ බුදුදහම පිළිබඳව පැන නැඟී ඇති එක් අලුත් මතවාදයකි. ඒ මතවාදය දරන්නන්ට අනුව පුරාවිද්‍යාඥයන්ට භයානක අත්වැරදීම් රාශියක් සිදුවී ඇත එබැවින් පුරාවිද්‍යා ග්‍රන්ථ සියල්ල පුළුස්සා නළලේ අළු ගාගත යුතුය.

මෑත අතීතයේ එක් දිනක බුදුන් ලංකාවේ උපන් බව කියන කෙනෙකු මට හමුවිය. මම ඔහුට සවන් දීමෙන් පසු ප්‍රශ්න පිට ප්‍රශ්න වැලක් ඉදිරිපත් කළෙමි.

"බුදුන් ලංකාවේ උපන්නේ නම් බණ කියන්නට ඇත්තේ සිංහලෙන් නොවේද? එසේනම් සූත්‍ර ධර්ම සියල්ල අපට ආගන්තුක පාළි භාෂාවෙන් ලියැවුණේ ඇයි?"

මේ ප්‍රශ්නයට පිළිතුරු දීම වෙනුවට හේ වැල්වටාරමක් කියාගෙන ගියේය.

"එසේනම් ලංකාවෙන් දඹදිවට බුදුසසුන රැගෙන ගියේ කවුද? ඒ කෙසේද? ඒ කුමන කාලයකදීද?"

මේ ප්‍රශ්නයේදී හේ නිරුත්තර විය. මම ඔහුගෙන් තවත් පැනයක් ඇසීමි.

"බුදුන් ලංකාවේ උපන්නේ නම් ඒ බව මහාවංශ කතුවරයා දැන නොසිටියේ ඇයි."

මේ ප්‍රශ්නයටද විකාර උත්තරයක් දුන් ඔහු හදිසි ගමනක් යාමට ඇති බව පවසා මගෙන් සමුගෙන ගියේය. මා හා වාදයට පැමිණි ඒ පුද්ගලයා අදටද ඒ විශ්වාසයන්ගෙන් බිඳක් හෝ බැහැර වී නැත.

මෙම ආධානග්‍රාහී මානසිකත්වය ඔහුට පමණක් සීමා වූවක් නොවේ. මේ තත්ත්වය 'රිලිජස් ඩොග්ම' යනුවෙන් හැඳින්වෙන තත්ත්වයකි. එම මානසිකත්වයෙන් පෙළෙන කෙනෙකුට කෙතෙක් උපහැරණ දුන්නත් කෙතෙක් තර්කානුකූලව පැහැදිලි කළත් තමන් පැමිණ සිටින මනෝමූලික තීරණවලින් බැහැර විය නොහැකිය.

අන්‍යාගමික අන්තවාදීන් දෙවිවරුන් සතුටු කිරීමට අහිංසකයන් ඝාතනය කරන්නේ 'ආගමික ආධානය' නම් වූ වියරු මානසිකත්වයේ ප්‍රතිඵලයක් ලෙසය. ආගමික ආධානය හීන බුද්ධිඵලයක් ඇති හැඟීම් බර අයට ඇතිවිය හැකි තත්ත්වයකි. ආගමික ආධානයට යටත් තැනැත්තාගේ චින්තන හැකියාව දුර්වලය. ඔහු තම ගුරුවරුන් කුමක් කීවද නොපැකිළ ඒ දේය හරි බව පිළිගනියි. අද මෙරට බුදුදහමේ පසුබැස්මට මූලික හේතුව ආගමික ආධානග්‍රාහිත්වය බව මා කිව්වොත් ඔබ මා හා එකඟ නොවනු ඇත. එනමුත් සත්‍යය ඇත්තේ එතැනය. මෙරට බෞද්ධයන්ගේ බලය හීනවී ගියේ ආධානග්‍රාහී කල්ලි බිහිවීමත් සමඟය.

බුදුදහම තුළ කල්ලිවාදය කෙතෙක් උත්සන්න වී ඇත්ද යන්න එදිනෙදා දකින සිදුවීම්වලින් මනාව ඔප්පු කර පෙන්විය හැකිය. එක් තැනක අමුතු තාලයේ පලතුරු පූජාවකි. ඒ පූජාව අවසානයේ පලතුරු ටික පරවී විසි

කරනු ඇත. එය දායකයෙක් ඇති ප්‍රතිග්‍රාහකයකු නොමැති අසාර්ථක දානමය පුණ්‍යකර්මයක් බව මා කීවොත්? මට එරෙහිව දහසක් දේ ඔවුන් කියනු ඇත. එනමුත් ඒ විකාර පූජා ක්‍රම බුදුන්වහන්සේ විසින්ද ප්‍රතික්ෂේප කර ඇති බව ධර්මානුකූලව න්‍යායානුකූලව පෙන්වා දිය හැකිය.

"මහණෙනි සමහරු නිදන් කිරීම පිණිස දන් දෙති. නිදන් කිරීම පිණිස දන්දීම යනු මට මතු සැපතට මේ දානය හේතු වේවායන අරමුණින් යුතුව දන්දීමයි. එබඳු දන්දීමෙහි විපාක හීනය. එබඳු දානයක විපාක චාතුර්මහාරාජිකය ඉක්මවා නොයයි. එබඳු දාන දුන් තැනැත්තා දානයේ උපරිම ඵලය ලෙස මතු අත්බැව්හි චාතුර්මහාරාජිකයේ උපත ලැබිය හැකිය.

යමෙකු මෙයාකාර ප්‍රාර්ථනාවක් සහිතව දානය දේ නම් - මේ දානය මාගේ මසුරු මල දුරු කිරීම පිණිස හේතුවේවා යන ප්‍රාර්ථනයෙන් දන් දේ නම්? එහි විපාක බොහෝය. එබඳු දානයේ විපාක ලෙස බ්‍රහ්ම තලයන් දක්වාම උත්පත්තිය ලද හැකිය."

දක්ෂිණාවිභංග සූත්‍රය ඇතුළු තැන් ගණනාවකම දානයේ ආනිසංස ගැන බොහෝ විස්තර ඇතුළත්ය. දානයේ විපාක වැඩිවන්නේ දායකයා විෂයෙන් සහ ප්‍රතිග්‍රාහකයා විෂයෙන් එය උසස් වූ විටය. ගස් ගල් වැනි අජීවී වස්තූන් වෙත පූජාවන් තැබීම 'බලි' යනුවෙන් ධර්මයෙහි සඳහන් වෙයි. ප්‍රතිග්‍රාහකයන් නොමැති තැන්හි ආහාර පූජා කිරීම දානයකට සමාන කර සැලකිය නොහැකිය. අපගේ බෞද්ධයන් මෙතරම් අදූරදර්ශී මාවතකට පිවිසීම සද්ධර්ම අන්තර්දානය පාර කැපීමකි.

මා කලිනුත් මතක් කළ පරිදි බෞද්ධයාගේ පරම යුතුකම වශයෙන් සෝතාපන්න ඵලයට පැමිණීමයි.

මෙකල්හි මාර්ගඵල ලැබීමට නොහැකිය යන මතවාදය නැවතත් හිස ඔසවන බව විද්‍යුත් මාධ්‍ය දෙස විමසිල්ලෙන් බලන කල පෙනී යයි. එබඳු ප්‍රකාශයන් ධර්මයේ අකාලික බවට එරෙහිව කරන අභියෝගයන් බඳුය. යම් කලෙක සද්ධර්මය විද්‍යමාන වේද එකල මාර්ගඵල ලැබීමට උත්සාහ දරන්නන් සිටීද කිසි කලෙක මේ සසුන මාර්ගඵල ලාභීන්ගෙන් හිස් නොවේය යන්න සූත්‍ර පිටකයේ ස්ථිරවම සඳහන් කර ඇත. සූත්‍ර පිටකයේද අභිධර්ම පිටකයට අයත් පුද්ගල පඤ්ඤත්තිප්පකරණයේද සෝවාන් මාර්ගය වඩන අය ගැන කදිම තොරතුරක් ඇතුළත් වෙයි.

සෝවාන් වීමට උත්සාහ දරන තැනැත්තා සෝවාන් මාර්ගයේ සිටින්නෙකි. ඔහු ආර්යයෙකි. අෂ්ඨපුද්ගල ආර්යයන්ට ඔහුද අයත් වෙයි. එබඳු තැනැත්තන් සෝවාන් මාර්ගලාභීන් ලෙසද නම් කරනු ලැබේ. සෝවාන් මාර්ගලාභියකු සිය උත්සාහය අත් නොහැරියහොත් ඔහු මරණින් මෙපිට කෙසේ හෝ සෝවාන්ඵලයට පත්වන්නේය යන කරුණ කිසිවකුටවත් වෙනස් කළ නොහැකි ධර්මතාවයකි. මෙසේ කියන්නේ මා නොවේ. බුදුන්වහන්සේ සහ සැරියුත් මහරහතන් වහන්සේ විසිනි. ඒ ප්‍රකාශය ත්‍රිපිටකයේ දෙවරක්ම සඳහන්ව තිබීමෙන් එහි වටිනාකම මනාව පැහැදිලි වෙයි.

සෝවාන් මාර්ගයේ සිටින කෙනා තවත් අපූරු දක්ෂතාවක් ඇති අයෙකි. ඔහු සෝවාන් ඵලයට පැමිණෙන තෙක් කිසිවකුට ඔහුගේ ජීවිතය තොර කළ නොහැකිය. සෝවාන් ඵලයට පැමිණෙන තෙක් ස්වභාවික ආපදාවකින් හෝ ඔහු මිය නොයයි. මෙය රහතන් වහන්සේ කෙනෙකුටවත් නොමැති වරප්‍රසාදයකි. මේ පිළිබඳ කදිම උදාහරණයක් ත්‍රිපිටක

ධර්මය තුළ ඇතුළත්ය. යම් හෙයකින් කල්ප විනාශය එළඹ තිබියදී යමෙක් සෝවාන් මාර්ගය වඩයිද ඔහු මාර්ගඵලයට පැමිණෙන තෙක් කල්ප විනාශය නවතියි. කල්ප විනාශය නැවතීමේ ශක්තියක් බුදුවරයකුටවත් නොමැති බව පැහැදිලිය. බුදුවරයකුටවත් නොමැති එම ශක්තිය සෝවාන් මාර්ගලාභියාට ඇති බව කීමෙන් සිතට ඇතිවන ධෛර්යය කෙබඳුද යන්න ඔබම සලකා බලනු මැනවි.

අවාසනාවකට මෙබඳු පිරිසිදු ධර්ම කරුණු අද නොඇසෙයි. රටාවකට ලතාවකට කියන ඒකාකාරී බණ මිසක නිවනට මඟ පෙන්වන ශුද්ධ වූ ඉගැන්වීම් නොඇසෙයි. කාලීන බණ දිනෙන් දින ජනප්‍රිය වන අතර නෛර්යානික සද්ධර්මය දිනෙන් දින යටපත් කර දමනු ලැබෙයි. කන හැටි අඳින හැටි රූපවාහිනිය නරඹන හැටි අපට උගන්වන්නට අද වෙන වෙනම බණ කියැවෙයි. මට වැටහෙන පරිදි කන හැටි බොන හැටි නාන හැටි ඉගැන්වීම බෞද්ධ යතිවරුන්ගේ වගකීම නොවේ. ඔවුන්ට පැවරී ඇති පරම යුතුකම නිවනට යන පාර හෙළි පෙහෙළි කර දීමයි.

මාර්ගඵල පිළිබඳ වැඩිම ඉගැන්වීම් ප්‍රමාණයක් මා වෙත හෙළිකර දුන් වජ්‍රසත්ව මුනිවරයා ගැන මසිතෙහි ඇත්තේ කිව නොහැකි තරම් ගෞරවයකි. වජ්‍රසත්වයන් මා හමු නොවන්නට බොහෝ ධර්ම කරුණු තවදුරටත් අභිරහස් ලෙසම පවතිනු ඇත. සෝවාන් ආදී මාර්ගඵල සතර වෙත පැමිණීමට භාවනාව උපකාරී වෙයි. එනමුත් භාවනාව නිවනට ඒකායන මඟ නොවේ. කලාතුරකින් කෙනෙක් භාවනා නොකර බණ ඇසීමෙන් නිවන් දකියි. එනමුත් අති බහුතරය නිවන් දැක්මට භාවනා කළ යුතුය.

නීවරණ ධර්ම මැඩපැවැත්වීම සමථ භාවනාවේ ප්‍රධාන කාරියයි. සත්‍යාවබෝධයට ඔසවා තැබීම විදර්ශනා භාවනාවේ කාරියයි. වජ්‍රසත්වයෝ භාවනාව ගැන මෙලෙස කියති.

"බොහෝ දෙනෙක් තමන්ට කැමති පරිදි කර්මස්ථාන තෝරාගෙන භාවනා කරති. එවන් භාවනාවෙන් උසස් ප්‍රතිඵල නොලැබෙයි. ඒ ඒ කෙනාට ගැළපෙන පුද්ගලබද්ධ කර්මස්ථානයන් ඇත. යමකු පෙර සසරෙහි පුරුදු පුහුණු කරන කර්මස්ථානය තෝරා ගන්නා තෙක් භාවනාව පහසුවෙන් නොවැඩෙයි. යමකු පෙර සසරෙහි පුරුදු කළ භාවනාව යළි තෝරාගතහොත් ඔහුගේ සමාධිය ඉතා හොඳින් ඉතා පහසුවෙන් වැඩෙයි. පෙර සසරෙහි පුරුදු පුහුණු කරන ලද භාවනාවට ගෝචර කර්මස්ථානය යන නම යෙදෙයි."

මම මේ අපූරු ඉගැන්වීම භාවනා පොත් කිහිපයකටම ඇතුළත් කළෙමි. බොහෝ දෙනෙක් ඒ අනුව යමින් උසස් ප්‍රතිඵල ලදහ. ගෝචර කර්මස්ථානය හෝ පෙර සසරෙහි පුරුදු කළ භාවනාව සොයා ගන්නේ කෙසේද? එය දැන් මා විසින් ඔබට විස්තර කළ යුතු වෙයි.

පෙර සසරෙහි පුරුදු පුහුණු කළ භාවනාවට අදාළ නිමිති අප සිත්හි පහසුවෙන් හට ගනී. අප කළ යුත්තේ සරල දෙයකි. කිසිවක් නොසිතා කිසිවක් නොවිමසා දුර බලා සිටීමයි. මෙලෙස සිටින කල්හි දෑස් ක්‍රමයෙන් බරවෙයි. බාගවිට සිත එහෙ මෙහෙ දුවයයි. දැන් නැවත නැවතත් සිතුවිලිවලින් හිත හිස් කරන්න. මෙකල්හි අනුක්‍රමයෙන් කය නොසෙල්වෙන තත්ත්වයක් ඇතිවෙයි. දෙපාවල ඇඟිලිවල සිට ඉහළට සෙලවිය

නොහැකි තත්ත්වයක් උදාවෙයි. හිසද සෙලවීමට නොහැකි තත්ත්වයට පත්වූ පසු දෑස් පියා ගන්න. එකල්හි සිතට සනාන්ධකාර තත්ත්වයක් දැනෙනු ඇත. ඒ සනාන්ධකාරය දෙස බලා සිටින්න. අනුක්‍රමයෙන් ආලෝකයක් පෙනෙනු ඇත. ඒ ආලෝකය මත සිත සමාධිගත කිරීමෙන් පහසුවෙන් ධ්‍යාන ඉපිදවිය හැකිය. මෙවැනි අපූරු භාවනා කර්මස්ථාන රැසක් වජ්‍රසත්වයන්ගේ ඉගැන්වීම් අතර වෙයි.

අපි ඒ ගැන පසුවට කතා කරමු. මා කලිනුත් මතක් කළ පරිදි වජ්‍රසත්වයෝ පිට පිට දින තුනක්ම මා ඇසුරු කරමින් විශාල ධර්ම දානයක් සිදු කළහ. හේ ටක්කෙටම හරියන අනාවැකි කීය. ඒවා කෙතෙක් නිවැරදිද යන්න මටම අදහා ගත නොහැකි විය. මා සතු ධර්ම දැනීම නිතර වර්ණනා කරන ගෝලයකු මට විය. හේ ශීඝ්‍රයෙන් සියලු දේ ධාරණය කර ගත්තේය. කෙටි කලෙකින්ම බෝසත්වරුන් හා සන්නිවේදනය කරන හැටි උගත්තේය.

"ඔබේ ඒ ගෝලයා ගැන විශ්වාසය නොතබන්න. ඔහු මේ වන විටත් තව කිහිප දෙනෙකු සමඟ එක්ව ඔබව විවේචනය කරයි. ඔහු මිත්‍රභේදයේ යෙදී සිටියි. මිත්‍රභේදය යනු බරපතළ අකුසල කර්මයකි. ඔහු මෙඅත්බැව්හිම මිත්‍රභේදයේ විපාක ලැබ ගන්නේය. ලබන වර්ෂයේ අප්‍රේල් මස අවසානයේ ඔබේ මිත්‍රයා නොසිතූ විරූ ලෙස සිය නිවස හැර යනු ඇත. ඔහුට හිමි වන්නේ ඇඳිවත පමණි."

මම මේ අනාවැකිය පස්දෙනෙකුට කියා තැබීමි. එකී පුද්ගලයාට කිසිවක් නොකීමි. විස්මයකි. 2013 වර්ෂයේ අප්‍රේල් මාසය අවසානයේ ඔහු ඇඳිවත පමණක් හිමිව නිවසෙන් පැන ගියේය. අදටද ඔහු වෙසෙන තැන හරිහැටි කීමමම පවුලේ අයවත් නොදනිති.

බුදුන්වහන්සේ දෙව්ලොව වැඩම කර සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය දේශනා කළ බව මම නිතර නිතර සඳහන් කළෙමි. මා පෙර කී පුද්ගලයා සද්ධර්ම පුණ්ඩරීකය බෝසත්වරුන්ගෙන් අසා දැනගත් කාලයේ මට බොහෝ උපකාර කළේය. මම මුලින්ම සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රයේ කොටස් බෝසත්වරුන්ගෙන් අසා දැනගතිමි. මා පෙර කියූ පුද්ගලයා ඒ කියූ දෙය එලෙසට අසා දැනගෙන කරුණු තහවුරු කළේය. සද්ධර්ම පුණ්ඩරීකයේ ඇතුළත් ධර්ම කරුණු මේ යයි නිවැරැදිව කීමේ හැකියාව මට ලැබුණේ එලෙසිනි.

බුදුන්වහන්සේ දෙව්ලොවට මුල් වතාවට වැඩම කළ දිනයේ නිරයට අධිපති වෙසමුනි රජුද එතැනට පැමිණ සිටියේය. වෙසමුනි රජුට දිව්‍ය සභාවේ එක් කොනක විශේෂ අසුනක් හිමිවෙයි. හේ දොහොත් මුදුන් දී බුදුන් වැඳ සද්ධර්ම පුණ්ඩරීකය අසා සිටියේය. තමන්වහන්සේ විසින් මනුෂ්‍ය ලෝකයට ගොස් සද්ධර්ම පුණ්ඩරීකය ප්‍රසිද්ධ නොකරන බවත් ආනන්ද මහා කාශ්‍යප සැරියුත් හා මුගලන් යන මහා ශ්‍රාවකයන් වහන්සේලාට පමණක් එය ඇසීමට සලස්වන බවත් බුදුන්වහන්සේ දෙව්ලොවදී දේශනා කළහ.

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙදහස් පන්සිය වසක් ඉක්ම ගිය කල්හි මාරයන්ගේ බලපෑම මත සද්ධර්මය අන්තර්දාන වීමට කටයුතු සිදුවන බවත් එකල්හි සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය ප්‍රසිද්ධ වීමට කටයුතු සලසන බවත් බුදුන්වහන්සේ දේව සභාවට පැහැදිලි කළහ.

මිනිසුන්ට සැබෑ සද්ධර්ම පුණ්ඩරීකය දෙසන කල්හි සමහරු ඊට අපහාස කරන බවත් ඔවුන් මෙලොවදී අන්තරායන්ට ලක්ව මරණින් මතු නිරයෙහි උපත ලබන බවත් බුදුන්වහන්සේ දේශනා කළහ.

වෙසමුනි රජු තද කේන්තිකාරයෙකි. හේ නිරයේ පාලකයා වෙයි. හේ ධර්ම දේශනාව අසා සිටින අතරම නැඟී සිටියේය. "සද්ධර්මයට අපහාස කළ යමකු මා වෙත පමුණුවන්නේ නම් පළමුව ඔහුගේ හෝ ඇයගේ දිව කපන්නට නියම කරමි. ඉන්පසු වධයට යොමු කරමි."

යනුවෙන් මොරදුන් වෙසමුනි රජු නැවත සන්සුන්ව බණ අසන්නට විය. හේ ධර්ම දේශනාව අවසානයේ දොහොත් මුදුන් දී බුදුන් වැඳ සිය අතවැසියකු සමඟ විසාණා නුවර බලා ගමනාරම්භ කළේය.

"එම්බා කොලුව, මම සද්ධර්මයෙහි අතිශය පැහැදී සිටින්නෙමි. යමකු සද්ධර්මයට ගරහන්නේ නම් ඔහු අනිවාර්යයෙන්ම මරණින් මතු නිරයෙහි උපදියි. එය ලෝක ධර්මතාවයකි. එලෙස සද්ධර්මයට ගර්හා කර මා වෙත පැමිණෙනවුන්ගේ දිව කපන බව මම කීමි. බුදුන්වහන්සේ එය නිශ්ශබ්දතාවයෙන් ඉවසා සිටි සේක. බුදුවරුන්ගේ නිශ්ශබ්දතාව යනු අනුමැතිය පළ කිරීමයි. එහෙයින් මම ධර්මයට නිග්‍රහ කරන්නවුන් මා වෙත පැමිණි විට කිසිත් නොවිමසාම පළමුව දිව කපන්නට නියම කරමි. ඉන්පසු වධ බන්ධනයට ලක් කරමි."

සත්තකින්ම සිදුවූයේ අනෙකකි. ධර්මයට නිග්‍රහ කරන්නන්ට දඬුවම් දීමේ කිසිදු අවශ්‍යතාවක් බුදුන් වහන්සේට නොවීය. එහෙත් බුදුන් වහන්සේ වෙසමුනි රජුගේ කීම ගණනට නොගෙන බණ කීහ. කෙසේ නමුත් අද වන විට නිරයෙහි දිව කැපීමේ නීතිය එලෙසම ක්‍රියාත්මක වෙයි. බුදුන් වහන්සේට හෝ ධර්මයට හෝ ආර්ය සංඝරත්නයට අපහාස කරන පිරිස් මරණින් මතු නොවැරදීම නිරයෙහි උපදිති. නිරය පාලකයෝ වෙසමුනි රජුගේ අණපිට පළමුව ඔවුන්ගේ දිව කපති. දිව කපන

ලද පව්කාරයෝ එතැනින් පසු අපායේ විනිශ්චයට යොමු කරති. යම රජු විනිශ්චාසනයේ සිට ප්‍රශ්න පහක් අසන අතර ඒ ප්‍රශ්නවලට ලැබෙන පිළිතුර මත නිරයේ උපන් තැනැත්තාගේ අනාගතය තීරණය වෙයි.

දිව කපන ලද අයකු කෙසේ නම් ප්‍රශ්නවලට උත්තර දෙන්නද? ඔවුහු යමරජුගේ ප්‍රශ්නවලට පිළිතුරු නොදී ලේ කඳුළු වගුරුවමින් හිස දෙපසට සලති. ප්‍රශ්නවලට පිළිතුරු නැති තැන යම රජු ඔවුන්ව වධයට යොමු කිරීමට අණ කරති.

සද්ධර්මයට අපහාස කළ අයට මරණින් මතු සමාවක් නැත්තේමය. එබැවින් යමකු සද්ධර්මයට අපහාස කරයිද ඒ තැනැත්තාම තමන්ගේ විනාශය උදාකරගන්නා බව නිශ්චිතව කිව හැකිය. සද්ධර්මය නමින් අසද්ධර්මය ප්‍රචාරය කරන තැනැත්තා තමනුත් විපතට හෙළා අනුනුත් විපතට හෙළන බව සියයට සියයක් නිවැරදිව ප්‍රකාශ කළ හැක්කේය.